**විගණකාධිපති දෙපාර්තමේන්තුව**

**2009 වර්ෂයේ සිට 2016 ජූනි දක්වා නොරොච්චෝලේ ලක්විජය බලාගාරය සඳහා සීමාසහිත ලංකා ගල් අඟුරු සමාගම මගින් සිදු කරන ලද ගල් අඟුරු ප්‍රසම්පාදන සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කමිටුවේ ඉල්ලීම පරිදි විගණකාධිපති විසින් ඉදිරිපත් කරනු ලබන විශේෂ විගණන වාර්තාව**

**2009 වර්ෂයේ සිට 2016 ජූනි දක්වා නොරොච්චෝලේ ලක්විජය බලාගාරය සඳහා සීමාසහිත ලංකා ගල් අඟුරු සමාගම මගින් සිදු කරන ලද ගල් අඟුරු ප්‍රසම්පාදන සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කමිටුවේ ඉල්ලීම පරිදි විගණකාධිපති විසින් ඉදිරිපත් කරනු ලබන විශේෂ විගණන වාර්තාව**

පටුන


1. උක්ත වාර්තාව නිකුත් කිරීමේ පසුබිම ....................5
1.2 විෂය පථය ....................5
1.3 අනුකූලතා පරීක්ෂාව ....................5
2. වාර්තාව පිළියෙල කිරීමේ ක්‍රමවේදය ....................6
3. විෂය පථය සීමා වීම ....................8
4. ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ විශේෂඥ සේවය ලබාගැනීම ....................9
5. ලංකා ගල් අඟුරු සමාගම පිහිටුවීම ....................9
5.1 සමාගමේ ප්‍රාග්ධන සංයුතිය ....................9
5.2 සමාගමේ අරමුණු ....................10
5.3 කාර්ය මණ්ඩලය ....................11
5.4 ලංකා ගල් අඟුරු සමාගමේ මෙහෙයුම් තත්ත්වය ....................11
5.5 ලංකා ගල් අඟුරු සමාගමේ වියදම් ලංකා විදුලිබල මණ්ඩලය විසින් ප්‍රතිපූර්ණය කිරීම ....................12
6. ලක්විජය ගල් අඟුරු බලාගාරයේ ගල් අඟුරු අවශ්‍යතාවය, ප්‍රවාහනය, ගොඩබෑම සහ ගබඩා කිරීම ....................12
7. ගල් අඟුරු මිලදී ගැනීමේදී/ලබා ගැනීමේදී අනුගමනය කර තිබූ ක්‍රමවේදයන් ....................14
7.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර මිලදී ගැනීම් ....................14
7.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර මිලදී ගැනීම්/ ලබාගැනීම් ....................15
7.3 ගල් අඟුරු වල ගැණුම් මිල තීරණය කිරීම ....................16
8 දීර්සකාලීන සැපයුම් ප්‍රසම්පාදන ....................17
9 ක්ෂණික සැපයුම් ප්‍රසම්පාදනය ....................18
10 ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව මිලදීගත්/ ලබාගත් අවස්ථා ....................19
11 ලංකා ගල් අඟුරු සමාගම විසින් මිලදීගත් ගල් අඟුරු ප්‍රමාණයන් හා දිනයන් ....................20
12 දීර්ඝ කාලීන ප්‍රසම්පාදන ....................21
12.1 පළමුවන ප්‍රසම්පාදනය - 2009 ....................21
12.2 දෙවන ප්‍රසම්පාදනය - 2009 ....................24
12.3 තෙවන ප්‍රසම්පාදනය - 2011 ....................28
12.4 සිවුවන ප්‍රසම්පාදනය 2012/ 2013 ....................32
12.5 පස්වන ප්‍රසම්පාදනය 2014 ....................36
12.6 හයවන ප්‍රසම්පාදනය 2014/2015 ....................41
13 ක්ෂණික ප්‍රසම්පාදන ....................59
13.1 ක්ෂණික ප්‍රසම්පාදනය අංක 01 ....................59
13.2 ක්ෂනික ප්‍රසම්පාදනය අංක 02 ....................62
13.3 ක්ෂනික ප්‍රසම්පාදනය අංක 03 ....................63

13.4 ක්ෂණික ප්‍රසම්පාදනය අංක 04 ............ 64
13.5 ක්ෂණික ප්‍රසම්පාදනය අංක 05 ............ 65
14 ගල් අඟුරු මිලදී ගැනීම්/ලබා ගැනීම ............ 66
14.1 Noble Resources සමාගමින් මිලදී ගැනීම් ............ 67
14.2 ලංකා නැව් සංස්ථාව මගින් මිලදී ගැනීම්/සැපයීම ............ 69
14.3 16 සහ 17 වන නැව් වාර මගින් මිලදී ගන්නා ලද ගොඩබෑමට නොහැකි වූ ගල් අඟුරු 18 වන නැව් වාරයෙන් නැවත සැපයීම ............ 71
14.4 Liberty Commodities සමාගම මගින් මිලදී ගැනීම් ............ 72
14.5 Swiss Singapore සමාගම මගින් මිලදී ගැනීම් ............ 72
14.6 Adani Globle සමාගම මගින් මිලදී ගැනීම් ............ 72
15 ගල් අඟුරු ප්‍රවාහනය ............ 72
16. ගල් අඟුරු ගබඩා කිරීම සහ අළු අපහරණය ............ 73
17 නිෂ්කාර්ය වත්කම් ............ 73
18. විගණන නිරීක්ෂණ ............ 74
18.1 ලංකා ගල් අඟුරු සමාගම පිහිටුවීම සහ එහි ක්‍රියාකාරීත්වය ............ 74
18.2 ලංසු කැඳවීමේ ක්‍රියාවලියේ අඩුපාඩු ............ 74
18.3 ලංසු ඇගයීමේ ක්‍රියාවලියේ අඩුපාඩු ............ 76
18.4 අමාත්‍ය මණ්ඩල තීරණයන්ට අනුකූලව කටයුතු නොකිරීම / අනුමැතියකින් තොරව කටයුතු කිරීම. .. 78
18.5 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයට අනුකූල නොවීම ............ 79
18.6 ගනුදෙනුවල ආර්ථිකමයබව, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ............ 82
18.7 තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුවවල ක්‍රියාකාරිත්වය ............ 85
18.8 බලාගාරය අඩු ධාරිතාවයෙන් ක්‍රියා කිරීම ............ 85
18.9 පාරසරික බලපෑම් ............ 85
18.10 ගල් අඟුරු ප්‍රවාහනය ............ 85
18.11 ගල් අඟුරු ගබඩා කිරීම ............ 86
18.12 නිෂ්කාර්ය වත්කම් සම්බන්ධයෙන් අණාවරණය වූ නිරීක්ෂන ............ 86
18.13 ලංකා ගල් අඟුරු සමාගම සම්බන්ධ නිරීක්ෂණ ............ 86
19 නිර්දේශ ............ 88
20. නිගමන ............ 91

## 1. උක්ත වාර්තාව නිකුත් කිරීමේ පසුබිම

2016 ජූලි 20 දින පැවති පාර්ලිමේන්තු බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කමිටු සාකච්ඡාවේදී 2009 වර්ෂයේ සිට 2016 ජූනි මාසය දක්වා කාලයතුල සීමාසහිත ලංකා ගල් අඟුරු සමාගම(Lanka Coal Company (Pvt) Limited) විසින් ලංකා විදුලි බල මණ්ඩලයේ (Ceylon Electricity Board ) නොරොච්චෝලේ ලක් විජය බලාගාරයට අවශ්‍ය ගල් අඟුරු ප්‍රසම්පාදන සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස විගණකාධිපති වෙත කරන ලද ඉල්ලීම (ඇමුණුම 1) පරිදි මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ.

## 1.2 විෂය පථය

ඉහත සඳහන් ඉල්ලීම පරිදි, දිගුකාලීන ප්‍රසම්පාදන (Term Contract) හයකට, ක්ෂණික ප්‍රසම්පාන (Spot Cotract) පහකට සහ සීමාසයිත ලංකා නැව් සංස්ථාව (Ceylon Sipping Corporation Ltd.) වෙතින් මිලදී ගත් / ලබාගත් ගල් අඟුරු වලට අදාල කරුණු පරීක්ෂා කරන ලදි. (මෙම ප්‍රසම්පාදන ක්‍රම දෙකෙහි හැඳින්වීමක් 7.1 ඡේදයෙහි දක්වා ඇත.)

## 1.3 අනුකූලතා පරීක්ෂාව

මෙම ගනුදෙනුවල අනුකූලතා පිළිබඳ පරීක්ෂාවේදී පදනම් ලේඛනයක් ලෙස රාජ්‍ය ප්‍රසම්පාදන සම්බන්ධයෙන් ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනය විසින් 2006 ජනවාරි 25 දින ජා.ප්‍ර.නි.චක්‍රලේඛන අංක 08 වශයෙන් නිකුත්කර ඇති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 සහ එයට අදාලව මේ දක්වා නිකුත්කර ඇති සංශෝධනයන් අදාලකර ගන්නා ලදී.

(අමාත්‍ය මණ්ඩලය විසින්ද රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් ගල් අඟුරු මිලදී ගැනීමට කටයුතු කරනලෙස 2014 සැප්තැම්බර් 04 දින විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයාට උපදෙස් දී තිබුණි (ඇමුණුම 2).

## 2. වාර්තාව පිළියෙල කිරීමේ ක්‍රමවේදය

මෙම වාර්තාව පිළියෙල කිරීමේදී පහත දැක්වෙන ක්‍රමවේදයන් අනුගමනය කරන ලදි.

### 2.1 ලේඛන පරීක්ෂා කිරීම

පහත 3 ඡේදයේ දැක්වෙන කරුණු වලට යටත්ව, මතු දැක්වෙන ලේඛන පරීක්ෂාවට භාජනය කරන ලදී.

(අ) ලංකා ගල් අඟුරු සමාගම පිහිටුවීමට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය (ඇමුණුම 3), අමාත්‍ය මණ්ඩල තීරණය (ඇමුණුම 4), 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලංකා ගල් අඟුරු සමාගම ලියාපදිංචි කිරීමට අදාළ සංස්ථාගතකිරීමේ සහතිකය (ඇමුණුම 5), සාංගමික සංස්ථාවලිය (ඇමුණුම 6) සහ කොටස් සහතික (ඇමුණුම 7 )

(ආ) දිගුකාලීන පදනම යටතේ ගල් අඟුරු ප්‍රසම්පාදනය සඳහා වූ පළමු ලංසු කැඳවීමේ සිට හයවන ලංසු කැඳවීම දක්වා සහ ක්ෂණික මිලදී ගැනීම් පදනම යටතේ ගල් අඟුරු ප්‍රසම්පාදනය සඳහා වූ පළමු ලංසු කැඳවීමේ සිට පස්වන ලංසු කැඳවීම දක්වා වූ ප්‍රසම්පාදනයට අදාලව;

- ලංකා විදුලිබල මණ්ඩලය විසින් ප්‍රසම්පාදන කටයුතු සිදුකරන ලෙසට කරන ලද ඉල්ලීම්
- විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය (එවකට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය) ලංකා ගල් අඟුරු සමාගම සමඟ හුවමාරු කරගත් ලිපි ලේඛන
- සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාල ලිපිලේඛන
- ලංසු ලියකියවිලි
- ලංසු බැඳුම්කර
- කාර්යසාධන බැඳුම්කර
- තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීම්වලට අදාල පත්කිරීම් ලිපි
- තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා
- අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු පත්කිරීම්වලට අදාල පත්කිරීම් ලිපි
- අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු වාර්තා
- ණයවර ලිපි
- නැව්භාර පත්

- නැව්ගත කිරීමේදී සැපයුම්කරුගේ සහ ගැණුම්කරුගේ නියෝජිතයින් ඒකාබද්ධව පිළියෙල කර ඉදිරිපත් කරනු ලබන ගල් අඟුරුවල තත්ත්ව පරීක්ෂණ වාර්තා
- අමාත්‍ය මණ්ඩල සංදේශ
- අමාත්‍ය මණ්ඩල අනුමැතීන්
- අදාල පුවත්පත් වාර්තා
- වෙනත් විවිධ ලේඛන

(ඇ) ලංකා ගල් අඟුරු සමාගම සැපයුම්කරුවන් සමඟ අත්සන් කරන ලද ගිවිසුම්

(ඈ) ලංකා ගල් අඟුරු සමාගම සහ ලංකා නැව් සංස්ථාව ගල් අඟුරු මිලදී ගැනීම සම්බන්ධයෙන් හුවමාරු කරගත් ලියකියවිලි

(ඉ) ලංකා ගල් අඟුරු සමාගම ලංකා නැව් සංස්ථාව සමඟ ගල් අඟුරු ප්‍රවාහනය සඳහා අත්සන් කරන ලද ගිවිසුම්

(ඊ) ගල් අඟුරු සැපයීමට අදාලව ලංකා ගල් අඟුරු සමාගම ලංකා විදුලිබල මණ්ඩලය සමඟ අත්සන් කරන ලද ගිවිසුම්

(උ) නොබෙල් රිසෝර්සස් සමාගම (Noble Resources Pte. Ltd.) විසින් 6 වන දිගුකාලීන ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකරන ලද නඩුකරය සම්බන්ධයෙන් ප්‍රකාශයට පත්කරන ලද 2016 ජුනි 24 දිනැති නඩු තීන්දුව (ඇමුණුම 8 )

(ඌ) ලංකා ගල් අඟුරු සමාගම ලිබර්ටි කොමඩිටීස් (Liberty Commodities Ltd. ) සමාගමට එරෙහිව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර බළාත්බද මහාධිකරණයේ ගොනුකරන ලද පැමිණිල්ලට අදාල 2016 ජුලි 15 දිනැති නඩු තීන්දුව (ඇමුණුම 9 )

(එ) උක්ත ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් සැපයුම් කරුවන් විසින් ඉදිරිපත් කරන ලද අභියාචනා සහ එම අභියාචනා සම්බන්ධයෙන් අභියාචන මණ්ඩල විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද වාර්තා

(ඒ) ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය විසින් ආසන්නතම ටෙන්ඩරය පිළිබඳව ඉදිරිපත් කරනලද වාර්තාවේ ඉස්මතු කර ඇති අඩුපාඩු සම්බන්ධයෙන් සහ 2009 සිට අනෙකුත් ටෙන්ඩර් සම්බන්ධයෙන්ද පරීක්ෂා කිරීම සඳහා 2015 සැප්තැම්බර් 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මත ලලිත් ආර්. ද සිල්වා මහතාගේ සභාපතීත්වයෙන් යුතුව 2015 ඔක්තෝබර් 07 දින ජනාධිපති ලේකම් විසින් පත්කරන ලද ත්‍රිපුද්ගල කමිටු වාර්තාව (ඇමුණුම 9 A)

(ඔ) 2016 ජූලි 12 දින විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් "2015, 2016 කාල සීමාව සඳහා නොරොච්චෝල, ලක් විජය බලාගාරය සඳහා ගල් අඟුරු මිලදීගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව අධ්‍යානයක් සිදු කිරීම" සඳහා පත්කරන ලද ත්‍රි පුද්ගල කමිටුවේ 2016.07.29 දිනැති වාර්තාව (ඇමුණුම 9 B)

(ඕ) විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් 2016 ජූලි 20 දින පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබූ ප්‍රකාශය (ඇමුණුම 9 C)

## 2.2 වෙනත් පරීක්ෂාවන්

(අ) උක්ත ක්‍රියාවලියට අදාලව විවිධාකාරයෙන් ලද තොරතුරු විශ්ලේෂණාත්මක විග්‍රහයකට ලක්කිරීම

(ආ) අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා කිරීම

(ඇ) ස්ථානීය පරීක්ෂාව - නොරොච්චෝලේ ලක්විජය බලාගාරය

## 3. විෂය පථය සීමා වීම

මෙම වාර්තාවෙන් ඉස්මතු කර ඇති නිරීක්ෂණයන් මගින් නිගමනයන්ට එළඹීමේදී මාගේ විෂයපථය මතු දැක්වෙන සීමා වලට යටත්ව තිබූ බව අවධාරණය කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේ සිට සිදුවූ මෙම විෂය ගත ක්‍රියාවලිය සහ ඒ පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීමේ කාර්යය විගණකාධිපති වෙත පැවරුණු දිනය අතර වර්ෂ 8 කාල පරතරයක් තිබීම.

(ආ) ගල් අඟුරු භෞතික තොග සත්‍යාපනයට සහභාගීවීමට නොහැකිවීම.

(ඇ) දිගුකාලීන පදනම යටතේ 3 වන, 4 වන සහ 5 වන ප්‍රසම්පාදනයන්ට අදාලව විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමත්‍යාංශය පවත්වාගෙන ගොස් තිබුණු ලිපිගොනුවල මුල් ලියකියවිලි විගණනයට ඉදිරිපත් නොකිරීම (විමර්ෂණ කටයුතු සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාවට එම ලියවිලි භාරදීම හේතුවෙන් එම මුල් ලියවිලි වල කොටසක ඡායා පිටපත් පමණක් විගණනයට ඉදිරිපත්කර තිබුණි) (ඇමුණුම 10)

(ඈ) ප්‍රසම්පාදනයන්ට අදාල විගණනයේදී පරීක්ෂා කළයුතුව තිබුණු ඇතැම් ලියකියවිලි විගණනයට ඉදිරිපත් නොකිරීම (ඇමුණුම 10)

## 4. ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ විශේෂඥ සේවය ලබාගැනීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (4) (ආ) ප්‍රකාරව විගණකාධිපතිවරයාට විගණනයට අදාල යම්කිසි තාක්ෂණික, වෘත්තීය හෝ විද්‍යාත්මක ගැටලුවක් පරීක්ෂා කිරීමේදී විශේෂඥ තැනැත්තෙකුගේ සහාය ලබාගත හැකිවේ. ඒ අනුව මෙම විගණන කාර්ය සඳහා රජයේ විශාල ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ අත්දැකීම් සහ විශේෂඥ දැනුම සහිත ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ 1 පන්තියේ තනතුරක සේවය කර විශ්‍රාම ලැබූ නිලධාරියකුවන එම්.එස්.එම්.සුහයිර් මහතාගේ සේවය ලබාගන්නා ලදී.

## 5. ලංකා ගල් අඟුරු සමාගම ය පිහිටුවීම

නොරොච්චෝලේ, ත්‍රිකුණාමලයේ සහ හම්බන්තොට ඉදිකිරීමට සැලසුම්කර තිබුණු ගල්අඟුරු තාප විදුලි බලාගාර සඳහා අවශ්‍ය ගල් අඟුරු මිලදී ගැනීම් කටයුතු සිදුකිරීම වෙනුවෙන් ලංකා ගල් අඟුරු සමාගම නමින් සීමිත සමාගමක් පිහිටුවීම සඳහා එවකට විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් 2006 අප්‍රේල් 03 දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයක් (ඇමුණුම 3), අනුව අමාත්‍ය මණ්ඩලය විසින් මෙම සමාගම පිහිටුවීමට අදාල අනුමැතිය 2006 අප්‍රේල් 05 දින(ඇමුණුම 4) ලබා දී තිබුණි.

### 5.1 සමාගමේ ප්‍රාග්ධන සංයුතිය

ඉහත අනුමැතිය පරිදි 2008 ජනවාරි 23 දින ලංකා ගල් අඟුරු සමාගම පිහිටුවා තිබුණු අතර, සමාගමේ ප්‍රාග්ධන සංයුතිය එදින සිට මේ දක්වා පහත සඳහන් පරිදිවේ (ඇමුණුම 7).

| කොටස් හිමිකාරත්වය | කොටස් ප්‍රතිශතය | කොටස් ගණන | කොටස් ප්‍රාග්ධනය(රු) | කොටස් සහතික නිකුත්කළ දිනය හා කොටස් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ලංකා විදුලි බල මණ්ඩලය | 60 | 1,200,000 | 12,000,000 | 23.01.2008-කොටස්- 01<br>22.07.2008-කොටස්- 599,999<br>21.07.2009-කොටස්- 600,000 |
| මහා භාණ්ඩාගාරය | 20 | 400,000 | 4,000,000 | 24.03.2009-කොටස්- 200,000<br>11.12.2009-කොටස්- 200,000 |
| ලංකා නැව් සංස්ථාව | 10 | 200,000 | 2,000,000 | 22.07.2008-කොටස් -100,000<br>15.03.2010-කොටස්- 100,000 |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 10 | 200,000 | 2,000,000 | 24.03.2009-කොටස්- 100,000<br>03.09.2009-කොටස්- 100,000 |
| **එකතුව** | 100 | 2,000,000 | 20,000,000 | |

**5.2 සමාගමේ අරමුණු**

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුව සමාගමේ අරමුණු පහත පරිදි විය. (ඇමුණුම 6)

(අ) ගල් අඟුරු, ගල් අඟුරු නිෂ්පාදන, ඛනිජතෙල් නිෂ්පාදන හෝ ඛනිජතෙල් අතුරු නිෂ්පාදන ස්වාභාවික දියර වායු හෝ අනෙකුත් ශක්තීන් නිෂ්පාදනය කළහැකි අමුද්‍රව්‍ය පිළිබඳ ගිවිසුම් වලට එළඹීම, මිලට ගැනීම, විකිණීම සහ බෙදා හැරීම පිළිබඳ ව්‍යාපාර කටයුතු කිරීම.

(ආ) ගල් අඟුරු, ගල් අඟුරු අතුරු නිෂ්පාදන, ඛනිජ තෙල් නිෂ්පාදන හෝ අතුරු ඛනිජ තෙල් නිෂ්පාදන, ස්වාභාවික දියර වායු හෝ අනෙකුත් ශක්තීන් හෝ ශක්ති නිෂ්පාදනය කළ හැකි අමු ද්‍රව්‍ය ලබා ගැනීම, වෙනස් කිරීම, ඇසිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය දෑ අයිතිකර ගැනීම, ඉදිකිරීම, ගොඩනැගීම, ආරක්ෂා කිරීම සහ හෝ එවැනි අවශ්‍ය පහසුකම්, යටිතල පහසුකම් සහ අනෙකුත් අවශ්‍ය දෑ ලබා ගැනීම.

(ඇ) ඛනිජ තෙල් හා ගල් අඟුරු බලාගාර වලට සීමා නොවී බලය උත්පාදනය කළ හැකි බලාගාර ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම හෝ බල උත්පාදනය කරන බලාගාර අත්පත්කර ගැනීම සහ ඒවායේ මෙහෙයුම් සහ නඩත්තු කටයුතු කිරීම.

(ඈ) සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ මධ්‍යස්ථාන වලට සීමා නොවී බල උත්පාදන මධ්‍යස්ථාන අතර සහ විදුලිය තොග සැපයුම් අවස්ථා වලදී හෝ ඕනෑම අවශ්‍ය අවස්ථා වලදී බල උත්පාදන මධ්‍යස්ථාන අතර බලය සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් සඳහා අවශ්‍ය රැහැන් ඉදිකිරීම, ගොඩනැගීම, නඩත්තු කිරීම, ක්‍රියාත්මක කිරීම හා පාලනය කිරීම.

(ඉ) ස්වාධීනව විදුලි බලය නිෂ්පාදනය කිරීම සහ ඒවා එලෙසම ප්‍රධාන පද්ධතියට එකතු කිරීම.

(ඊ) ගල් අඟුරු, ගල් අඟුරු අතුරු නිෂ්පාදන, ඛනිජ තෙල් නිෂ්පාදන හෝ, අතුරු ඛනිජ තෙල් නිෂ්පාදන, ස්වාභාවික දියර වායු, ජීව වායු හෝ අනෙකුත් නිෂ්පාදන ශක්තීන්, හෝ ශක්තීන් නිෂ්පාදනය කළ හැකි අමුද්‍රව්‍ය පූර්ණ මට්ටමින් සැපයීම සඳහා ප්‍රවාහනයට අවශ්‍ය නාවික යාත්‍රා මිලට ගැනීම, නිෂ්පාදනය, කුලියට ගැනීම, ගනුදෙනු කිරීම, හුවමාරු කිරීම.

(උ) මාර්ග සංවර්ධන අධිකාරිය, මහනගර සභා, ප්‍රාදේශීය සභා හෝ එවැනි අනිකුත් අධිකාරීන්, මණ්ඩල, සංවිධාන, සමාගම් හෝ තනි පුද්ගලයින්ගේ මාර්ග, පාලම් තැනීම හෝ නඩත්තු කිරීම පිළිබඳව කටයුතු සහ වැඩ භාරගැනීම.

(ඌ) පුද්ගලයින්, සංවිධාන, ගම්මාන, නගර, පළාත් රජයට හෝ වෙනත් රටවලට ජලය සැපයීම සඳහා ජලය ලබා ගැනීම, ගබඩා කිරීම, විකිණීම, ප්‍රවාහනය, මැනීම හා බෙදාහැරීම හා සම්බන්ධ ළිං, කානු පද්ධති, පිරිපහදු ජලාශ, ජල නල ආදියට

සම්බන්ධ වැඩකටයුතු හා ඊට අවශ්‍ය ''හයිඩ්‍රොලික්'' හා ජල සැපයුම් ඉංජිනේරු සේවා පිළිබඳව ව්‍යාපාර කටයුතු කිරීම.

(එ) සිවිල්, ව්‍යුහාත්මක, යාන්ත්‍රික, විද්‍යුත්, විදුලි, ද්‍රාව, කැනීම් සහ වෙනත් ඕනෑම ආකාරයක ඉංජිනේරු වැඩ සහ ඉදිකිරීම් වලට සම්බන්ධ ව්‍යාපාර සිදුකිරීම.

(ඒ) ඉහත සඳහන් ව්‍යාපාර කටයුතු වලට සම්බන්ධ හෝ සමාගමේ ප්‍රධාන අරමුණු වලට සම්බන්ධ ඕනෑම කටයුත්තක් ශ්‍රී ලංකාව තුල හෝ ඉන් පිටත සිදුකිරීම.

ඉහත සඳහන් අරමුණු පිළිබඳව විගණන නිරීක්ෂණයන් ඡේද අංක 18.1 හි දක්වා ඇත.

### 5.3 කාර්ය මණ්ඩලය

2015 දෙසැම්බර් 31 දිනට සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය 18 ක් වූ අතර එදිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 14 ක් විය.

### 5.4 ලංකා ගල් අඟුරු සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය

2008 වර්ෂයේ සිට 2016 ජූනි 30 දක්වා ලංකා ගල් අඟුරු සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය පහත දැක්වේ.

| | 2008 රු. | 2009 රු. | 2010 රු. | 2011 රු. | 2012 රු. | 2013 රු. | 2014 රු. | 2015 රු. | 2016 (ජුනි 30 දිනට) රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම | - | - | - | 87,650,449 | 199,599,203 | 52,856,223 | 34,173,684 | 32,774,884* | 18,354,497* |
| වෙනත් ආදායම් | 820,286 | 3,226,423 | 21,874,756 | 55,394,699 | 24,421,328 | 1,598 | 1,479,708 | 6,883,043 | 2,204,972 |
| වියදම් (වැටුප් හැර) | 2,999,923. | 4,296,737. | 6,744,444 | 44,967,929 | 67,436,216 | 22,518,867 | 20,526,000 | 24,628,897 | 11,890,574 |
| වැටුප් | 3,423,676 | 5,193,990 | 4,291,754 | 5,520,217 | 8,616,351 | 8,344,337 | 13,739,803 | 14,890,479 | 8,647,496 |
| මූල්‍ය වියදම් | 7,936.93 | 17,552 | 675,817 | 254,088 | 54,967 | 345,795 | 188,554 | 138,551 | 21,399 |
| **ලාභය/ අලාභය** | **(5,611,251)** | **(6,281,857)** | **10,162,741** | **92,302,913** | **147,912,997** | **21,648,821** | **1,999,036** | - | - |

*ශුද්ධ පොදු කාර්ය වියදම් (Net Overhead Cost) ලංකා විදුලිබල මණ්ඩලය විසින් ප්‍රතිපූර්ණය කෙරේ.

## 5.5 ලංකා ගල් අඟුරු සමාගම විසින් ගාස්තු අයකිරීම සහ වියදම් ප්‍රතිපූර්ණයකර ගැනීම

ලංකා ගල් අඟුරු සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය ගල් අඟුරු සැපයීම සහ මිලදී ගැනීම සම්බන්ධයෙන් ආරම්භයේදී ගිවිසුමකට එළඹ නොතිබුණි. කෙසේ වුවද ලංකා විදුලිබල මණ්ඩලය වෙත ගල් අඟුරු සැපයීමේදී මෙ.ටො. එකක් සඳහා ඇ.ඩො. ශත 30 බැගින් ගාස්තුවක් ලංකා ගල් අඟුරු සමාගම විසින් අයකර තිබුණි. 2013 සැප්තැම්බර් 05 දින ලංකා ගල් අඟුරු සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය ගිවිසුමකට එළඹ තිබුණු අතර (ඇමුණුම 11) අනතුරුව ඉහත පරිදිම ලංකා ගල් අඟුරු සමාගම අයකිරීම්කර තිබුණි. පසුව ලංකා ගල් අඟුරු සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය අතර 2014 ඔක්තෝබර් 10 දින එළඹි ගිවිසුමෙහි සඳහන් පරිදි (ඇමුණුම 12) ලංකා ගල් අඟුරු සමාගමේ ශුද්ධ පොදු කාර්ය වියදම් (Net Overhead Cost) ලංකා විදුලිබල මණ්ඩලය විසින් ප්‍රතිපූර්ණය කිරීමට එකඟවී තිබුණි. අනතුරුව 2016 මැයි මස 23 වන දිනද, ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා ගල් අඟුරු සමාගම නව ගිවිසුමකට එළඹ තිබුණි (ඇමුණුම 13).

## 6. ලක්විජය ගල් අඟුරු බලාගාරයේ ගල් අඟුරු අවශ්‍යතාවය, ප්‍රවාහනය, ගොඩබෑම සහ ගබඩා කිරීම

නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ පළමු අදියරෙහි බලශක්ති උත්පාදනය 2011 පෙබරවාරි මාසයේදී ආරම්භ කර තිබුණු අතර, ඒ සඳහා වූ වාර්ෂික ගල් අඟුරු අවශ්‍යතාවය මෙ.ටො 650,000 ක් ලෙස හඳුනා ගෙන තිබුණි. එහි දෙවන හා තෙවන අදියරයන්හි බලශක්ති උත්පාදනය පිළිවෙලින් 2013 අප්‍රේල් සහ සැප්තැම්බර් මාසයන්හිදී ආරම්භ කර තිබුණු අතර, ඒ අනුව ගල් අඟුරු මුළු වාර්ෂික අවශ්‍යතාවය මෙ.ටො. 2,250,000 කි. සාමාන්‍ය වශයෙන් අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා නොරොච්චෝලයේ ප්‍රදේශයට වාරකන් කාලය පැවතීම හේතුවෙන් ගල් අඟුරු ගොඩබෑමද ගල් අඟුරු රැගෙන එන නැව් හෝ බත්තල් බලාගාරයේ ජැටිය වෙත පැමිණීමද කළ නොහැකි වේ. එහෙයින්, තාප බලය නිශ්පාදනය සඳහා අවශ්‍ය වන වාර්ෂික ගල්අඟුරු අවශ්‍යතාවය ඔක්තෝබර් සිට ඉදිරි වර්ෂයේ මාර්තු දක්වා කාලය තුළදී රැස්කරගෙන ගල් අඟුරු අංගනයේ ගබඩා කර බලශක්ති උත්පාදන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ. නොරොච්චෝලේට පැමිණෙන නැවක ගෙන එන ගල් අඟුරු ප්‍රමාණය මෙ.ටො.65,000 ක් පමණ වීම හේතුවෙන් (Due to vessel size is panamax of 65,000 MT capacity) ඉහත සඳහන් අවශ්‍යතාවය අනුව වර්ෂය තුළ නැව් ගමන්වාර 35 පමණ අපේක්ෂා කරනු ලැබේ.

## 6.1 ගල්අඟුරු සඳහා මුදල් ගෙවීම

බලාගාර අංගන භූමියේ ඇතිරීම සඳහා තාප නොවන ගල් අඟුරුද (Deft Coal) බලාගාරයේ දහනය සඳහා තාප ගල් අඟුරුද (Thermal Coal) පහත 7 ඡේදයෙහි සඳහන් විකල්ප ක්‍රම අනුව Free On Board (FOB/ නැව තෙක් නොමිලේ ) හෝ Cost, Insurance and Freight (CIF/ මිල, රක්ෂණ සහ නැව් ගාස්තු ඇතුලත්) පදනමින් මිලදී ගෙන තිබුණි. එම විකල්ප ක්‍රම අනුව ගල් අඟුරුවල අයිතිය ලංකා ගල් අඟුරු සමාගම වෙත මාරුවීම පිළිවෙළින් ගල් අඟුරු තොගය නැවට පැටවූ අවස්ථාවේ දී සහ ජැටිය වෙත ලඟාවූ අවස්ථාවේදී සිදුවේ.

දීර්ඝකාලීන සැපයුම් ප්‍රසම්පාදන යටතේ FOB පදනම මත ගල් අඟුරු තොගයේ වටිනාකමින් (පැටවුම් වරායේදී සාම්පල් පරීක්ෂාකර නිකුත්කරන වාර්තාවට අනුව ගලපන ලද) සියයට 100 ක මුදලක් ගල් අඟුරු තොගය ලැබීමට පෙර (අවසන් ඉන්වොසිය ලැබීමෙන් අනතුරුව) සැපයුම්කරුට ගෙවනු ලැබේ. ක්ෂණික සැපයුම් ප්‍රසම්පාදනයේදී ගල් අඟුරු තොගයේ වටිනාකමින් සියයට 85 ක මුදලක් ගල් අඟුරු තොගය ලැබීමට පෙර සැපයුම්කරුට නිදහස් කර ගැනීමට හැකියාව පවතී. ඉතිරි සියයට 15 ක මුදල ගොඩබෑමෙන් අනතුරුව සැපයුම්කරුට ගෙවනු ලැබේ.

## 6.2 ගල් අඟුරු නැවට පටවන අවස්ථාවේ සිට බලාගාරය වෙත යොමුකරන තෙක් සිදුවන ක්‍රියාවලිය

- ස්වාදීන තත්ත්ව පරීක්ෂකයකු විසින් පරීක්ෂාවට ලක්කිරීම
- සැපයුම්කරු විසින් ගල් අඟුරු නැවට පැටවීම
- නොරොච්චෝලේ බලාගාර ජැටියට නැව්වලට ලඟාවීමට නොහැකි බැවින් බලාගාර ජැටියේ සිට කි.මී 4 ක් පමණ ඈත ගැඹුරු මුහුදේ දී එම ගල් අඟුරු බත්තල්වලට පැටවීම (ඇමුණුම 14)
- ගල් අඟුරු රැගත් බත්තල් බලාගාර ජැටියට රැගෙන ඒම
- බත්තල් වලින් රැගෙන එන ගල් අඟුරු දොඹකර මගින් ප්‍රවාහන පටිය ( Zero belt)වෙත යොමුකිරීම
- ගල් අඟුරු එම පටිය ඔස්සේ ගල් අඟුරු අංගනය වෙත යැවීම
- අංගනයේ ඇති ගල් අඟුරු නිසි පරිදි ඇසිරීම සහ බලාගාරය වෙත යැවීම සඳහා යොදගන්නා යන්ත්‍රය ආසන්නයට බැකෝ යන්ත්‍ර මගින් ඒවා ලඟාකරවීම

## 7. ගල් අඟුරු මිලදී ගැනීමේදී/ලබා ගැනීමේදී අනුගමනය කර තිබූ ක්‍රමවේදයන්

### 7.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර මිලදී ගැනීම්

ජාත්‍යන්තර තරඟකාරී මිළ කැඳවුම් ක්‍රමය අනුගමනය කරමින්, පහත සඳහන් ක්‍රම දෙක යටතේ මිලදී ගැනීම් සිදුකර තිබුණි.

- දීර්ඝකාලීන ප්‍රසම්පාදනය (Term Contracts)

  සාපේක්ෂව වැඩි ගල් අඟුරු ප්‍රමාණයක් විවෘත මිල කැඳවීම මගින් තෝරාගන්නා සැපයුම් කරුවන්ගෙන් ලබාගැනීමට සාමාන්‍යයෙන් වර්ෂයකට වඩා වැඩි කාලයක් සඳහා පිරිනමන කොන්ත්‍රාත්තු යටතේ කරනු ලබන මිලදී ගැනීම් දීර්ඝකාලීන ප්‍රසම්පාදන ලෙස සලකනු ලැබේ.

- ක්ෂණික ප්‍රසම්පාදනය (Spot Contracts)

  ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවා සාපේක්ෂව කුඩා ප්‍රමාණයන් කෙටි කාලයක්තුල එදිනට පවතින කරඟකාරී මිල මත සපයා ගැනීම සඳහා පිරිනමන කොන්ත්‍රාත්තු ක්ෂණික ප්‍රසම්පාදන ලෙස සලකනු ලැබේ.

(අ) දීර්ඝකාලීන ප්‍රසම්පාදනය අනුගමනය කිරීම් සාරාංශය (Term Contracts)

නොරොච්චෝලේ පිහිටි ලක්විජය තාප විදුලි බලාගාරය සඳහා ගල් අඟුරු මිලදී ගැනීමේ කටයුතු 2008 මාර්තු 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි (ඇමුණුම 15) දීර්ඝකාලීන සැපයුම් ප්‍රසම්පාදනය යටතේ, ලංකා ගල් අඟුරු සමාගම විසින් 2008 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. ඒ අනුව 2016 ජුනි මාසය දක්වා කාලය තුල කටයුතු ආරම්භ කර තිබුණු දීර්ඝකාලීන සැපයුම් ප්‍රසම්පාදන 06 න් 02 ක් Noble Resources Pte. සමාගම සහ Swiss Singapore Overseas Pte. සමාගම වෙත කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබූ අතර, ඉන් 03 ක් වාර්තාවේ 8 ඡේදයෙහි දැක්වෙන වගුවේ සඳහන් හේතූන් මත අවලංගුකර තිබුණු අතර කටයුතු ආරම්භකර තිබුණු 4 වන ප්‍රසම්පාදනය ලංසු කැඳවීමකින් තොරව අවලංගුකර තිබුණි.

(ආ) ක්ෂණික ප්‍රසම්පාදනය අනුගමනය කිරීම් සාරාංශය (Spot Contract)

දීර්ඝ කාලීන සැපයුම්කරුවන් තෝරා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි පැවති දුර්වලතා නිසා (අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි සඳහන් පරිදි) ඇතිවිය හැකිව තිබූ ගල් අඟුරු ඌනතාවය මග හැරවීම සඳහා ක්ෂණික මිලදීගැනීම් ප්‍රසම්පාදන ක්‍රියාවලීන් 06 ක් ආරම්භ කර තිබුණි. ඉන් තෙවන ප්‍රසම්පාදනය 13.3 ඡේදයෙහි දැක්වෙන හේතූන් මත අවලංගු කර තිබුණි. ඉතිරි ප්‍රසම්පාදන 05 ම ප්‍රදානය කර තිබුණු අතර එම අවස්ථා

05 දීම තේරී පත්ව තිබුණේ Liberty Commodities සමාගම සහ Adani Global Pte.සමාගම යන සැපයුම්කරුවන් දෙදෙනා පමණි.

## 7.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර මිලදී ගැනීම්/ ලබාගැනීම්

ලංකා නැව් සංස්ථාව සැපයුම්කරුවකු ලෙස සලකමින් ඡේද අංක 14.2 හි විස්තර වශයෙන් දැක්වෙන පරිදි කිසිදු ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය නොකර අවස්ථා තුනකදී ගල් අඟුරු මිලදීගෙන තිබුණි. තවද ඡේද අංක 14.1.3 හි විස්තර වශයෙන් දැක්වෙන පරිදි ලංකා ගල් අඟුරු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් (ඇමුණුම 16) අනුව එක් අවස්ථාවකදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර ගල් අඟුරු මිලදීගෙන / ලබා ගෙන ලංකා විදුලිබල මණ්ඩලය වෙත සපයා තිබුණි.

එලෙස ප්‍රසම්පාදන ක්‍රියාවලියයෙන් බැහැරව මිලදීගත්/ ලබාගත් අවස්ථා සැකෙවින් පහත පරිදිවිය.

**(අ) සැපයුම්කරුවෙකු ලෙස ලංකා නැව් සංස්ථාව වෙතින් ගල් අඟුරු මිලදී ගැනීම**

ලංකා ගල් අඟුරු සමාගම විසින් ලංකා නැව් සංස්ථාව වෙතින් තාප නොවන ගල් අඟුරු ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව එක් අවස්ථාවකදී මිලදී ගෙන තිබුණි. තවද පසු අවස්ථා දෙකකදී තාප ගල් අඟුරුද ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව මිලදී ගෙන තිබුණි.

**(ආ) ලංකා නැව් සංස්ථාව විසින් ගල් අඟුරු ප්‍රවාහනයේදී/ ගොඩබෑමේදී ඇති වූ ගැටළු හේතුවෙන් පසුව ලංකා නැව් සංස්ථාවෙන් විකල්ප තොග ලබාගැනීම**

ලංකා නැව් සංස්ථාව විසින් Noble Resources සමාගම සපයන ලද තාප ගල් අඟුරු ප්‍රවාහනය කර තිබූ අතර වාරකන් කාලය හේතුවෙන් නැව් වාර අංක 16 න් සහ අංක 17 න් ගෙන එන ලද එම තොග ගොඩබෑමට නොහැකිව වෙනත් ගැණුම්කරුවන්ට ලංකා නැව් සංස්ථාව අලෙවිකර තිබුණි. එලෙසම ඉහත (අ) ඡේදයේ සඳහන් තාප නොවන ගල් අඟුරුද ගොඩබෑමට නොහැකිව ආපසු රැගෙන යාමට සිදුව තිබුණි. එලෙස ගොඩබෑමට නොහැකි වූ තාප ගල් අඟුරු මෙන්ම තාප නොවන ගල් අඟුරු ප්‍රමාණයෙන් කොටසක් පසු අවස්ථාවකදී ලංකා නැව් සංස්ථාව විසින් සපයා තිබුණි.

## 7.3 ගල් අඟුරු වල ගැණුම් මිල තීරණය කිරීම

ගල් අඟුරු වල මිල තීරණය කිරීම සඳහා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් පහත දැක්වෙන මිල දර්ශක පදනම් කරගෙන තිබුණි.

### 7.3.1 නිව් කාසල් දර්ශකය (Newcastle Index)

මෙය විශේෂයෙන් ආසියානු පැසිපික් කලාපීය රටවලින් සැපයෙන ගල් අඟුරු වල මිල තීරණය කිරීමට යොදාගන්නා පිළිගත් දර්ශකයකි. (මෙම දර්ශකය www.globalcoal.com නැමති වෙබ් අඩවියේ ලියාපදිංචි පාර්ශවයන්ට ලබාගත හැකිය.)

### 7.3.2 ඒපීඅයි 4 දර්ශකය (API4 Index)

මෙය විශේෂයෙන් අප්‍රිකානු කලාපීය රටවලින් සැපයෙන ගල් අඟුරු වල මිල තීරණය කිරීමට යොදාගන්නා පිළිගත් දර්ශකයකි. (මෙම දර්ශකය www.cmegroup.com නැමති වෙබ් අඩවියේ ලියාපදිංචි පාර්ශවයන්ට ලබාගත හැකිය.)

**(ලංකා ගල් අඟුරු සමාගම ඉහත වෙබ් අඩවියන්හි ලියාපදිංචි සමාගමකි)**

### 7.3.3 ගල් අඟුරු බලාගාරයේ ක්‍රියාකාරීත්වය

ලංකා විදුලිබල මණ්ඩලය විසින් සපයන ලද තොරතුරු අනුව ලක්විජය බලාගාරය ආරම්භයේ සිට 2016 ඔක්තෝබර් 31 දක්වා ජනනය කර තිබුණු මුලු විදුලි ඒකක ප්‍රමාණය ගිගා වොට් පැය 15,744 කි. දැනට ජනනය කරනු ලබන තාප ඉන්ධන කිලෝ වොට් පැයක් සඳහා

රු. 21.44 ක් වැය වන අතර, ලක්විජය බලාගාරය මඟින් නිෂ්පාදනය කරන කිලෝ වොට් පැයක් සඳහා වැයවන ඍජු පිරිවැය රු. 5.23 කි. බලාගාරය විසින් උපයා ඇති සමස්ථ ආදායම එ.ජ.ඩො මිලියන 1,823 ක් වන අතර. බලාගාරය ඉදිකිරීම සඳහා දරන ලද වියදම එ.ජ.ඩො.මිලියන 1,346 ක් විය. ඒ අනුව 2016.10.31දිනට උපයා ඇති මුළු වියදම ඉක්මවූ ආදායම එ.ජ.ඩො.මිලියන 477කි (ඇමුණුම- 17).

## 8 දීර්ඝකාලීන සැපයුම් ප්‍රසම්පාදන

ලංකා ගල් අඟුරු සමාගම විසින් 2016 ජූනි 30 දින දක්වා සිදුකර තිබුණු දීර්ඝකාලීන සැපයුම් ප්‍රසම්පාදන 06 ට අදාලව තොරතුරු සංක්ෂිප්තයක් පහත දැක්වේ.

| ප්‍රසම් පාද නය | ලංසු කැඳවනලද දිනය | ලැබූ ලංසු ගණන | තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශය ලද දිනයන් | ප්‍රසම්පාදන කමිටුව නිර්දේශය ලද දිනයන් | අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කළ දිනයන් | අමාත්‍ය මණ්ඩල තීරණය සහ දිනය | යොමුව |
|---|---|---|---|---|---|---|---|
| 1 | අභිප්‍රාය ප්‍රකාශ කැඳවීම- 2008.04.16 | 28 | 2008.07.14 | 2008.07.21 | නැත | අමාත්‍ය මණ්ඩල අනුමැතියක් නොමැතිව ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රසම්පාදනය අවලංගුකර නැවත ලංසු කැඳවා ඇත. | ඡේද අංක 12.1 |
| | ලංසු කැඳවීම 2009.01.08 | 02 | 2009.06.12 | 2009.06.29 | | | |
| 2 | 2009.07.27 | 12 | 2009.11.11 | 2009.12.07 | 2010.02.03 | Noble Resources සමාගම වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමීමට 2010.04.06 දින තීරණය කර තිබුණි | ඡේද අංක 12.2 |
| 3 | 2011.12.29 | 12 | 2012.10.25<br>2012.12.31 | 2012.11.02<br>2013.01.08 | 2013.05.03 | මෙම ටෙන්ඩරය 2013.05.21 දින අවලංගුකර ගල් අඟුරු හදිසි අවශ්‍යතා වෙතොත් ඒවා වත්මන් සැපයුම්කරුගෙන් ප්‍රසම්පාදනය කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. | ඡේද අංක 12.3 |
| 4 | ලංසු කැඳවීමට පෙර ප්‍රසම්පාදන කටයුතු නවතා තිබුණි | | | | | 2013.11.11 දින Noble Resources සමාගම ගිවිසුමේ නියමයන් සහ කොන්දේසිවලට අනුව ගල් අඟුරු මෙ.ටො 1 ක පාදක මිල එ.ජ.ඩො. 68.50 ක් බැගින් උපරිමය මෙ.ටො.මිලියන 1 ක සීමාවකට යටත්ව මිලදී ගැනීමට 2014.03.31 දක්වා වත්මන් ගිවිසුමේ කාලය දීර්ඝ කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. | ඡේද අංක 12.4 |
| 5 | 2014.04.17 | 06 | 2014.07.09 | 2014.07.09 | 2014.08.13 / 2014 09.29 | 2014.10.16 දින (CIF) මිල යටතේ මෙ.ටො. 01 ක් ඉංදුනීසියාවෙන් එ.ජ.ඩො. 93.65 බැගින්ද, රුසියාවෙන් එ.ජ.ඩො.95.83 බැගින්ද, දකුණු අප්‍රිකාවෙන් එ.ජ.ඩො. 94.13 බැගින්ද, මෙ.ටො.මිලියන 1.97 ක් මිලදී ගැනීමටත් කාලය මාස 06 කින් දීර්ඝ කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. | ඡේද අංක 12.5 |
| 6 | 2014.11.27 | 08 | 2015.07.03 | 2015.07.03<br>2015.10.01 | 2015.09.16<br>2015. 10.01 | M/S Swiss Singapore සමාගම වෙත ලංසුව පිරිනැමීම 2015.10.12 තීරණය කර තිබුණි. | ඡේද අංක 12.6 |

## 09 ක්ෂණික සැපයුම් ප්‍රසම්පාදනය

ලංකා ගල් අඟුරු සමාගම විසින් 2016 ජූනි 30 දින දක්වා සිදුකර තිබූ ක්ෂණික ප්‍රසම්පාදන 05 ට අදාල තොරතුරු සංක්ෂිප්තයක් පහත දැක්වේ.

| ප්‍රසම්පාදනය | ඇණවුම්කළ ප්‍රමාණය මෙ.ටො. | ප්‍රසම්පාදන කමිටුව ප්‍රසම්පාදනය සඳහා අනුමැතිය දුන් දිනය | ලංසුකරු | මිල එ.ජ.ඩො | අමාත්‍යාංශ ලේකම් ලංකා ගල් අඟුරු සමාගම ය වෙත දැනුම් දෙන ලද දිනය | ප්‍රදානය කිරීමේ ලිපිය නිකුත්කළ දිනය | ගිවිසුම අත්සන් කළ දිනය | අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ දිනය | අමත්‍ය මණ්ඩල ආවරණ අනුමැතිය ලබා දුන් දිනය | යොමුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | 165,000 | 2015.08.10 | Liberty | 69.47 CIF( 55.70 FOB) | 2015.08.11 | 2015.08.11 | 2015.08.17 | 2015.11.19 | 2015.12.09 | ඡේද අංක 13.1 |
| යලි ඇණවුම | 82.500 | 2015.08.20 | Liberty | 69.47 CIF(55.70 FOB) | 2015.08.26 | 2015.08.27 | නැත | 2015.11.19 | 2015.12.09 | |
| 02 | 330,000 | 2015.09.17 | Liberty | 51.29 FOB | 2015.09.21 | 2015.09.17 | 2015.09.18 | 2016.01.13 | 2016.01.27 | ඡේද අංක 13.2 |
| 03 | අවලංගු කර ඇත | | | | | | | | | ඡේද අංක 13.3 |
| 04 | 330,000 | 2016.01.06 | Liberty | 49.85 FOB | 2016.01.06 | 2016.01.07 | 2016.01.21 | 2016.06.28 | 2016.07.12 | ඡේද අංක 13.4 |
| 05 | 260,000 (තාප) 20,000 (තාප නොවන | 2016.03.03 | Adani | 50.25 FOB (තාප) 33.00 FOB (තාප නොවන) | 2106.03.10 | 2016.03.04 | 2016.03.09 | අනුමැතියට ඉදිරිපත් කර නැත | | ඡේද අංක 13.5 |

## 10 ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව මිලදීගත්/ ලබාගත් අවස්ථා

ලංකා ගල් අඟුරු සමාගම විසින් කිසිදු ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව ලංකා නැව් සංස්ථාව වෙතින් සහ Noble Resources සමාගම වෙතින් ගල් අඟුරු මිලදීගත්/ ලබාගත් අවස්ථා පහත පරිදි විය.

| සැපයුම්කරු | නැව් වාරය | ඇණවුම් කළ ප්‍රමාණය මෙ.ටො. | | මෙ.ටො. එකක මිල (එ.ජ.ඩො.) | | ගිවිසුම අත්සන් කළ දිනය | යොමුව |
|---|---|---|---|---|---|---|---|
| | | තාප ගල් අඟුරු | තාප නොවන ගල් අඟුරු | තාප ගල් අඟුරු | තාප නොවන ගල් අඟුරු | | |
| ලංකා නැව් සංස්ථාව | 0 (DC 1) | - | 19,892 | | 80.56(CIF) | | ඡේද අංක 14.2 |
| ලංකා නැව් සංස්ථාව | 3 | 81,688 | - | 150.92(CIF) | - | 2011.12.21 | ඡේද අංක 14.2 |
| ලංකා නැව් සංස්ථාව | 13 | 59,358 | 9,640 | 137.67(CIF) | 81.02(CIF) | 2011.12.21 | ඡේද අංක 14.2 |
| ලංකා නැව් සංස්ථාව | 19 | 32,827 | 12,375<br>12,650 | 107.78(CIF) | 80.72 (CIF)<br>72.14 (CIF) | 2012.06.29 | ඡේද අංක 14.2 |
| ලංකා නැව් සංස්ථාව | 20 | 55,111 | - | 100.67 (CIF) | - | 2012.06.29 | ඡේද අංක 14.2 |
| Noble Recourses | 47 | 54,200 | - | 97.33 (CIF) | - | 2014.07.24 | ඡේද අංක 14.1.3 |
| Noble Recourses | 48 | 54,270 | - | 95.76 (CIF) | - | 2014.07.24 | ඡේද අංක 14.1.3 |
| Noble Recourses | 49 | 56,739 | - | 98.52 (CIF) | - | 2014.07.24 | ඡේද අංක 14.1.3 |
| Noble Recourses | 50 | 57,530 | - | 98.22 (CIF) | - | 2014.07.24 | ඡේද අංක 14.1.3 |
| එකතුව | | **451,543** | **54,557** | | | | |

## 11 ලංකා ගල් අඟුරු සමාගම විසින් මිලදීගත් ගල් අඟුරු ප්‍රමාණයන් හා දිනයන්

නොරොච්චෝලේ ගල් අඟුරු තාප බලාගාරයේ උත්පාදන කටයුතු 2011 පෙබරවාරි මාසයේ දී ආරම්භ කර තිබුණි. ලංකා ගල් අඟුරු සමාගම විසින් ගල් අඟුරු මිලදීගැනීම 2010 නොවැම්බර් සිට 2016 ජූනි දක්වා සිදුකර තිබුණු තාප ගල් අඟුරු මිලදී ගැනීම්වල සාරාංශ ගත තොරතුරු පහත පරිදිය.

| සැපයුම්කරු | ප්‍රමාණය මෙ.ටො | නැව් වාර සංඛ්‍යාව | කාල පරාසය * | | ගෙවන ලද මුදල එ.ජ.ඩො. | | යොමුව |
|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සැපයුම්කරුට | ප්‍රවාහනය සදහා | |
| Noble - දෙවන දිගුකාලීන ප්‍රසම්පාදනය | 2,237,994 | 37 | 2010.11.30 | 2014.01.09 | 203,661,590 | 60,113,307 | ඡේද අංක 14.1.1 |
| Noble - පළමු කාලය දිගුකිරීම | 210,972 | 4 | 2014.02.17 | 2014.03.23 | 14,221,208 | 5,398,175 | ඡේද අංක 14.1.2 |
| Noble -අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව | 222,739 | 4 | 2014.08.29 | 2014.10.23 | 16,042,418 | 5,673,162 | ඡේද අංක 14.1.3 |
| Noble -දෙවන කාලය දිගුකිරීම | 1,626,987 | 28 | 2014.10.15 | 2015.03.24 | 104,437,229 | 34,104,416 | ඡේද අංක 14.1.4 |
| ලංකා නැව් සංස්ථාව | 284,978 | 5 | 2011.03.07 | 2012. 11.05 | 32,157,128 | 6,546,559 | ඡේද අංක 14.2 |
| Liberty - ක්ෂණික 1 | 226,290 | 4 | 2015.09.01 | 2015.10.14 | 12,295,615 | 3,116,013 | ඡේද අංක 14.4 |
| Liberty - ක්ෂණික 2 | 370,594 | 7 | 2015.10.04 | 2015.11. 18 | 18,296,805 | 5,392,143 | ඡේද අංක 14.4 |
| Siwss Singapore-හයවන දිගුකාලීන ප්‍රසම්පාදනය | 1,064,724 | 18 | 2015.11.16 | 2016.03. 28 | 57,932,357 | 15,491,734 | ඡේද අංක 14.5 |
| Liberty - ක්ෂණික 4 | 383,804 | 7 | 2016.01.24 | 2016.03.14 | 18,229,353 | 5,584,348 | ඡේද අංක 14.4 |
| Adani - ක්ෂණික 5 | 146,117 | 3 | 2016.04.02 | 2016.04.05 | 7,253,790 | 2,126,002 | ඡේද අංක 14.6 |
| එකතුව | **6,775,199** | | | | **484,527,493** | **143,545,859** | |

*** නැව් භාර පත් අනුව**

## 12 දීර්ඝ කාලීන ප්‍රසම්පාදන

ලංකා ගල් අඟුරු සමාගම විසින් කටයුතු ආරම්භකර අතරමග නවතනලද/ අවලංගු කළ සහ කොන්ත්‍රාත් ප්‍රදානයකල දීර්ඝකාලීන ප්‍රසම්පාදනයන්ට අදාල විස්තරාත්මක තොරතුරු පහත පරිදි වේ.

### 12.1 පළමුවන ප්‍රසම්පාදනය - 2009

#### 12.1.1 ප්‍රසම්පාදනය සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාගැනීම

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) පුත්තලම විදුලිබලාගාරය සඳහා ගල් අඟුරු ප්‍රසම්පාදනය යන මැයෙන් එවකට විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් ලංකා ගල් අඟුරු සමාගම යෙන් ගල් අඟුරු ප්‍රසම්පාදනය මෙහෙයවීම පිණිස තාක්ෂණ ඇගයීම් කමිටුවක් (Technical Evaluation Committee) සහ අමාත්‍ය මණ්ඩලය මගින් පත්කෙරෙන ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවක් (Standing Cabinet Appointed Procurement Committee) පත්කිරීම සඳහාත් එකී සමාගම විසින් අභිප්‍රාය ප්‍රකාශයක් වහාම කැඳවීම සඳහාත් අනුමැතිය ඉල්ලමින් 2008 මාර්තු 02 දින ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශය (ඇමුණුම 18) අමාත්‍ය මණ්ඩලය විසින් 2008 මාර්තු 27 දින අනුමත කර තිබුණි (ඇමුණුම 19). ඒ අනුව භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් 2008 අප්‍රේල් 23 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත තාක්ෂණික ඇගයීම් කමිටුව සහ අමාත්‍ය මණ්ඩලය මගින් පත්කෙරෙන ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවක් නම්කර තිබුණි (ඇමුණුම 20).

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 2.11.1.(ඇ) (ඇමුණුම 21) හි සඳහන් පරිදි ප්‍රසම්පාදන කාලසටහන, ප්‍රසම්පාදන ක්‍රමය සහ ලංසු කැඳවීමේ ලේඛන වර්ග පිළිබඳව එකඟවීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව කමිටු දෙකේ ඒකාබද්ධ පළමු රැස්වීමක් පැවැත්විය යුතුය.
මෙම ඡේදයට අදාල විගණන නිරීක්ෂණයන් ඡේද අංක 18.2 (අ) හි දක්වා ඇත.

(ඇ) ඉහත (අ) ඡේදය අනුව, පළමු ප්‍රසම්පාදනයේදී අභිප්‍රාය ප්‍රකාශ කැඳවීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2008 මාර්තු 27 දින අනුමැතිය දී තිබුණි. ඒ අනුව ලංකා ගල් අඟුරු

සමාගම පළමු ප්‍රසම්පාදනය සඳහා අභිප්‍රාය ප්‍රකාශ කැඳවීමේ පුවත්පත් දැන්වීමේ "බලාගාරයේ මුළු ගල් අඟුරු පාරිභෝජන අවශ්‍යතාවය සපුරාලීමට අයදුම්කරු සතු හැකියාවන් තහවුරු කිරීම සඳහා අපේක්ෂිත ගල් අඟුරු සැපයීමේ මූලාශ්‍රයන් සහ ක්‍රමවේදයන් පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු සැපයිය යුතුය සහ ගල් අඟුරු සැපයීම හෝ ඒ හා සමාන ව්‍යාපාරයක වර්ෂ 5 ක පලපුරුද්දක් තිබිය යුතු බව සඳහන් කර තිබුණි.

මෙම ඡේදයට අදාල විගණන නිරීක්ෂණයන් ඡේද අංක 18.2 (ආ) හි දක්වා ඇත.

### 12.1.2 ලංසු ක්‍රියාවලිය

ලංසු ක්‍රියාවලිය අදියර 3 කින් සිදුකර තිබුණු අතර, ප්‍රථමයෙන් ලංසු ඉදිරිපත් කිරීම සඳහා කැමැත්තක් දක්වන පාර්ශවයන්ගෙන් අභිප්‍රාය ප්‍රකාශයක් කැඳවීමත් ("Expression of Interest"), දෙවනුව එමගින් තෝරා ගන්නා පාර්ශවයන්ගේ පූර්ව සුදුසුකම් පරීක්ෂා කොට සුදුසුකම් ලබන ලංසුකරුවන් ගේ නාම ලේඛනයක් සැකසීමත්, තෙවනුව ඉදිරියේදී ලංසු කැඳවීම එම ලේඛනයේ ලියාපදිංචි තරඟකරුවන්ට සීමා කිරීමත් යන පිළිවෙත් අනුගමණය කර තිබුණි.

### 12.1.3 අභිප්‍රාය ප්‍රකාශ කැඳවීම සහ ඇගැයීම

(අ) ලංකා ගල් අඟුරු සමාගමේ සභාපති/කළමනාකරණ අධ්‍යක්ෂ විසින් "Expression of Interest" කැඳවා 2008 අප්‍රේල් 16 දින පුවත්පත් දැන්වීමක් පලකර තිබුණි (ඇමුණුම 22). එම දැන්වීමට අනුව මෙම ලංසුව 2008 මැයි 30 දින වසා තිබුණු අතර එදිනට ඇමුණුම 23 හි සඳහන් ලංසුකරුවන්ගෙන් අයදුම්පත් 28 ක් ලැබී තිබුණි.

(ආ) එසේ වුවද සුදුසුකම් සලකා බැලීමකින් තොරව ඉහත ඇමුණුම 23 හි සඳහන් 28 දෙනා අතරින් අයදුම්පත් ගාස්තුව ගෙවා තිබුණු අභිප්‍රාය ප්‍රකාශ ඉදිරිපත් කළ 26 දෙනා වෙතම පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීමේ (Pree Qualification) අයදුම්පත් ලබාදීමට 2008 ජූලි 21 දින පැවති ප්‍රසම්පාදන කමිටුව පළමු රැස්වීමේදී තීරණය කර තිබුණි.

### 12.1.4 පූර්ව සුදුසුකම් පරීක්ෂාව

(අ) පූර්ව සුදුසුකම් (Pre-Qualification) අයදුම්පත් 2008 ජූලි 22 දින සිට 2008 අගෝස්තු 01 දක්වා කාලය තුල ලබා ගන්නා ලෙසත් එසේ පැමිණි අයදුම්පත් භාර නොගතහොත් ලියාපදිංචි තැපැලෙන් එවන බවත් සඳහන් ලිපියක් අභිප්‍රාය ප්‍රකාශ ඉදිරිපත් කළ 26 දෙනාවෙත ලංකා ගල් අඟුරු සමාගම සභාපති විසින් යවා තිබුණි.

(ආ) ඒ අනුව ලැබී තිබුණු පූර්ව සුදුසුකම් (Pree Qualification) අයදුම්පත් 12 න් අයදුම්පත් 8 ක් සුදුසුකම් ලැබූ ලෙස 2008 ඔක්තෝබර් 03 දින තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශකර තිබුණි. එම නිර්දේශය මත ප්‍රසම්පාදන කමිටුව විසින් 2008 නොවැම්බර් 14 දින දෙන ලද අනුමැතිය අනුව එම 8 දෙනාගෙන් ලංසු කැඳවීමට තීරණයකර තිබුණි.

### 12.1.5 ලංසු කැඳවීම

පළමු ප්‍රසම්පාදනය ලෙස වර්ෂයකට මෙ.ටොන් 650,000 +-ක් බැගින් වර්ෂ 3 ක කාලයක් සඳහා ගල් අඟුරු මෙ.ටොන් 1,950,000 ± මිලදී ගැනීමේ කටයුතු සමාගම විසින් 2008 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. 2008 අප්‍රේල් 16 දින සිදුකර තිබුණු ලංසු කැඳවීමට අනුව ලංසු භාර ගැනීමේ අවසාන දිනය 2009 මාර්තු 09 වුවද එම දිනය පසුව සංශෝධන 01 මගින් 2009 මාර්තු 23 දක්වා ද, සංශෝධන අංක 04 මගින් 2009 මැයි 05 දින දක්වා ද, සංශෝධන අංක 05 මගින් 2009 ජූනි 02 දින දක්වා ද දීර්ඝ කර තිබුණි. පළමු හා දෙවන දින දීර්ඝ කිරීම වෙනුවෙන් නිකුත්කළ පිළිවෙලින් සංශෝධන 01 සහ සංශෝධන 04 පිළිබඳව ලංසුකරුවන්ට දැනුම්දීමට සකස්කළ ලිපිවල ඡායා පිටපත් පමණක් ගොනුගත කර තිබුණි. එම ඡායා පිටපත්වල සියලු ලංසුකරුවන් වෙත යවනලදී යන අදහස දැක්වෙන 'sent for all bidders' යනුවෙන් සහ සියලු ලංසුකරුවන් වෙත ෆැක්ස් මගින් සහ විද්‍යුත් තැපැලෙන් යවනලදී යන අදහස දැක්වෙන 'Faxed & emailed to all bidders' යනුවෙන් අත් අකුරින් ලියා තිබුණි (ඇමුණුම 24).

මෙම ඡේදයට අදාල විගණන නිරීක්ෂණයන් ඡේද අංක 18.2 (ඇ) හි දක්වා ඇත.

### 12.1.6 ලංසු කැඳවීම දීර්ඝ කිරීම

ඉහත පරිදි ලංකා ගල් අඟුරු සමාගම විසින් වරින් වර ලංසු භාරගැනීමේ අවසන් දිනයන් දීර්ඝ කර තිබුණු අතර ඒ අනුව ලංසු කැඳවීම 2009 ජූනි 02 දින අවසන්කර තිබුණි.

### 12.1.7 ලංසු විවෘත කිරීම සහ ඇගැයීම

මෙම ප්‍රසම්පාදනයට අදාලව ලංසු ලියවිලි 08 **ක්** නිකුත් කර තිබුණු අතර ලැබී තිබුණු සංඛ්‍යාව 02 ක් විය. එම ලංසු 2009 ජූනි 02 දින විවෘත කර තිබුණි. තාක්ෂණික ඇගැයීමේදී එක් ලංසුකරුවකු තාක්ෂණිකව ප්‍රතිචාරාත්මක නොවූ අතර, මූල්‍ය යෝජනා ඇගැයීමේදී අනෙක් ලංසු කරුද ප්‍රතික්ෂේප වී තිබුණි.

### 12.1.8 ලංසු කරුවන්ගේ පැමිණිලි සහ ප්‍රසම්පාදනය අවලංගු කිරීම

ඉහත ප්‍රසම්පාදනයට අදාලව තාක්ෂණිකව ප්‍රතිචාර දක්වන ලද එකම ලංසුකරු වූන Senok Bhatia Coal සමාගම විසින් අභියාචනා කර තිබූ අතර එම අභියාචනය සලකා බැලීමෙන් අනතුරුව ප්‍රසම්පාදන කමිටුව විසින් ඉහත ප්‍රසම්පාදනය අවලංගු කිරීමටත් නැවත ලංසු කැඳවීමටත් 2009 ජූනි 26 දින තීරණයකර තිබුණි (ඇමුණුම 25).

මෙම ඡේදයට අදාල විගණන නිරීක්ෂණයන් ඡේද අංක 18.4 (ඈ) හි දක්වා ඇත.

## 12.2 දෙවන ප්‍රසම්පාදනය - 2009

### 12.2.1 ලංසු කැඳවීම

ඉහත සඳහන් පරිදි පළමුවන ප්‍රසම්පාදනය අවලංගු කිරීමෙන් අනතුරුව පළමු ප්‍රසම්පාදනය සඳහා පත්කර තිබුණු ප්‍රසම්පාදන කමිටුව විසින් 2009 ජූලි 13 දින ගන්නා ලද තීරණයක් පරිදි ලංකා ගල් අඟුරු සමාගම වර්ෂ 3 ක කාලයක් සඳහා ගල් අඟුරු මෙ.ටොන් 1,950,000± 20% (650,000± 20% x3) ක් මිලදී ගැනීමට 2009 ජූලි 27 දින පුවත්පත් දැන්වීමක් මගින් ලංසු කැඳවා තිබුණි.( ± 20% යනු ඇණවුම්කළ ප්‍රමාණය 20% දක්වා අඩු හෝ වැඩියෙන් සැපයීමට ඉඩකඩ ඇති බවයි) කෙසේවුවද මෙම ප්‍රසම්පාදනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම හෝ දැනුවත් කිරීම හෝ කර නොතිබුණි.

මෙම ප්‍රසම්පාදනයට අදාලව ලංසු ලියවිලි 86 **ක්** නිකුත් කර තිබුණු අතර ලැබී තිබුණු සංඛ්‍යාව 12 ක්විය. එම ලංසු 2009 ජූනි 02 දින විවෘත කර තිබුණි. තාක්ෂණික ඇගයීමේදී ප්‍රතිචාරාත්මක නොවූ සංඛ්‍යාව 09 කි. මෙම ප්‍රසම්පාදනයට අදාලව (Single stage- two envelop) 2009 සැප්තැම්බර් 10 දින තාක්ෂණික යෝජනාද 2009 ඔක්තෝබර් 16 දින මූල්‍ය යෝජනාද විවෘත කර තිබුණි

### 12.2.2 ලංසු ඇගැයීම

| ලංසුකරුගේ නම | මෙ.ටො. එකක් සඳහා ඉදිරිපත් කළ මිල (එ.ජ.ඩො) ( FOB) | මෙ.ටො. එකක් සඳහා ඇගයීම් මිල (එ.ජ.ඩො) (CIF) | අවම මිල මත හිමි ස්ථානය |
|---|---|---|---|
| Holcim Trading සමාගම | 60 | 87.99 | 01 |
| Coal of Africa සමාගම | 64 | 88.85 | 02 |
| Noble Resources International (Pvt) සමාගම | 73.53 | 89.81 | 03 |

2009 නොවැම්බර් 11 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශය මත ගල් අඟුරු මෙ.ටො 650,000 ± 20% ක් එකක් එ.ජ.ඩො. 60.00 බැගින් වූ FOB (නැව දක්වා) පදනමින් සාරානුකූලව ප්‍රතිචාර දක්වා තිබුණු අවම මිල ගණන් ඉදිරිපත් කළ Holcim Trading සමාගම වෙතින් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් 2009 දෙසැම්බර් 07 දින නිර්දේශ කර තිබුණි.

### 12.2.3 තේරී පත්වූ බව දැනුවත් කිරීම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 8.3 ප්‍රකාරව ඉහත ජේදයේ සඳහන් ප්‍රසම්පාදන කමිටු තීරණය සියලුම ලංසුකරුවන්ට 2009 දෙසැම්බර් 28 දින යවා තිබුණු අතර, අවශ්‍ය වන්නේ නම් සතියක් ඇතුලත ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය වෙත අභියාචනා කළ හැකි බව ද දන්වා තිබුණි.

### 12.2.4 ප්‍රසම්පාදන අභියාචනා

මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි අභියාචනා 03 ක් ලැබී තිබුණු අතර ඉහත 12.2.2 හි ඇතුලත් ලංසු කරුවකු වන Coal of Africa සමාගම අභියාචනා ඉදිරිපත් කර නොතිබිණි. ඉදිරිපත් කර තිබූ අභියාචනා 2010 ජනවාරි 13 දින අභියාචනා මණ්ඩලය වෙත යොමුකර තිබුණි.

| ලංසු කරු | අභියාචනය ඉදිරිපත්කළ දිනය |
|---|---|
| Noble Resources සමාගම | 2010.01.04 |
| Senok Bathiya සමාගම | 2010.01.04 |
| PT Wahara Mining සමාගම | 2010.01.07 |

### 12.2.5 අභියාචනා මණ්ඩල තීරණය සහ ලංසු ප්‍රදානය කිරීම

ඉහත සඳහන් අභියාචනා වලට අදාලව අභියාචනා මණ්ඩලයේ තීරණය ප්‍රමාද බැවින් අමාත්‍යවරයා විසින් Holcim Trading සමාගම තාක්ෂණිකව හා වාණිජමය වශයෙන් සාර්ථක ලංසුකරු ලෙස නිර්දේශකර 2010 පෙබරවාරි 03 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් අමාත්‍ය මණ්ඩල වෙත ඉදිරිපත් කර තිබුණි. කෙසේවුවද අභියාචනා මණ්ඩලයේ නිර්දේශය ලැබෙනතෙක් ගල් අඟුරු ප්‍රවාහනය පමණක් ලංකා නැව් සංස්ථාව මඟින් කළ යුතු බවට නියම කරමින් 2010 පෙබරවාරි 10 දින අමාත්‍ය මණ්ඩලය තීරණයකට එළඹ තිබුණි (ඇමුණුම 26).

අභියාචනා මණ්ඩලය විසින් Senok Bathiya හා PT Wahara Mining යන සමාගම් විසින් ඉදිරිපත් කර තිබුණු අභියාචනා, ප්‍රතික්ෂේප කර තිබුණි. Noble Resources සමාගම ඉදිරිපත් කළ අභියාචනයෙහි කරුණු සලකා බලා පහත දැක්වෙන කරුණුද හේතුවෙන්, Noble Resources සමාගම වෙත ලංසු ප්‍රදානය කරන ලෙස අභියාචනා මණ්ඩලය (ඇමුණුම 27) විසින් 2010 පෙබරවාරි 25 දින නිර්දේශ කර තිබුණි.

- එම සමාගම (Noble Resources)විසින් සපයනු ලබන ගල් අඟුරුවලින් නිපදවිය හැකි බලශක්තිය වැඩිවීම හේතුවෙන් Noble Resources සමාගමෙහි අඟුරුවල මුලු පිරිවැය එ.ජ.ඩො.58,376,500 වීමත් Holcim Trading සමාගමේ මුලු පිරිවැය එ.ජ.ඩො.62,124,019 වීමත් හේතුවෙන් එ.ජ.ඩො.3,747,519 ක අතිරේක පිරිවැයක් වලක්වාගත හැකිවීම
- තාක්ෂණිකමය හා වාණිජමය වශයෙන් සුදුසුකම් ලත් අඩුම මිල ඉදිරිපත් කළ ලංසුකරු වීම

### 12.2.6 අමාත්‍ය මණ්ඩල තීරණය

රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් (ඉහත 12.2.5 ඡේදයේ සඳහන්) අභියාචනා මණ්ඩලයේ තීරණයද සැලකිල්ලට ගෙන ගල් අඟුරු මෙ.ටො. 1 ක් එ.ජ.ඩො 70.45 කට වඩා තවදුරටත් අඩුකරගැනීමේ කොන්දේසියට යටත්ව Noble Resources සමාගමට කොන්ත්‍රාත්තුව පිරිනැමීම ගැන තම අමාත්‍යාංශයේ විරුද්ධත්වයක් නොමැතිබව 2010 මාර්තු 09 දින අමාත්‍ය මණ්ඩල ලේකම් වෙත අමාත්‍යවරයා මගින් කරුණු ඉදිරිපත්කර තිබුණි.

ඒ අනුව අමාත්‍ය මණ්ඩලය විසින් Noble Resources සමාගමෙහි මිල වන මෙ.ටො. 1 ක් එ.ජ.ඩො 70.45 කට වඩා තවදුරටත් අඩුකරගත යුතුය යන කොන්දේසිය මත Noble Resources සමාගම වෙත ලංසුව පිරිනැමීමට 2010 මාර්තු 24 දින තීරණය කර තිබුණි. ගල් අඟුරු මෙ.ටො. 1 ක් එ.ජ.ඩො 70.00 ක මිලකට සැපයීමට සැපයුම්කරු එකවී ඇති බවට අමාත්‍යවරයා විසින් 2010 අප්‍රේල් 03 දින අමාත්‍ය මණ්ඩලය වෙත සටහනක් ඉදිරිපත් කර තිබුණු අතර, ඒ අනුව Noble Resources සමාගම වෙතින් 2010 අප්‍රේල් සිට වසර 03 ක කාලයක් සඳහා (නොරොච්චෝලේ බලාගාරයේ පළමුවන අදියර) ගල් අඟුරු මෙ.ටො 1 ක් එ.ජ.ඩො 70.00 බැගින් වූ මූලික මිලකට මිලදී ගැනීමටත් ගල් අඟුරු ප්‍රවාහනය ලංකා නැව් සංස්ථාව වෙතින් සිදුකර ගැනීමටත් අමාත්‍ය මණ්ඩලය විසින් 2010 අප්‍රේල් 06 දින අනුමැතිය ලබා දී තිබුණි (ඇමුණුම 26 සහ ඇමුණුම 28).

### 12.2.7 කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම

ලංකා ගල් අඟුරු සමාගම 2010 අප්‍රේල් 20 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ ලිපිය Noble Resources සමාගම වෙත යවා තිබුණි. අනතුරුව 2011 පෙබරවාරි මාසයේ සිට 2014 පෙබරවාරි මාසය දක්වා කාලය සඳහා (ගල් අඟුරු සැපයිය යුතු කාල වකවානුව බලාගාරයේ මෙහෙයුම් කටයුතු (Commercial Operation) ආරම්භවන දිනසිට වර්ෂ 3 ක් ලෙස සලකා) ගල් අඟුරු මෙ.ටො 01 ක් එ.ජ.ඩො. 70.00 බැගින් වූ මූලික මිලකට මෙ.ටො 1,950,000 $\pm$ 20% ක් (වර්ෂකට මෙ.ටො.650,000 බැගින්) මිලදී ගැනීමට අදාලව ලංකා ගල් අඟුරු සමාගම, Noble Resources සමාගම සමඟ 2010 ජූලි 06 දින ද (ඇමුණුම 29), ලංකා ගල් අඟුරු සමාගම එම ප්‍රමාණයට අදාලව ලංකා නැව් සංස්ථාව සමඟ 2010 සැප්තැම්බර් 08 දින ද (ඇමුණුම 30) ගිවිසුම්වලට එළඹ තිබුණි.

## 12.3 තෙවන ප්‍රසම්පාදනය - 2011

### 12.3.1 ප්‍රසම්පාදනය සඳහා ලංසු කැඳවීම

මෙම ප්‍රසම්පාදනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ලංකා ගල් අඟුරු සමාගම විසින් බලාගාරය සඳහා වර්ෂ 3 ක කාලයකට ගල් අඟුරු මෙට්‍රික් ටොන් 4,500,000 ක් (1,500,000 x 3) CIF Jetty Basis මත මිලදී ගැනීමට 2011 දෙසැම්බර් 29 දින ලංසු කැඳවීම් පුවත්පත් දැන්වීම් (ඇමුණුම 31) මගින් සිදුකර තිබුණි.

### 12.3.2 ලංසු ක්‍රියාවලිය

මෙම ප්‍රසම්පාදනයට අදාලව ලංසු ලියකියවිලි ලබාගත හැකි අවසන් දිනය 2012 ජනවාරි 19 දින බවත් 2012 මාර්තු 28 දින ලංසු වසන බවත් ඉහත ඡේදයෙහි සඳහන් දැන්වීමෙහි සඳහන්කර තිබුණද ලංසු ලියකියවිලි දෙවතාවකදීද සංශෝධනයකර තිබුණු අතර ලංසු වැසීමේ  දිනය දෙවතාවකදීද දීර්ඝකරමින් සංශෝධන 4 ක් (ඇමුණුම 32) නිකුත් කර තිබුණි. පූර්ව ලංසු රැස්වීම 2012 ජනවාරි 26 දින ද, ගල් අඟුරු ලංසුකරුවන් අංගණය පරීක්ෂාව 2012 ජනවාරි 27 දින ද සිදුකර තිබුණි. තවද  තුන්වන ප්‍රසම්පාදනයේ දී 2012 අප්‍රේල් 26 දිනැති ප්‍රසම්පාදන කමිටුව රැස්වීමේදී (ඇමුණුම 33) 1987 අංක 13 දරන රාජ්‍ය කොන්ත්‍රාත්තු පනත (ඇමුණුම 33-A) යටතේ ලියාපදිංචිවීමේ අවශ්‍යතාවය පිළිබඳව සාකච්ඡාකර තිබුණු අතර එම පනත ප්‍රකාරව ලියාපදිංචිවීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් නීති උපදෙස් ලබාගෙන ඒ පිළිබඳව ප්‍රසම්පාදන කමිටුවට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසටත් ඒ අනුව ලංසු ලියවිලි සංශෝධනය කළයුතු බවටත් LCCට උපදෙස් දී තිබුණි.

මෙම ප්‍රසම්පාදනයට අදාලව ලංසු ලියවිලි 82 **ක්** නිකුත් කර තිබුණු අතර ලැබී තිබුණු සංඛ්‍යාව 12 ක්විය. එම ලංසු 2012 මැයි 16 දින විවෘත කර තිබුණි. තාක්ෂණික ඇගයීමේදී ප්‍රතිචාරාත්මක නොවූ සංඛ්‍යාව 06 කි.

මෙම ඡේදයට අදාල විගණන නිරීක්ෂණයන්  ඡේද අංක 18.2 (ඇ) හි දක්වා ඇත.

### 12.3.3 ලංසු ඇගැයීම

වාණිජ හා තාක්ෂණික වශයෙන් ප්‍රතිචාරාත්මක අවම මිල ගණන් ඉදිරිපත්කළ Taurian සමාගම වෙතින් ගල් අඟුරු මෙ.ටොන් 1 ක් එ.ජ.ඩො. 108.10 ක මිලකට CIF පදනම මත මිළදී ගැනීම සඳහා ටෙන්ඩරය ප්‍රදානය කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව (ඇමුණුම 34) විසින් 2012 ඔක්තෝබර් 25 දින ප්‍රසම්පාදන කමිටුව වෙත නිර්දේශ කර තිබුණි.

මෙම ප්‍රසම්පාදනය සඳහා ලංසු ඉදිරිපත් කරන ලද සමාගම්වල නියෝජිතයන් සහ දේශීය නියෝජිතයන් රාජ්‍ය කොන්ත්‍රාත්තු පනත යටතේ ලියාපදිංචි නොවී සිටීම සම්බන්ධව එක් ලංසුකරුවෙකු වන Coal & Oil සමාගම විරෝධතාවයක් (ඇමුණුම 34-A) ලංකා ගල් අඟුරු සමාගම වෙත 2012 ඔක්තෝබර් 25 දින ඉදිරිපත් කර තිබුණි. 2012 නොවැම්බර් 02 දිනැති ප්‍රසම්පාදන කමිටුව තීරණයෙන් නියමකර තිබුණු (ඇමුණුම 35) අනුව, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2012 නොවැම්බර් 07 දින එම අවශ්‍යතාවය පිළිබඳ නීතිපතිගෙන් මතය විමසා තිබූ (ඇමුණුම 36) අතර, ඒ අනුව, 1987 අංක 13 දරන රාජ්‍ය කොන්ත්‍රාත්තු පනතේ 8 වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි වීම අවශ්‍ය බව සඳහන් කරමින් 2012 දෙසැම්බර් 17 වන දින නීතිපතිගේ මතය (ඇමුණුම 37) ඉදිරිපත්කර තිබුණි. අනතුරුව ප්‍රසම්පාදන කමිටුව විසින් නැවත ඇගැයීම් (ඇමුණුම 38) සිදු කරන ලෙසට තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත 2012 දෙසැම්බර් 26 දින දන්වා තිබුණි.

**නැවත ඇගැයීම**

තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සියළුම ලංසු නැවත ඇගයීම් කොට තම වාර්තාව (ඇමුණුම 39) 2012 දෙසැම්බර් 31 දින ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර තිබුණි. අනතුරුව ප්‍රසම්පාදන කමිටුව (ඇමුණුම 40) විසින් පහත සඳහන් ලංසුකරුවන් තිදෙනා මූල්‍ය ඇගයීම් කිරීම සඳහා සුදුසුකම් සපුරා ඇති බව 2013 ජනවාරි 08 දින තීරණය කර තිබුණි.

- Noble Resources සමාගම
- Coal & Oil සමාගම
- Liberty Commodities සමාගම

ඒ අනුව වාණිජ හා තාක්ෂණික වශයෙන් සාරානුකූල ප්‍රතිචාර දක්වා ඇති අවම මිල ගණන් ඉදිරිපත්කළ ලංසුකරු වූ Liberty Commodities සමාගම වෙතින් ගල් අඟුරු මෙ.ටොන් 1 ක් එ.ජ.ඩො. 118.11 බැගින් (CIF) ගල් අඟුරු මෙට්‍රික් ටොන් 4,500,000 ක් මිළදී ගැනීම සඳහා වූ කොන්ත්‍රාත්තුව පිරිනැමීම ප්‍රසම්පාදන කමිටුව විසින් 2013 ජනවාරි 08 නිර්දේශ (ඇමුණුම 40) කර තිබුණි.

### 12.3.4 තේරී පත්වූ බව දැනුවත් කිරීම

අනතුරුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.3 ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටු තීරණය සියලුම ලංසුකරුවන්ට 2013 ජනවාරි 21 දින යවා තිබුණු අතර, අවශ්‍ය වන්නේ නම් සතියක් ඇතුලත ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය වෙත අභියාචනා කළ හැකි බව ද එහිදී සඳහන් කර තිබුණි.

### 12.3.5 ප්‍රසම්පාදන අභියාචනා

ඒ අනුව පහත සඳහන් ලංසුකරුවන් සිව්දෙනා 2013 ජනවාරි 24 දින ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය වෙත සිය අභියාචනා (ඇමුණුම 41) ඉදිරිපත් කර තිබුණි.

Noble Resources සමාගම
Coal & Oil සමාගම
Emirates Trading සමාගම
Taurian Iron & Steel සමාගම

ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය, Taurian Iron & Steel සමාගමේ අභියාචනය පිළිගෙන තිබුණු අතර අනෙකුත් ලංසුකරුවන් තිදෙනාගේ අභියාචනා ප්‍රතික්ෂේප කර තිබුණි. එමෙන්ම වාණිජ හා තාක්ෂණික වශයෙන් ප්‍රතිචාරාත්මක අවම මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරු වන Taurian සමාගමෙන් ගල් අඟුරු මෙ.ටො 1 ක් එ.ජ.ඩො.108.10 බැගින් මෙට්‍රික් ටොන් 4,500,000 ක් මිලදී ගැනීම සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමීමට 2013 මාර්තු 04 දින නිර්දේශ කර තිබුණු අතර මෙම ලංසුකරු ව්‍යාපෘතියේ පළමු අධියර සඳහා ගල් අඟුරු සැපයූ සැපයුම්කරු බවත් ඒ සම්බන්ධයෙන් කිසිඳු චෝදනාවක් නොමැතිබවත් සඳහන්කර තිබුණි (ඇමුණුම 42).

### 12.3.6 අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීම

ඉහත නිර්දේශ සලකා බැලීමෙන් අනතුරුව 2013 මැයි 03 දින එවකට විදුලිබල හා බලශක්ති අමාත්‍යවරිය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් (ඇමුණුම 43) ඉදිරිපත් කර තිබුණු අතර එහි පහත සඳහන් කරුණු දක්වා තිබුණි.

අභියාචක ලංසුකරුවූ Taurian සමාගම සම්බන්ධයෙන් විවිධ චෝදනා දෝෂාරෝපන තිබෙන බවත් උසස් තත්ත්වයේ ගල් අඟුරු තිබෙන බවට සහතික කරමින් බාල වර්ගයේ ගල් අඟුරු නැව් 3 ක් මගින් සපයා ඇති බවත් එම ගල් අඟුරු දැවීමෙන් ලංකා විදුලිබල මණ්ඩලයට රු.මිලියන 852.768 ක ඉන්ධන පාඩුවක් සිදුවී ඇති බවත් සඳහන්කර තිබුණි.

අනතුරුව පහත කරුණු සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් (ඇමුණුම 43) අනුමැතිය ඉල්ලා තිබුණි.

- ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ සම්බන්ධයෙන් නීතිපතිගේ නිෂ්කාශනය ලබාගැනිමෙන් අනතුරුව අභියාචනා මණ්ඩලයේ නිර්දේශ සහ අමාත්‍යාංශයේ හා තාක්ෂණික ඇගයීම් කමිටුව නිරීක්ෂණ සලකා බැලීමෙන් අනතුරුව ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ අනුමත කිරීම.
- වාණිජමය ප්‍රතිචාරාත්මක අඩුම ලංසුව ඉදිරිපත් කළ Liberty Commodities සමාගම සමඟ සාකච්ඡා කොට CIF මිල ගණන හැකිතාක් දුරට අඩුකර ගැනීමට ප්‍රසම්පාදන කමිටුවට බලය ලබාදීම
- අමාත්‍ය මණ්ඩල තීරණ ලබාදී මසක් ඇතුලත ප්‍රසම්පාදන කමිටුව, තාක්ෂණික ඇගයීම් කමිටුව සහ අභියාචනා මණ්ඩලයේ නිර්දේශවල නීත්‍යානුකූලතාවය පිළිබඳ නීතිපති මතය සහ මිල ගණන් අඩුකර ගැනීම සම්බන්ධයෙන් ගත් තීරණයන් අමාත්‍ය මණ්ඩලයට වාර්තා කිරීම.
- මෙම ගල් අඟුරු සැපයීම සඳහා ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ සමඟ නීතිපතිවරයා එකඟවන්නේනම් ගල් අඟුරු මෙ.ටොන් 1 ක් එ.ජ.ඩො.118.10 නොවැඩි සාකච්ඡාකර එකඟවූ CIF මිලට Liberty Commodities සමාගමින් මිලදී ගැනීම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට ලංකා ගල් අඟුරු සමාගමට බලය පැවරීම.

### 12.3.7 අමාත්‍ය මණ්ඩල තීරණය

ඒ අනුව අමාත්‍ය මණ්ඩල සංදේශය, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ (ඇමුණුම 44), උපාය මාර්ගික ව්‍යවසාය කළමනාකරණ නියෝජ්‍යාතනයේ අදහස් දැක්වීම (ඇමුණුම 45) සහ අභියාචනා මණ්ඩල නිර්දේශ (ඇමුණුම 42) සලකාබලා පහත සඳහන් පරිදි ක්‍රියා කරන ලෙස විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයාට 2013 මැයි 21 දින අමාත්‍ය මණ්ඩලය නියම කර තිබුණි(ඇමුණුම 46).

i. මෙම ටෙන්ඩරය අවලංගු කිරීම;

ii. පුත්තලම ගල්අඟුරු බලාගාරය සඳහා දිගුකාලීන පදනම මත බාධාවකින් තොරව ගල්අඟුරු සැපයුම තහවුරු කිරීම පිණිස මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණවල (ඇමුණුම 44) යෝජිත වැඩ පිළිවෙල අනුගමනය කිරීමේ හැකියාව සොයා බැලීම;

iii. ඉහත ii හි පරිදි අදාල වැඩ පිළිවෙල යොදනතෙක් එතෙක් කෙටි කාලීන හා මධ්‍ය කාලීන පදනමක් මත ගල් අඟුරු ප්‍රසම්පාදනය පිණිස අළුතින් ටෙන්ඩර් කැඳවීම; සහ

iv. අමාත්‍යාංශයේ මතයට අනුව මිල ගණන් වාසිදායක වන්නේ නම් ගල් අඟුරු හදිසි අවශ්‍යතා වෙතොත්, ඒවා වත්මන් සැපයුම්කරුගෙන් ප්‍රසම්පාදනය කිරීම පිණිස අමාත්‍යවරිය මාර්ගයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත යෝජනාවක් ඉදිරිපත් කිරීම.

## 12.4 සිවුවන ප්‍රසම්පාදනය 2012/ 2013

ඉහත 12.3.7 ඡේදයෙහි සඳහන් 2013 මැයි 21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය (ඇමුණුම 46) අනුව මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භකරන ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් 2013 මැයි 25 දින ලංකා ගල් අඟුරු සමාගමේ සහ ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිවරුන් වෙත දන්වා තිබුණි. තවද ලංකා ගල් අඟුරු සමාගමේ සභාපතිගේ 2013 මැයි 07 දිනැති ඉල්ලීමක් මත අමාත්‍යාංශය විසින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව අමතා තිබුණු 2013 ජූනි 11 දිනැති ලිපිය පරිදි 2013 ජූනි 26 දින නැවත තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කර තිබුණි.

### 12.4.1 ලංසු ක්‍රියාවලිය

(අ) ලක්විජය බලාගාරයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ 2013 ජූනි 24 දිනැති ලිපිය මගින් ඉදිරි වාරය සඳහා (2013 ඔක්තෝම්බර් සිට 2014 සැප්තැම්බර් දක්වා) අධියර 2 වෙනුවෙන් ගල් අඟුරු මෙ.ටො. 1,200,000 ක් (ඇමුණුම 47) අවශ්‍යබව ලංකා ගල් අඟුරු සමාගම වෙත දන්වා තිබුණි. අනතුරුව ලංකා ගල් අඟුරු සමාගම සමාගමේ සභාපතිවරයා විසින් 2013 ජූලි 04 දින අමාත්‍යාංශයේ පැවති රැස්වීමකට යොමුව දෙමින් නැවත විවෘත මිළ ගණන් කැඳවීමට කාලයක් ගතවන බැවින් බලාගාරයේ 2 අදියර සඳහා අවලංගු කරන ලද 3 වන ප්‍රසම්පාදනය සඳහා මිළ ගණන් ඉදිරිපත් කරන ලද සුදුසුකම් ලත් ලංසු කරුවන්ගෙන් මිළ ගණන් කැඳවීමට යෝජනා කර තිබුණි. තවද දැනට වලංගු කොන්ත්‍රාත්තුවේ කාලය ( පළමු ප්‍රසම්පාදනයේ) 2014 අප්‍රේල් මාසයෙන් අවසන් වන බැවින් නැවත ගල් අඟුරු මෙට්‍රික් ටොන් 2,250,000 ක් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවීමටත් ඒ සඳහා සැපයුම් කරුවන් දෙදෙනෙක් තෝරා ගැනීමටත් තීරණය කළ බව 2013 ජූලි 05 දින අමාත්‍යාංශ ලේකම්වරයාට දන්වා තිබුණි (ඇමුණුම 48).

(ආ) ලංකා ගල් අඟුරු සමාගමේ සභාපතිවරයා 2013 ජූලි 10 දින තාක්ෂණික ඇගයීම් කමිටුව සභාපතිවරයා වෙත කෙටුම්පත් ලංසු ලිය කියවිලි සමඟ ලිපියක් යවා තිබුණි. (ඇමුණුම 49) වර්තමාන කොන්ත්‍රාත්තුවේ කාලය 2014 අප්‍රේල් මාසයෙන් අවසන්වන බැවින් සමස්ථ බලාගාරය සඳහා වර්ෂ 3 ක කාලයක් සඳහා සැපයුම් කරුවන් දෙදෙනෙකු තෝරා ගැනීම සඳහා මීට පෙර ටෙන්ඩර් සඳහා ප්‍රතිචාර දැක්වූ ලංසු කරුවන්ගෙන් ලංසු කැඳවීම සඳහා පිළියෙල කරන ලද කෙටුම්පත් ලංසු ලියවිලි නිර්දේශකර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් 2013 ජූලි 10 දින ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර තිබුණි (ඇමුණුම 50).

(ඇ) තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් කරනලද නිර්දේශ 2013 ජූලි 12 දින ප්‍රසම්පාදන කමිටුව අනුමතකර තිබුණි. එදිනම ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයාද අමාත්‍යාංශ ලේකම් අමතා පහත යෝජනා දෙක ඉදිරිපත් කර තිබුණි (ඇමුණුම 51).

- අළුතින් ටෙන්ඩර් කැඳවීම - මෙහිදි අනවශ්‍ය ප්‍රමාදයක් සිදුවිය හැකි බැවින් මේ වන විටත් මීට පෙර ලංසු කැඳවීමේදි තාක්ෂණිකමය වශයෙන් සුදුකම් ලබා ඇති ලංසු

කරුවන්ගෙන් ගල් අඟුරු ලබා ගැනිම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු බව

- වර්තමාන සැපයුම්කරුගෙන් (Noble Resources සමාගමින්) හදිසි අවශ්‍යතාවය සඳහා මිලදී ගැනීම-කෙසේ වුවත් වර්තමාන සැපයුම්කරුගේ මිල අවලංගු කරන ලද ප්‍රසම්පාදන මිලට වඩා වැඩි හෙයින්, එම සැපයුම්කරු සමග මිල අඩු කරගැනිම සඳහා සාකච්ඡා කිරීමට ප්‍රසම්පාදන මණ්ඩලයට අනුමැතිය ලබාදීම

අනතුරුව ලංකා විදුලිබල මණ්ඩලයයේ සභාපතිවරයා 2013 ජූලි 26 දින අමාත්‍යාංශය වෙත ලිපියක් යවමින් සීමිත මිළ ගණන් යටතේ ලංසු කැඳවීම සඳහා 2013 ජූලි 25 දින ලංකා විදුලිබල මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාදී ඇතිබව දන්වා තිබුණි.

(ඈ) 2013 ජූලි 25 දින ප්‍රසම්පාදන කමිටුව විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතියට යටත්ව ලංකා ගල් අඟුරු සමාගමේ සභාපතිවරයා විසින් 2013 ජූලි 25 දින අමාත්‍යාංශය වෙත යැවූ ලැයිස්තුවේ සිටි ලංසුකරුවන් 19 දෙනාගෙන් (ඇමුණුම 52) ලංසු කැඳවීමට තීරණය කර තිබුණි. ඒ අනුව 2013 ජූලි 29 දින ලංසු කැඳවීමටත් 2013 අගෝස්තු 29 දින ලංසු විවෘත කිරීමටත් 2013 දෙසැම්බර් 27 දින ලංසු ප්‍රදානය කිරීමටත් තීරණය කර තිබුණි.

(ඉ) 2013 ජූලි 31 දින එවකට විෂයභාර අමාත්‍යවරිය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරමින් (ඇමුණුම 53) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 වගන්තිය ප්‍රකාරව සීමිත ජාත්‍යන්තර තරඟකාරී ලංසු ක්‍රියාවලිය යටතේ මීට පෙර ගල් අඟුරු ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී ලංසු ඉදිරිපත් කරන ලද ලංසුකරුවන් 19 දෙනාගෙන් ලංසු කැඳවීමට අනුමැතිය ඉල්ලා තිබුණි. එසේවුවද 2013 අගෝස්තු 22 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය (කෙටුම්පතෙහි)(ඇමුණුම 54) පහත පරිදි විය.

ලක්විජය බලාගාරයේ අදියර I, II සහ III සඳහාවන ගල් අඟුරු අවශ්‍යතාවය අඛණ්ඩව සැපයීම තහවුරු කිරීමට හැකිවනසේ දැනටමත් ගල් අඟුරු සපයනු ලබන සැපයුම්කරු සමඟ එළඹ ඇති ගිවිසුම පවත්නා කොන්දේසි සහ තත්ත්වයන් යටතේම තවත් මාස 6 කින් දීර්ඝ කිරීමටත් වාසි දායක සැපයුම් මූලාශ්‍ර හඳුනාගැනීම මගින් දිගුකාලීන

ගිවිසුම්වලට එළඹීම සඳහා විවෘත ජාත්‍යන්තර තරඟකාරී ක්‍රමයට සැපයුම්කරුවකු තෝරා ගැනීමට අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම.

අමාත්‍යවරිය විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත්කර තිබුණු 2013 ජූලි 31 දිනැති සංදේශය (ඇමුණුම 53) 2013 අගෝස්තු 27 දින ඉදිරිපත්කර තිබුණු වැඩිදුර සටහන (ඇමුණුම 55) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම් විසින් අමාත්‍ය මණ්ඩල ලේකම් අමතනලද 2013 අගෝස්තු 27 දිනැති ලිපිය සලකා බලා පහත සඳහන් තීරණයන් අමාත්‍ය මණ්ඩලය විසින් 2013 අගෝස්තු 29 දින අමාත්‍යාංශ ලේකම් වරයා වෙත ලබා දී තිබුණි.

පවත්නා ගල් අඟුරු සැපයුම් ගිවිසුමේ වලංගු කාලය දැනට ගල් අඟුරු සපයනු ලබන සැපයුම්කරු සමඟ සාකච්ඡාකර එළඹ ඇති ගිවිසුම යටතේම තවත් මාස 6 කින් දීර්ඝ කිරීම පිළිබඳව සැපයුම්කරු සමඟ සාකච්ඡා පවත්වන ලෙස අමාත්‍යාංශයට හා ප්‍රසම්පාදන කමිටුවට උපදෙස් දීමටත් ලෝක වෙළඳපොලේ ගල් අඟුරු මිල ගණන් පහළ යාමේ වාසිය අත්කර ගැනීම, ලක්විජය බලාගාරයේ අදියර I, II සහ III සඳහා අවශ්‍ය ගල් අඟුරු බාධාවකින් තොරව සැපයෙන බව තහවුරු කිරීම, මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් සති දෙකක් ඇතුලත ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත්කිරීම සහ ඉහත කී මාස හයක කාලය ඇතුලත 2014 ඔක්තෝබර් මාසයෙන් ආරම්භවන කාලය සඳහා සුදුසු සැපයුම්කරුවකු තෝරා ගැනීම පිණිස ආයෝජන මණ්ඩළය විමසා ජාත්‍යන්තර මිල ගණන් කැඳවා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.

### 12.4.2 හතර වන ප්‍රසම්පාදනයේ ලංසු ක්‍රියාවලිය අතහැරීම

ඉහත (ඉ) ජේදයේ සඳහන් 2013 අගෝස්තු 29 දිනැති අමාත්‍යමණ්ඩල තීරණය පරිදි ලංකා ගල් අඟුරු සමාගම විසින් හතර වන ප්‍රසම්පාදනයේ කටයුතු නතරකර තිබූ අතර මාස 6 ක කාලයක් සඳහාවන ගල් අඟුරු ඉහත 12.2.7 හි සඳහන් දෙවන ප්‍රසම්පාදනයේ සැපයුම් කරු වූ Noble Resources සමාගම වෙතින් ජේද අංක 14.1.2.හි දැක්වෙන පරිදි මිල දී ගෙන තිබුණි.

## 12.5 පස්වන ප්‍රසම්පාදනය 2014

### 12.5.1 ප්‍රසම්පාදනය සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාගැනීම

මෙම ප්‍රසම්පාදනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2013 අගෝස්තු 29 දින ලබා දී තිබුණි (ඇමුණුම 55).

### 12.5.2 ලංසු ක්‍රියාවලිය

ලංකා ගල් අඟුරු සමාගම විසින් වර්ෂ 4 ක කාලයක් තුල ගල් අඟුරු මෙ.ටොන් 2,250,000 ක් මිලදී ගැනීම සඳහා 2014 අප්‍රේල් 01 දින ප්‍රසම්පාදන කටයුතු ආරම්භකර තිබුණු අතර අදාල ලංසු ලබා ගැනීම දක්වා එකිනෙක අදියරයන් පහත පරිදි විය.

(i) 2014 අප්‍රේල් 17 දින පුවත්පත් දැන්වීමක් මඟින් ලංසු කැඳවා (ඇමුණුම 56) ලංසු වැසීමේ දිනය 2014 ජූනි 06 දින ලෙස දක්වා තිබුණි

(ii) 2014 මැයි 20 දින පැවති රැස්වීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පළමු සංශෝධනය වන ලංසු අවසන් කිරීමේ දිනය 2014 ජූනි 18 ලෙසත් ඇගයීම් නිර්නායකයන් (ලංසු ලියවිල්ලේ 2.3) සංශෝධනය කිරීමත් නිර්දේශකර තිබුණු අතර එකී සංශෝධනයන් 2014 මැයි 22 පැවති රැස්වීමේදී ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබුණි (ඇමුණුම 57).

(iii) 2014 ජූනි 02 පැවති රැස්වීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීම් නිර්නායකයන් සංශෝධනය කිරීමට නිරදේශ ඉදිරිපත් කර තිබුණු අතර 2014 ජූනි 06 දින පැවති රැස්වීමේදී ප්‍රසම්පාදන කමිටුව විසින් දෙවන සංශෝධනය අනුමත කර තිබුණි (ඇමුණුම 58).

(iv) 2014 ජූනි 20 දින පැවති රැස්වීමේදී ප්‍රසම්පාදන කමිටුව විසින් නැව් ගාස්තු පිළිබඳව සංශෝධනයන් (ඇමුණුම 59) සහ ලංසු වැසීමේ දිනය 2014 ජූලි 03 දක්වා දීර්ඝ කරමින් තුන්වන සංශෝධනය අනුමතකර තිබුණි.

(v) මෙම සංශෝධනය සියලු ලංසු කරුවන් වෙත 2014 ජූනි 24 දින යවන ලද බව ලංකා ගල් අඟුරු සමාගමේ සභාපතිවරයා සඳහන්කර තිබුණි.

(vi) ලංකා ගල් අඟුරු සමාගමේ සභාපතිවරයාගේ 2014 ජූනි 26 දිනැති ලිපියක් අනුව 4 වන සංශෝධනය (ඇමුණුම 60) (Sec-ii –ITB-Clause 5.4, Ref ITB.P-14) එදින යවා එදිනම ප්‍රසම්පාදන කමිටුව වෙත ආවරණ අනුමැතියට ඉදිරිපත්කර තිබුණි.

(vii) ප්‍රසම්පාදන කමිටුව විසින් 4 වන සංශෝධනය සඳහා 2014 ජූලි 04 දින ආවරණ අනුමැතිය ලබාදී (ඇමුණුම 61) තිබුණි.

මෙම ලංසු ක්‍රියාවලිය පිළිබඳ විගණන නිරීක්ෂණ ඡේද අංක 18.5 (ඇ) හි දැක්වේ.

**12.5.3 ලංසු ඇගයීම**

(අ) මෙම ප්‍රසම්පාදනයට අදාලව ලංසු ලියවිලි 42 **ක්** නිකුත් කර තිබුණු අතර ලැබී තිබුණු සංඛ්‍යාව 06 ක්විය. එම ලංසු 2014 ජූලි 03 දින විවෘත කර තිබුණි. තාක්ෂණික ඇගයීමේදී ප්‍රතිචාරාත්මක නොවූ සංඛ්‍යාව 05 කි.

(ආ) මෙම ලංසු ඇගයිම ක්‍රියාවලියට අදාල පියවරයන් සහ නිර්දේශයන් පහත පරිදි විය.

(i) 2014 ජූලි 04 දින පැවති රැස්වීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් Swiss Singapore සමාගම තාක්ෂණික හා වාණිජමය වශයෙන් ප්‍රතිචාරාත්මක ලංසු කරු බැවින් මුල්‍ය යෝජනා විවෘත කළ යුතු බවට නිර්දේශ කර තිබුණි. (ඇමුණුම 62)

(ii) 2014 ජූලි 08 දින පැවති රැස්වීමේදී ප්‍රසම්පාදන කමිටුව විසින් එය අනුමත කර තිබුණි. (ඇමුණුම 63)

(iii) ගල් අඟුරු මෙ.ටො 1 ක් එ.ජ.ඩො.77.70 ක අවම මිල ගණන් ඉදිරිපත් කළ Swiss Singapore සමාගම තාක්ෂණිකව හා මුල්‍යමය වශයෙන් ප්‍රතිචාරාත්මක ලංසු කරු වූ බැවින් එකී ලංසුකරු සමඟ මිල කතිකාවතක් සිදුකරන ලෙසටත් නිර්දේශකර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් 2014 ජූලි 09 දින ප්‍රසම්පාදන කමිටුව වෙත තම වාර්තාව යොමුකර තිබුණි (ඇමුණුම 64)

(iv) ප්‍රසම්පාදන කමිටුව විසින් තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශය අනුව කටයුතු කරමින් ගල් අඟුරු මෙ.ටො 1 ක් එ.ජ.ඩො.77.50 ක මිලකට මුළු වාර්ෂික ගල් අඟුරු අවශ්‍යතාවයෙන් සියයට 50 ක් වන මෙ.ටො. 1,125,000+/- 20% ක් මිලදී ගැනීම සඳහාත් එසේම ඉතිරි සියයට 50 සඳහා 2 වන සැපයුම්කරුවකු තෝරාගැනීම පිණිස නැවත ලංසු කැඳවීම සඳහාත් නිර්දේශකර තිබුණි. (ඇමුණුම 64-A)

### 12.5.4 තේරී පත්වූ බව දැනුවත් කිරීම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.3 ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටු තීරණය සියලුම ලංසුකරුවන්ට 2014 ජූලි 11 දින යවා තිබුණු අතර, අවශ්‍ය වන්නේ නම් සතියක් ඇතුලත ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය වෙත අභියාචනා කළ හැකි බව ද සඳහන් කර තිබුණි.

### 12.5.5 ප්‍රසම්පාදන අභියාචනා

පහත සඳහන් ලංසුකරුවන් 04 දෙනා විසින් ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය වෙත අභියාචනා (ඇමුණුම 65) ඉදිරිපත් කර තිබුණි.

| ලංසුකරු | අභියාචනා ඉදිරිපත් කරන ලද දිනය |
|---|---|
| J V Liberty Commodities සමාගම | 2014 ජූලි 17 |
| Trafigura PT සමාගම | 2014 ජූලි 21 |
| Noble Recourses සමාගම | 2014 ජූලි 18 |
| Kolma Group AG සමාගම | 2014 ජූලි 21 |

ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය විසින් 2014 අගෝස්තු 04 දිනැති සිය වාර්තාව (ඇමුණුම 66) ජනාධිපති ලේකම් මගින් 2014 අගෝස්තු 07 දින අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර තිබුණි.

### 12.5.6 අමාත්‍ය මණ්ඩල සංදේශය සහ ඒ සම්බන්ධ මුදල් අමාත්‍යාංශයේ නිරික්ෂණ

එවකට විදුලි බල සහ බලශක්ති අමාත්‍යාවරිය විසින් ඉහත සඳහන් 12.5.3 (ආ)ජේදයේ අනු අංක iii සහ iv හි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරිම සඳහා 2014 ජූලි 24 දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් (ඇමුණුම 67) ඉදිරිපත් කර තිබුණද පහත සඳහන් කරුණු හේතුවෙන් එයට එකග විය නොහැකි බව මුදල් අමාත්‍යවරයා අමාත්‍ය මණ්ඩලය වෙත දන්වා තිබුණි (ඇමුණුම 68). (ඒවන විට අභියාචනා මණ්ඩල තීරණය අමාත්‍ය මණ්ඩලය වෙත ලැබී නොතිබුණි).

(i) ගල් අඟුරු මෙ.ටො එකක් සඳහා එ.ජ.ඩො 77.50 ක් වන පාදක මිල මීට පෙර ගල් අඟුරු සපයන ලද සැපයුම්කරු වන Noble Recourses සමාගම විසින් මූලික වශයෙන් සපයන ලද පාදක මිල වන මෙ.ටො.එකක් සඳහා එ.ජ.ඩො 70 සමඟ සංසන්දනය කිරීමේදී ප්‍රමාණාත්මක වැඩිවීමක් පවතින බව

(ii) එසේම පසුගිය වර්ෂ 04 ක පමණ කාලයක දත්ත විශ්ලේෂණය කිරීමේදී ලෝක වෙළඳපලේ ගල් අඟුරු මිල ගණන් මේ වන විට සැලකිය යුතු මට්ටමකින් අඩුවී ඇති බව

(iii) එහි වාසිය ලබාගැනීම සඳහා සැපයුම්කරුවන් අතර තරඟකාරී මිල සංසන්දනයක් අවශ්‍ය වන බව

(iv) එසේම එක් මූල්‍යමය යෝජනාවක් පමණක් ඇගයීමට ලක්කිරීම තුළින් එ.ජ.ඩො මිලියන 340 ක් පමණ වටිනා මෙම ප්‍රසම්පාදනයේදී තරඟකාරී මිලක් ලබාගැනීමට ඇති අවස්ථාව අහිමි වන බව

**12.5.7 අමාත්‍ය මණ්ඩල තීරණය**

2014 අගෝස්තු 14 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමට (ඇමුණුම 69) 2014 අගෝස්තු 04 දිනැති ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩල වාර්තාව (ඇමුණුම 66) ඉදිරිපත්කර තිබුණු අතර එය ඊලඟ රැස්වීමේදී සාකච්ඡා කිරීමට කල්තබා තිබුණි. එම රැස්වීමේදීම මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය වරයාගේ නිරීක්ෂණ සලකා බලා අමාත්‍ය මණ්ඩලය විසින් පෙර සැපයුම්කරු වූ Noble Resources සමාගමෙන්ම විදුලිය අඛණ්ඩව සැපයීම සඳහා අත්‍යවශ්‍ය වන ගල් අඟුරු ප්‍රමාණය පෙර ගිවිසුමේ පැවති කොන්දේසි අනුවම මිලදී ගන්නා ලෙස රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නියෝගකර තිබුණි. එම නියෝගය අනුව ක්‍රියාකරන ලෙස රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2014 අගෝස්තු 19 දින ලංකා ගල් අඟුරු සමාගමේ සහ ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිවරුන් වෙත උපදෙස් දී තිබුණි.

අමාත්‍යවරිය විසින් ඉදිරිපත් කරන ලද 2014 ජූලි 24 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය (ඇමුණුම 67) හා විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අමාත්‍යවරිය මාර්ගයෙන් ඉදිරිපත්කර තිබුණු 2014 අගෝස්තු 13 දිනැති වාර්තාව (ඇමුණුම 69-A), මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය වරයාගේ නිරීක්ෂණ, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යවරයාගේ නිරීක්ෂණ(ඇමුණුම 69-B) සහ අභියාචනා මණ්ඩලයේ තීරණය සැලකිල්ලට ගෙන(ඇමුණුම 66) 05 වන ටෙන්ඩරය අවලංගු කිරීමටත් රජයේ අනුමත ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය අනුගමනය කරමින් ගල් අඟුරු මිලදී ගැනීම සඳහා ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීමටත් 2014 සැප්තැම්බර් 04 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණයකර තිබුණි(ඇමුණුම 70).

ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2014 සැප්තැම්බර් 22 පැවති තාක්ෂණික ඇගයීම් කමිටුව රැස්වීමේදී (ඇමුණුම 71)) විසින් ඉන්දුනීසියාවේ නිෂ්පාදිත ගල් අඟුරු මෙ.ටො එකක් එ.ජ.ඩො 77.50 ට (FOB)වඩා අඩු මිලකටද දකුණු අප්‍රිකාවේ නිෂ්පාදිත ගල් අඟුරු මෙ.ටො එකක් එ.ජ.ඩො 74.22 ට(FOB) වඩා අඩු මිලකටද Noble Resources සමාගමෙන් මිලදී ගැනීම සඳහා සාකච්ඡා කරන ලෙසට ප්‍රසම්පාදන කමිටුවට නිර්දේශ කරන තිබුණි. එසේවුවද, 2014 සැප්තැම්බර් 24 දින පැවති රැස්වීමේදී ප්‍රසම්පාදන කමිටුව විසින් පෙර සැපයුම්කරු වන Noble Resource සමාගමෙන් පහත සඳහන් පරිදි ගල් අඟුරු මෙ.ටො.මිලියන 1.97 ක් (FOB) පදනම මත 2015 සැප්තැම්බර් දක්වා මිලට ගැනීමට තීරණයකර තිබුණි (ඇමුණුම 72).

| **රට**<br>**---** | **මෙ.ටො. 01 ක**<br>FOB **මිල**<br>**(එ.ජ.ඩො.)**<br>**-----** | **ලංකා නැව් සංස්ථාව විසින්**<br>**ඉදිරිපත් කළ නැව් ගාස්තුව**<br>**(එ.ජ.ඩො.)**<br>**-------** | **මෙ.ටො. 01 ක**<br>**මිල (CIF)**<br>**(එ.ජ.ඩො.)**<br>**--------------** |
|---|---|---|---|
| ඉන්දුනීසියාව | 78.30 | 15.35 | 93.65 |
| රුසියාව | 77.25 | 18.58 | 95.83 |
| දකුණු අප්‍රිකාව | 75.50 | 18.63 | 94.13 |

මිල ගණන් ඇතුලත් කරමින් ටෙන්ඩරය පිරිනැමීමට අනුමැතිය ඉල්ලා අමාත්‍ය මණ්ඩල සංදේශයක් 2014.09.29 දින අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබුණි. අමාත්‍ය මණ්ඩලය විසින් මෙම සංදේශය සහ මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂන සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් සලකා බලා ඒ අනුව කටයුතු කිරීමට 2014.10.16 දින තීරණය කර තිබුණි.

ඉහත මිල ගණන් ඇතුලත් කරමින් ටෙන්ඩරය පිරිනැමීමට අනුමැතිය ඉල්ලා අමාත්‍ය මණ්ඩල සංදේශයක් 2014 සැප්තැම්බර් 29 දින ඉදිරිපත්කර තිබුණි. අමාත්‍ය මණ්ඩලය විසින් මෙම සංදේශය සහ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ නිරීක්ෂණ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් සලකා බලා ඒ අනුව කටයුතු කිරීමට 2014 ඔක්තෝබර් 16 දින තීරණයකර තිබුණි. එම තීරණය පරිදි ලංකා ගල් අඟුරු සමාගම ය ගල් අඟුරු මෙ.ටො. මිලියන 1.97 ක් (FOB) පදනම මත 2014 ඔක්තෝබර් සිට 2015 මාර්තු දක්වා සැපයීම සඳහා 2014 සැප්තැම්බර් 26 දින Noble Resources සමාගම සමඟ ගිවිසුමකට එළඹ තිබුණි (ඇමුණුම 139).

ඒ අනුව පහත සඳහන් පරිදි තාප ගල් අඟුරු මිලදීගෙන තිබුණි.

| **රට** | **මෙ.ටො. 01 ක මිල** | **මිලදී ගත් ප්‍රමාණය මෙ.ටො.** | **වටිනාකම * ඇ.ඩො.** |
|---|---|---|---|
| --- | ----- | ---------- | ----------- |
| ඉන්දුනීසියාව | 78.30 | 504,245 | 32,157,148 |
| රුසියාව | 77.25 | 1,122,742 | 72,280,081 |
| | | ------------- | -------------- |
| | | 1,626,987 | 104,437,229 |

*වටිනාකම ගණනය කර ඇත්තේ පාදක මිල මත අදාල නිර්නායක සඳහා ගැලපුම් කිරීමෙනි.

ඉහත නිර්දේශයෙන් අනතුරුව පෙර සැපයුම්කරුගෙන් ( Noble Resources සමාගමෙන්) මිලදී ගැනීමට අදාල විස්තර 14.1.4 ඡේදයේ දැක්වේ.

## 12.6 හයවන ප්‍රසම්පාදනය 2014/2015

### 12.6.1 ප්‍රසම්පාදනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම

2014 සැප්තැම්බර් 04 දින අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදි තිබුණු උපදෙස් (ඇමුණුම 73) මත ලංකා ගල් අඟුරු සමාගම විසින් වර්ෂ 04 ක කාලයක් තුල වර්ෂයකට ගල් අඟුරු මෙ.ටො. 2,250,000 බැගින් මිලදී ගැනීම සඳහා සැපයුම්කරුවන් දෙදෙනෙකු තෝරා ගැනීම සඳහා එදිනම ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණි.

මෙම ප්‍රසම්පාදන කටයුතු සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් 2014 සැප්තැම්බර් 19 දින තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව පත්කර තිබුණි (ඇමුණුම 73). අනතුරුව 2015 ජනවාරි 20 සහ 2015 සැප්තැම්බර් 23 යන දිනයන්හිදී නැවත ප්‍රසම්පාදන කමිටුව පත්කර තිබුණි.(ඇමුණුම 197)

### 12.6.2 ලංසු ක්‍රියාවලිය

**මෙම ප්‍රසම්පාදනය සඳහා පහත ක්‍රියාවලිය අනුගමනය කර තිබුණි**

(i) මුල්‍ය ඇගැයීමේදී නාවික ගාස්තු සහ බත්තල් ( Freight and Lightering) ගාස්තු සලකා බැලීම

(ii) ප්‍රවාහනය ලංකා නැව් සංස්ථාව මඟින් සිදු කර ගැනීම

(iii) රක්ෂණ කටයුතු ලංකා ගල් අඟුරු සමාගම ය විසින් සිදු කිරීම

(iv) මෙම ප්‍රම්පාදනය සඳහා එක් සැපයුම්කරුවකු තෝරාගැනීම වෙනුවට සැපයුම්කරුවන් දෙදෙනෙකු සියයට 50 බැගින් සැපයීමේ කොන්දේසිය මත තෝරා ගැනීම

2015 ජනවාරි 21 දින රැස්ව තිබුණු ප්‍රසම්පාදන කමිටුව (රැස්වීම් අංක 06) අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදුන් තීරණය පරිදි ප්‍රසම්පාදනය මගින් එකම මිලකට සැපයුම්කරුවන් දෙදෙනෙකු තෝරා ගැනීම අපහසු බව නිර්දේශ කර තිබීම මත අමාත්‍යවරයා විසින් 2015 ජනවාරි 23 දින ඉදිරිපත්කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් එක් සැපයුම්කරුවෙකු පමණක් තෝරා ගැනිමටත් ගිවිසුම් කාලය වර්ෂ 03කට අඩු කිරිමටත් නිර්දේශ කර තිබුණි. ඒ අනුව අමාත්‍ය මණ්ඩලය 2015 පෙබරවාරි 05 දින ඒ සඳහා අනුමැතිය ලබාදී තිබුණි (ඇමුණුම 74 ).

### 12.6.3 ලංසු කැඳවීමේ දිනයන් දීර්ඝ කිරීම

මෙම ප්‍රසම්පාදන වෙනුවෙන් ලංසු කැඳවීම 2014 නොවැම්බර් 27 දින පුවත්පත් දැන්වීමක් (ඇමුණුම 75) පලකර ලංකා ගල් අඟුරු සමාගමේ වෙබ් අඩවිය මඟින් ද ප්‍රසිද්ධ කර තිබුණි. ඒ අනුව ලංසු වැසීමේ දිනය 2015 ජනවාරි 09 වුවද එම දිනයන් පහත පරිදි ප්‍රසම්පාදන කමිටුව විසින් වරින්වර සංශෝධනය කර තිබුණි.

(i) 2015 ජනවාරි 07 දින ලංසු වැසීමේ දිනය 2015 ජනවාරි 28 දක්වා දීර්ඝ කිරීම (ඇමුණුම 76)

(ii) 2015 ජනවාරි 21 දින ලංසු වැසීමේ දිනය තවත් සති 08 කින් දීර්ඝ කිරීම (ඇමුණුම 77)

(iii) 2015 පෙබරවාරි 23 දින ලංසු වැසීමේ දිනය 2015 අප්‍රේල් 08 දින දක්වා තවත් සති 02 කින් දීර්ඝ කිරීම (ඇමුණුම 78)

### 12.6.4 පූර්ව ලංසු රැස්වීම්

මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා පූර්ව ලංසු රැස්වීම් දෙකක් පවත්වා තිබුණු අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

#### 12.6.4.1. ප්‍රථම පූර්ව රැස්වීම - 2014 දෙසැම්බර් 17

(i) ලංසු ලේඛණ ලබා ගත් ලංසුකරුවන් 16 දෙනෙකු එයට සහභාගීවී තිබූ අතර, එයින් 6 දෙනෙකු විසින් ලංසු ලේඛනවල ඇතුලත්ව තිබූ ඇතැම් කරුණු පිළිබඳව ලිඛිතව විමසීම් සිදුකර තිබුණි. මෙහිදී ගල් අඟුරු කැටයක තිබිය යුතු ප්‍රමාණය (විශාලත්වය) පිළිබඳ නිර්ණායකය මත අයකරන අධිභාරය හා වෙනත් තාක්ෂණික පිරිවිතරයන් පිළිබඳවද විමසා තිබුණි (ඇමුණුම 79).

(ii) ලංසු ලේඛනවල ඇතුලත් ඉහත සඳහන් කොන්දේසි තවදුරටත් එසේම පවතින බවට තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව එහිදී තීරණය කර තිබුණු අතර ලංකා ගල් අඟුරු සමාගම ඒ බව සියළු විභව ලංසුකරුවන්ට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.14 (ඇ) ප්‍රකාරව දන්වා තිබුණි (ඇමුණුම 80).

#### 12.6.4.2. දෙවන පූර්ව රැස්වීම - 2015 මාර්තු 18

(i) Swiss Singapore සමාගම ද ඇතුළුව ලංසු ලේඛණ ලබා ගත් ලංසුකරුවන් 44 දෙනෙකු මෙම රැස්වීමට සහභාගී වී ඇති අතර, ඔවුන් විසින් ලංසු ලේඛනවල ඇතුලත්ව තිබූ ඇතැම් තාක්ෂණික කරුණු පිළිබඳව විමසීම් සිදුකර තිබුණි.තවද නිව් කාසල් දර්ශකය වෙනුවට ඒපීඅයි- 4 දර්ශකය මත පදනම් වෙමින් මිල ගණන් ඉදිරිපත් කළ හැකිදැයි එහිදී විමසා තිබුණි. එලෙස කොන්දේසි වෙනස් කළ නොහැකි බව තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි.

(ii) ඉහත රැස්වීමේදී ගන්නාලද තීරණ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.14 (ඇ) ප්‍රකාරව ලංකා ගල් අඟුරු සමාගම විභව ලංසුකරුවන් වෙත දන්වා තිබුණු අතර අවශ්‍යා අවස්ථාවන් හිදි ලංසු ලියවිලි සංශෝධනය කරද තිබුණි (ඇමුණුම 80 සහ 81).

. මෙම ඡේදයට අදාල විගණන නිරීක්ෂණ ඡේද අංක 18.3 (ඇ) හි දක්වා ඇත.

### 12.6.5 ලංසු ලේඛන සංශෝධනය

මෙම ප්‍රසම්පාදනයේදී ලංසු ලේඛනවල වරින්වර වෙනස්කම් සිදුකිරීමට, කාලය දීර්ඝ කිරීමට, Volatile Matter ප්‍රතික්ෂේපිත වැඩි අගය සියයට 36 සිට 39.9 දක්වා වැඩි කිරීමට සහ පළමු සහ දෙවන පූර්ව ලංසු රැස්වීමේදී හඳුනාගත් වෙනස්කම් පැහැදිලි කිරීමට හය වතාවක් ලංසු ලේඛනය සංශෝධනය කිරීම ලංසු වැසීමේ දිනය මාස 03 කින් ද කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම මාස 08 කින් ද ප්‍රමාද වීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි (ඇමුණුම 82 ).

මෙම ඡේදයට අදාල විගණන නිරීක්ෂණ ඡේද අංක 18.2 (ඉ) හි දක්වා ඇත.

### 12.6.6 ලංසු ඇගයීම

(අ) 2015 අප්‍රේල් 08 දින ලංසු භාරගැනීම අවසන් කර තිබුණු අතර, ලංසුකරුවන් 08 දෙනෙකුගෙන් ලංසු ලැබී තිබුණි.

තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ඇගයීමේ ක්‍රියාවලියේ පළමු අදියරේ දී 2015 අප්‍රේල් 10,12 සහ 16 යන දිනයන්හීදි ලංසුකරුවන්ගේ තාක්ෂණික යෝජනා පරීක්ෂා කර, ලංසුකරුවන් තිදෙනෙකුගේ ලංසු ලියවිලි තුල ප්‍රමාණාත්මක බැහැරවීම් (පිළිගතහැකි ලංසු ආරක්ෂණයන් සැපයීමට නොහැකිවීම) තිබූ බැවින් ඇගැයීමෙන් ඉවත් කර තිබුණි. ලංසු ඇගැයීම් ක්‍රියාවලියේ දෙවන අදියරේ දී ලංසු ලේඛන තාක්ෂණික හා වාණිජමය ලෙස සුදුසුකම් ලබා නොතිබීම (පසුගිය වසර 3 ක ගල් අඟුරු සැපයීම සනාථ කිරීමට ඉදිරිපත්කළ තොරතුරුවලට අදාල ලේඛනවල මුල්පිටපත් වෙනුවට ඡායා පිටපත් ලබාදී තිබීම) මත එක් ලංසුවක් ප්‍රතික්ෂේපකර තිබුණි.

(ආ) ඉතිරි සමාගම් 04 තාක්ෂණික හා වාණිජමය ලෙස ප්‍රතිචාරාත්මක ලංසුකරුවන් බැවින් ඒවායේ මූල්‍ය යෝජනා ඇගැයීමට නිර්දේශකරමින් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සිය වාර්තාව 2015 මැයි 26 දින ප්‍රසම්පාදන කමිටුව වෙත වාර්තාව (ඇමුණුම 83 ) ඉදිරිපත්කර තිබුණි.

(ඇ) ඉහත (අ) හි සඳහන් පරිදි පිළිගත හැකි ලංසු ආරක්ෂණයන් සැපයීමට නොහැකිවීම මත ප්‍රතික්ෂේප වූ ලංසුකරුවන් තිදෙනා පිළිබඳව නැවතත් සලකා බලන ලද ප්‍රසම්පාදන

කමිටුව මේ පිළිබඳව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීමටත් එමඟින් නියෝගයක් ලබාගැනීමටත් 2015 අප්‍රේල් 28 දින තීරණය කර තිබුණි (ඇමුණුම 84 ). ඒ අනුව අමාත්‍යවරයා විසින් 2015 මැයි 05 දින ඉදිරිපත්කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශය (ඇමුණුම 85 ) ප්‍රකාරව, එම තිදෙනාව ද සුදුසුකම් ලැබූවන් ලෙස සලකා ඇගැයීමට ලක් කිරීමට 2015 මැයි 20 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය (ඇමුණුම 86 ) ලබා දී තිබුණි.

(ඈ) එසේවුවද, ඉහත (ඇ) ඡේදයේ සඳහන් ලංසුකරුවන් තිදෙනාගෙන් එක් අයකු දෙවන අවස්ථාවේදී සිය ලංසු ආරක්ෂණය නිසි ආකාරව ඉදිරිපත් කර නොතිබූ හෙයින්, අවසාන වශයෙන් පහත පරිදි ලංසු කරුවන් 06 දෙනෙකු ඇගයීමට සුදුසුකම් ලබා තිබුණි.

| | ලංසුකරුගේ නම | | ඇගැයිම් මිල එ.ජ.ඩො. | අවම මිල මත හිමි ස්ථානය |
|---|---|---|---|---|
| i. | Noble Resources සමාගම | - | 90.219 | 1 |
| ii. | Suek AG සමාගම | - | 90.645 | 2 |
| iii. | Trafigura PTE සමාගම | - | 101.968 | 3 |
| iv. | Adani Global සමාගම | - | 103.108 | 4 |
| v. | Swiss Singapore සමාගම | - | 103.782 | 5 |
| vi. | Liberty Commodities සමාගම | - | 113.604 | 6 |

(ඉ) 2015 ජූනි 13 දින තාක්ෂණික ඇගයීම් කමිටුව ඉදිරිපත්කළ වාර්තාවෙන් (වාර්තා අංක 15) (ඇමුණුම 87 ) ලංසුකරුවන්ගෙන් ලද මිල ගණන් නිසිපරිදි ඇගැයීමට ලක්කර, ඉහත පරිදි ස්ථානගත කර තිබුණි. ඒ අනුව, අඩුම ඇගැයිම් මිල (Evaluated Price) ඉදිරිපත් කර ඇති සමාගම ලෙස Noble Resources සමාගම පත් වී තිබුණි. තවද එම සමාගම ගල් අඟුරු ප්‍රවාහනය සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් ලංකා නැව් සංස්ථාව විසින් ගල් අඟුරු ප්‍රවාහනය සඳහා ඉදිරිපත් කරන මිල ගණන් සමඟ සැසඳිය යුතු බවත් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් එම වාර්තාවෙන්ම ප්‍රසම්පාදන කමිටුව වෙත යෝජනාකර තිබුණි.

(ඊ) 2015 ජූනි 15 දින රැස්ව තිබුණු ප්‍රසම්පාදන කමිටුව ඉහත සඳහන් ඇගැයීමට අදාලව පහත නිර්දේශයන් කර තිබුණි (ඇමුණුම 88 ).

(i) එක් එක් ලංසුකරුට විසින් ඉදිරිපත්කළ මිල ඇගයීම් මිල දක්වා වෙනස් වූ ආකාරය වෙන් වෙන් වශයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව වෙතින් වාර්තාවක් ලබා ගැනීම සුදුසු බව

(ii) රාජ්‍ය කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි වී නොමැති ලංසුකරුවන්ගේ නීතිමය තත්ත්වය පිළිබඳව විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශ මඟින් නීතිපති දෙපාර්තමේන්තුවේ මතයක් ලබාගැනීම සුදුසු බව

(iii) Noble Resources සමාගම විසින් ඉදිරිපත් කර ඇති තොගයක ප්‍රමාණය (එක් නැව් වාරයක් සඳහා) ලංසු ලියවිලිවල ඇතුලත් ප්‍රමාණය සමඟ සලකා බැලීමේදී ප්‍රමාණවත් වැඩිවීමක් පෙන්නුම් කරන බව (ලංසු ලියවිලි වල තොගයක ප්‍රමාණය මෙ.ටො. 65,000 වන අතර, ලංසුකරුගේ ලියවිලි වල තොගයක ප්‍රමාණය මෙ.ටො. 100,000 වේ)

(iv) එම නිසා ප්‍රවාහනය සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමේදි ලංසුකරුට වැඩි වාසියත් සිදුවන බව

(v) එබැවින් ලංකා නැව් සංස්ථාව ය සමඟ ගල් අඟුරු ප්‍රවාහනය සඳහා මිල ගණන් සැසඳීම අවශ්‍ය බැවින් ලංසු ලියවිලිවල සඳහන් පරිදි ගල් අඟුරු තොග සැපයීම සඳහා Noble Resources සමාගම එකඟ වන්නේ දැයි විමසීම වඩා සුදුසු බව

(vi) Adani Globle සමාගම සිය පැටවුම් වරාය නිශ්චිතව නම්කර නොමැති බැවින්, එම ඉදිරිපත් කොට ඇති ප්‍රවාහන මිල ගණන් ලංකා නැව් සංස්ථාව මිල ගණන් සමඟ සැසඳීමේ හැකියාවක් නොමැති බව

(vii) තාක්ෂණික ඇගයීම් කමිටුව වාර්තාව මඟින් ණය පොලිය ගැලපීමේදී මුළු වර්ෂයටම අදාල වන පොලිය ගලපා ඇති බවත් සත්‍ය වශයෙන්ම ගැලපිය යුත්තේ දින 30 ණය පොලී රහිත කාලයක් සහ ඉන් පසු දින 60 දක්වා පොලී සහිත බව

(viii) ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව වාර්තාව නැවත සකස් කර ලබාගත යුතු බව

(ix) එක් නැව් වාරයක් ( Per shipment) සඳහා නැවක පැටවිය හැකි ගල් අඟුරු ප්‍රමාණය පිළිබඳ Noble Resources මඟින් පැහැදිලි කරවා ගතයුතු බව

(උ) ප්‍රසම්පාදන කමිටුව විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් නිර්දේශ සලකා බලා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් 2015 ජූනි 17 දින තාක්ෂණික ඇගයීම් කමිටුව-15A (ඇමුණුම 89) වාර්තාව ඉදිරිපත්කර තිබුණි.

එම වාර්තාව අනුව,

- පොලි ගැලපීම් සිදුකර තිබුණි
- මිල ඇගැයිමේදී කළ ගණනය කිරීම් එක් එක් අයිතම වෙනුවෙන් වෙන වෙනම ගැලපීම් කර තිබුණි.

එම වාර්තාව මඟින් Noble Resources සමාගම අඩුම ඇගැයිම් මිලක් ඉදිරිපත් කළ (at the jatty of the plant) ලංසුකරු ලෙස නම් කරමින් සිය නිර්දේශ ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර තිබුණි.

(ඌ) අඩුම මිලක් ඉදිරිපත් කළ ලංසුකරු ලෙස තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශකර තිබුණු Noble Resources සමාගමට තොගයක ගෙන එන ගල් අඟුරු ප්‍රමාණය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ආරාධනාකරන ලද බවත් එම සමාගම තොගයක් මෙ.ටො. 100,000 බැගින් භාරදීමට බලාපොරොත්තුවන බව තවදුරටත් සඳහන් කළ බවත් 2015 ජූනි 17 දින පැවති ප්‍රසම්පාදන කමිටුව වාර්තාවේ (13 වන රැස්වීම) දක්වා තිබුණි (ඇමුණුම 90).

(එ) 2015 ජූනි 18 Noble Resources සමාගම විසින් ලංකා ගල් අඟුරු සමාගමට ලිපියක් (ඇමුණුම 91) එවමින් ප්‍රසම්පාදන කමිටුව ආරාධනා කළ පරිදි 2015 ජූනි 17 දින පැවති රැස්වීමට තම සමාගම සහභාගිවූ බවත් එම රැස්වීමේදී තවදුරටත් වට්ටම් ලබාදිය හැකිද යන්න විමසූ බවත්, ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීමක් බැවින් එහිදී තමන් විෂ්මයට පත්වූ බවත්, ඉල්ලා සිටි පරිදි වට්ටම් ලබාදීමට අකමැති වූ බවත්, තමන් විසින් තරඟකාරී මිලක් ඉදිරිපත් කර ඇති බවත් සඳහන් කර තිබුණි. නමුත් එම කරුණු (මිල අඩුකර ගැනීම) සම්බන්ධයෙන් සාකච්ඡාකළ බවට 2015 ජූනි 17 දින පැවති ප්‍රසම්පාදන කමිටුව රැස්වීමේදී (ඇමුණුම 91) සඳහන්කර නොතිබුණි. අනතුරුව 2015 ජූලි 03 දින පැවති ප්‍රසම්පාදන කමිටුව රැස්වීම් වාර්තාවේද එලෙස මිල කතිකාවතක් පැවැත්වූ බව සඳහන්කර නොතිබුණි (ඇමුණුම 151). එවැනි මිල කතිකාවතක් නොපැවැත්වූවානම් ප්‍රසම්පාදන

කමිටුව විසින් 2015 ජුනි 18 ලිපියට පිළිතුරක් ලෙස Noble Resources සමාගම වෙත ඒ බව දැනුම්දිය යුතුව තිබුණද ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොතිබුණි.

මෙම ඡේදයට අදාල විගණන නිරීක්ෂණ ඡේද අංක 18.3 (අ) හි දක්වා ඇත.

(ඒ) ඉහත 12.6.6 ඡේදයේ (ඇ) හි දක්වා ඇති පරිදි v වන ස්ථානය ලබා සිටි, ලංසුකරු වූ Swiss Singapore සමාගම විසින් 2015 ජුනි 29 දිනැති ලිපියක් මගින් ප්‍රසම්පාදන කමිටුව වෙත පහත සඳහන් කරුණු දන්වා තිබුණි. (ඇමුණුම 92)

(i) ලංසු විවෘත කිරීමේ කමිටුව විසින් එම අවස්ථාවේ ලංසුකරුවන් ඉදිරිපත් කළ ලංසු මිල පමණක් හෙළිදරව්කර තිබීම හේතුවෙන් තම ස්ථානය දැනගැනීමට ලංසුකරුවන්ට හැකියාවක් නොතිබූ බව

(ii) ඇගැයීමේ ක්‍රියාවලියෙහි එක් එක් ලංසුකරුවන් වෙත අධිභාර කිරීමේදී ගල් අඟුරුවල කැටවල ප්‍රමාණය අඩු අගය සහ වැඩි අගය "0" ලෙස අගය කිරීම නිසා සියළු ලංසුකරුවන්ට තම ලංසු තමාට වාසිදායක ලෙස වෙනස් කිරීමට ඉඩකඩ සලසා ඇති බව.

(iii) ගල් අඟුරු යනු ස්වභාවික සම්පතක් බැවින් ගල් අඟුරු කැටවල අඩු අගය සහ වැඩි අගය මැනීමේ ක්‍රමවේදයන් "0" ලෙස ගැනීම නිසි ක්‍රමවේදයක් නොවීම.

(iv) ලංකා ගල් අඟුරු සමාගම සතුව ගල් අඟුරු ආනයනය පිළිබඳ වසර කිහිපයක සිට පවතින අත්දැකීම් මත මෙම ගල් අඟුරුවල ප්‍රමාණය පිළිබඳ අගය "0" ලෙස ගැනීම නිවැරදිදැයි ඔවුන්ටම සලකා බැලිය හැකි බව.

(v) ගල් අඟුරු දහනයේදී ඒවා ප්‍රමාණයෙන් 0.06 mm දක්වා කුඩු කරන බැවින් ඒවා කුඩු කිරීමට වෙනමම බලයක් සඳහා වියදම් දැරිය යුතු බව.

(vi) ලංකා ගල් අඟුරු සමාගම විසින් තෝරා ගන්නා ලංසුකරුට ගල් අඟුරු විශාල කැට වශයෙන් තිබියදී වුව අධිභාර සඳහා ගැලපීම් සිදුකිරීම නිසා සුදුසුකම් ලැබිය හැකි බව.

(vii) එසේම ගල් අඟුරුවල ප්‍රමාණය (02 mm සහ 50 mm) පිළිබඳ වැඩි අගය සහ අඩු අගය මැනීමේ ක්‍රමයක් ලංසු ලේඛනයෙහි නොමැති බව.

ලංසු ලේඛනයේ 5.5 වගන්තිය යටත්ව 5.2 අතුරු වගන්තිය අනුව, ලංසු විවෘත කළ අවස්ථාවේ සිට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන අවස්ථාව දක්වා ලංසු පිළිබඳව වන ඕනෑම

කාරණයක් සම්බන්ධයෙන් කිසිම ලංසු මිල ගණන් ඉදිරිපත් කරන්නෙකු ලංකා ගල් අඟුරු සමාගම ය හෝ එහි ලංසු පිළිබඳවද කටයුතු කරන වෙනත් තැනැත්තෙකු හෝ සංවිධානයක් සමඟ සම්බන්ධතාවයක් නොපැවැත්විය යුතුය. එසේම ලංසු ඇගැයීම්වලට, ලංසු සැසඳීම්වලට හෝ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ තීරණවලට බලපෑම් කිරීමට කිසියම් ලංසු මිල ගණන් ඉදිරිපත් කරන්නෙකු විසින් සිදු කරනු ලබන ඕනෑම උත්සාහයක ප්‍රතිඵලය වනුයේ එම ලංසුව ප්‍රතික්ෂේප වීමය.

(ඔ) ගල් අඟුරු සමාගමෙන් ලද 2015 ජූනි 25 දිනැති ලිපිය (ඇමුණුම 93), 2015 ජූනි 26 දිනැති Suek AG සමාගම වෙතින් ලද ඊ-මේල් පණිවුඩය (ඇමුණුම 94) සහ 2015 ජූනි 29 දිනැති Swiss Singapore සමාගමින් ලද ලිපිය (ඇමුණුම 92) 2015 ජූනි 29 දින රැස්වූ ප්‍රසම්පාදන කමිටුව විසින් සලකා බලා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත පහත උපදෙස් පරිදි මූල්‍ය ඇගයීම නැවත සිදුකරන ලෙස නිර්දේශකර ඇත. (ඇමුණුම 95)

- (i) ප්‍රසම්පාදන කමිටුව වාර්තාවේ විස්තර කර ඇති පරිදි ලැබීඇති සියලුම ලංසු නැවත ඇගැයීම් කරන ලෙස
- (ii) 2015 ජූනි 15 දින පැවැත්වූ ප්‍රසම්පාදන කමිටුව රැස්වීමේදී සඳහන්කර ඇති පරිදි නිවැරදිව පොලී අනුපාතය යොදා ගනිමින් ඇගයීම් සිදුකරන ලෙස

මෙම ඡේදයට අදාල විගණන නිරීක්ෂණ ඡේද අංක 18.3 (ආ) හි දක්වා ඇත.

(ඕ) 2015 ජූලි 03 දින තාක්ෂණික ඇගයීම් කමිටුව රැස්ව තිබුණු අතර එහිදි (තාක්ෂණික ඇගයීම් කමිටුව වාර්තා අංක - 16) (ඇමුණුම 96) ප්‍රසම්පාදන කමිටුව විසින් 2015 ජූනි 29 දින ලබාදුන් නියෝගය පරිදි මිල ඇගයීම සිදුකරන ලද බවත් අනිකුත් නිර්නායක ඇගයීම ලංසු ලේඛණයේ සඳහන් නියමයන් පරිදි සිදු කළ බවත් සඳහන් කරමින් Swiss Singapore සමාගම අඩුම ඇගැයීම් මිලක් ඉදිරිපත් කළ ලංසුකරු ලෙස නිර්දේශ කර සිය වාර්තාව ඉදිරිපත්කර තිබුණි.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.10 (ඇමුණුම 97) පරිදි “ලංසු කැඳවීමේ ලේඛනවල සඳහන් උපමාන සහ ක්‍රමවේදයට අනුව, පළමුවෙන්ම ලංසු සූක්ෂම අන්දමින් ඇගයීමට භාජනය කළ යුතු අතර, එසේ අගයන ලද ලංසු සැසඳීමෙන්, අවම මිලක් සහිත සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලංසුව කවරේදැයි තීරණය කළ යුතුය”. එසේ වුවද ඉහත

ඇගයීමේදී ලංසු ලියකියවිලිවල විශේෂයෙන් දක්වා ඇති නිර්නායකයන් සහ ක්‍රමවේදයන්ට පටහැනිව වෙනත් ක්‍රමවේද භාවිතා කරමින් ලංසු ඇගැයීම සිදුකර තිබුණි.

තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.20 (ආ) අනුව "ඇගැයිම සිදුකරන අතරතුර අනාවරණය කරනලද උපමාන වෙනස් කිරිම හෝ අතිරේක උපමාන ඇතුලත් කිරීම නොකළ යුතුය" (ඇමුණුම 98).

මෙම ඡේදයට අදාල විගණන නිරීක්ෂණ ඡේද අංක 18.3 (ඇ) හි දක්වා ඇත.

(ක) තාක්ෂණික ඇගයීම් කමිටුව වාර්තා අංක 16 මගින් නිර්දේශ කර තිබූ පරිදි ගල් අඟුරු මෙ.ටො. 1 ක් සඳහා එ.ජ.ඩො. 68.72 ක් බැගින් වූ පදනම් මිලකට (නිව් කාර්සල් දර්ශකය අනුව පදනම් වෙමින්) ගල් අඟුරු මෙ.ටො.මිලියන 6.75 $\pm$ 20% ක් (වර්ෂ 03 ක් සඳහා අවශ්‍ය ප්‍රමාණය) සැපයීම සඳහා මෙම ටෙන්ඩරය Swiss Singapore සමාගමට පිරිනැමීම සුදුසු බව 2015 ජූලි 03 දින ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබුණි. (ඇමුණුම 99)

ටෙන්ඩර් ලියකියවිලි වල ගල් අඟුරු කැටවල ප්‍රමාණය නිර්නායකයට අදාල පිරිවිතරයන් නිශ්චිත ලෙස සඳහන් කර නොතිබූ බවත්, එහි ගල්අඟුරු කැටවල ප්‍රමාණය මනින ක්‍රමවේදය හා ප්‍රමිතිය ද සඳහන් කොට නොතිබූ බවත්, (TBN) ලෙස සඳහන් කර තිබුනේ එම ක්‍රමවේදය "පසුව දැනුම් දෙනු ලැබේ" යන්න බවත් විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අංක PE/TEN/ප්‍රසම්පාදන කමිටුව/55/2014/38 දරන දින රහිතව මා ඇමතූ ලිපිය මගින් දන්වා තිබුණි. තවද, ටෙන්ඩර් විවෘත කරන දින දක්වාම ගල්අඟුරු කැටවල ප්‍රමාණය මනින ක්‍රමවේදය ලංසුකරුවන්ට දන්වා නොතිබුණු බවද එහි දක්වා තිබුණි.

තවද 2015 පෙබරවාරි 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ගල් අඟුරු ප්‍රවාහනය මෙ.ටො. 1 ක් සඳහා එ.ජ.ඩො.13.75 ක් බැගින් ලංකා නැව් සංස්ථාව මගින් ප්‍රවාහනයකරවා ගැනීමටත්, එම සමාගම එම මිලට එකඟ නොවේ නම් ප්‍රවාහන කොන්ත්‍රාත්තුව Swiss Singapore සමාගමටම පැවරීමට ද ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබුණි.

**12.6.7 තේරී පත්වූ බව දැනුවත් කිරීම**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.3 ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටු තීරණය සියලුම ලංසුකරුවන්ට 2015 ජූලි 06 දින යවා තිබුණු (ඇමුණුම 100) අතර, අවශ්‍ය වන්නේ නම් සතියක් ඇතුලත ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය වෙත අභියාචනා කළ හැකි බව ද සඳහන් කර තිබුණි.

**12.6.8 ප්‍රසම්පාදන අභියාචනා**

මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි අභියාචනා 04 ක් ලැබී තිබුණි (ඇමුණුම 101).

| ලංසු කරු | අභියාචනය ඉදිරිපත්කළ දිනය |
|---|---|
| Liberty Commodities සමාගම | 2015 ජූලි 08 |
| Noble Resources සමාගම | 2015 ජූලි 10 |
| Suek AG Switzerland සමාගම | 2015 ජූලි 10 |
| Adani Global සමාගම | 2015 ජූලි 10 |

අභියාචනා මණ්ඩලය විසින්, අමාත්‍යාංශයේ නිරීක්ෂණ සමඟ ප්‍රසම්පාදනයට අදාල සියළු තොරතුරු තමන් වෙත ලබා දෙන ලෙස දන්වමින් එම අභියාචනා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමුකර තිබුණි.

ඒ අනුව ලංසුකරුවන් එවා ඇති අභියාචනා පිළිබඳ ප්‍රසම්පාදන කමිටු /තාක්ෂණ කමිටු නිරීක්ෂණ ද සමඟ පහත සඳහන් නිරීක්ෂණයන් ලේකම්වරයා විසින් අභියාචනා මණ්ඩලයට යොමු කිරීම සඳහා ජනාධිපති ලේකම් වෙත යවා තිබුණි. එම නිරීක්ෂණයන්හි සාරාංශයක් පහත දැක්වේ (ඇමුණුම 102).

(i) 1987 අංක 03 දරන මහජන කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදංචිවී නොමැති සමහර ලංසුකරුවන්ගේ ලංසු ප්‍රතික්ෂේප කළ යුතු බව

(ii) ලංසු ඇපකරවල සමහර අඩුපාඩු තිබියදී අමාත්‍ය මණ්ඩල තීරණයක් මත ඒවා පිළිගැනීම නුසුදුසුබව

(iii) ලංකා ගල් අඟුරු සමාගම සහ ප්‍රසම්පාදන කමිටුව විසින් ලංසුකරුවන් ඉදිරිපත් කළ දත්ත සහ තොරතුරු අනෙකුත් ලංසුකරුවන්ට සැපයීමට එකඟ නොවූ බැවින් එක් එක් ලංසුකරුවන්ට අනෙකුත් ලංසුකරුවන්ගේ ඇගයීම් මිල පිළිබඳව තක්සේරුවට එළඹීමට හැකියාවක් නොමැති බව

(iv) ලංසුකරුවන්ට තාක්ෂණික ඇගයීම් කමිටුව/ ප්‍රසම්පාදන කමිටු වාර්තා ලබාගත නොහැකි බැවින් එක් එක් ලංසුකරුවන් වෙනුවෙන් ගණනය කළ අධිභාර පිළිබඳ ඇගැයීමක් ඔවුන්ට සිදුකළ නොහැකි බව

(v) එකඟතාවයක් නොමැතිව ලංසු නිර්ණායක වෙනස් කිරීම නියමානුකූල නොවන බව සහ එය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ කඩ කිරීමක් බව

(vi) ලංසු විවෘත කිරීමෙන් අනතුරුව ඇතැම් ලංසුකරුවන් ලංකා ගල් අඟුරු සමාගම සමඟ සහ ප්‍රසම්පාදන කමිටුව සමඟ සංනිවේදනන් සිදුකර තිබීම ප්‍රසම්පාදන රෙගුලාසි උල්ලංඝනයකර ඇති බව

(vii) තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මූල්‍ය යෝජනා ඇගයීම් අවස්ථාවේදී අඩුම ලංසුකරු වූ Swiss Singapore සමාගම, මිල ඇගැයීමෙන් පසු වැඩිම ඇගැයීම් මිලක් ලැබූ ලංසුකරු බවට පත්ව ඇති බව

(viii) ගල් අඟුරු කැටයක ප්‍රමාණය පිළිබඳ නිර්ණායකය (Grain Size) ඔවුන් ඉදිරිපත්කළ ගැලපීම නිසා මෙ.ටොන් එකක් සඳහා එ.ජ.ඩො. 19.24 ගැලපීමට සිදුවූ බව ප්‍රසම්පාදන කමිටුව නිරීක්ෂණය කර ඇති බව

(ix) එම ගැලපීම අසාමාන්‍ය තත්ත්වයක් බවද, එම ගණනය කිරීම නිවැරදිව ලංසු ලියවිලි මත පදනම්ව සිදුකර ඇති බවද ප්‍රසම්පාදන කමිටුව නිරීක්ෂණය කර ඇති බව

(x) කෙසේ වුවද තවදුරටත් සලකා බැලීමේදී මෙතරම් අධිභාරයක් ගල් අඟුරු වල ප්‍රමාණය මත ඇතිවීම විශාල ගැටළුකාරී තත්ත්වයක් බව

(xi) බලාගාරය විසින් ගල් අඟුරු භාවිතයට ගැනීමේදී ඒවා තවදුරටත් කුඩු කිරීමට යන වියදමද ගල් අඟුරු කැටයක ප්‍රමාණය අඩුවීම නිසා අවම වන හෙයින් එය ලංකා විදුලිබල මණ්ඩලය යට වාසිදායක බව

(xii) ගල් අඟුරු කැටයක ප්‍රමාණය අඩුවී ම නිසා ඇති විය හැකි එකම ගැටළුව ප්‍රවාහනයේදී ඇතිවන මෙහෙයුම් ගැටළු බවත් අධිභාර පැනවීම සධාරණීකරනය කිරීමට එය හේතුවක් නොවන බව

### 12.6.9 අභියාචනා මණ්ඩල තීරණය

ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය විසින් 2015 අගෝස්තු 15 දින මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය මුළුමනින්ම අවලංගුකර අළුතින් නැවත ලංසු කැඳවන ලෙස අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශකර තිබුණි (ඇමුණුම 103).

## 12.6.10 2015 සැප්තැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය

විදුලිබල සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව කරන ලද යෝජනාවල සාරාංශයක් පහත දැක්වේ (ඇමුණුම 104).

(අ) ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය අදාල පාර්ශවයනට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා නොදී කරුණු නිසි ලෙස වටහා නොගෙන නිර්දේශ ඉදිරිපත් කර ඇති බැවින් ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලයේ නිර්දේශ ප්‍රතික්ෂේප කිරීම.

(ආ) තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව තම නිර්දේශ සුදුසු පරිදි අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හා නීතිපතිවරයාගේ නිර්දේශ මෙන්ම විධිමත් තාක්ෂණික අධ්‍යනයක් සිදු කරමින්ද ලබාදී ඇති බැවින් එම නිර්දේශද සැලකිල්ලට ගෙන රටේ බලශක්ති සුරක්ෂිතතාවය තහවුරු කිරීමට පහත සඳහන් යෝජනා පිළිගැනීම.

(i) දිගු කාලීන කොන්ත්‍රාත්තු මඟින් මෙන්ම කෙටිකාලීන ක්ෂණික මිලදී ගැනීම් මඟින් ගල් අඟුරු මිලදී ගැනීම.

(ii) තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කර ඇති පරිදි සාරානුකූල ප්‍රතිචාරාත්මක අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති Swiss Singapore සමාගමට නිව් කාසල් දර්ශකයට සාපේක්ෂව මෙ.ටො.1 ක් එ.ජ.ඩො. 68.72 ක FOB මිලට ලංසුකරු විසින් ඉදිරිපත් කර ඇති පිරිවිතරයන්ට අනුකූලව වසර 02 ක් සඳහා අවශ්‍ය ගල් අඟුරු මෙ.ටො. මිලියන 4.5 ±20% වසර 03 ක් තුල සැපයීම සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමීම.

(iii) ඉදිරි වසර 03 සඳහා අවශ්‍ය ඉතිරි ගල් අඟුරු මෙ.ටො මිලියන 2.25 ක් ක්ෂණික මිලදී ගැනීම් ක්‍රමය (Spot Tender) යටතේ සුදුසු පරිදි විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව හරහා මිලදී ගැනීම.

(ඇ) ඉහත ගල් අඟුරු සැපයීම සඳහා අවම CIF මිල ගණන් ඉදිරිපත් කළ Swiss Singapore සමාගම විසින් නැව් ගාස්තු, බත්තල් ගාස්තු හා රක්ෂණ ගාස්තු වශයෙන් ඉදිරිපත් කර ඇති ටොන් 01 ක් සඳහා එ.ජ.ඩො. 13.75 කට ගල් අඟුරු ප්‍රවාහන කොන්ත්‍රාත්තුව ලංකා නැව් සංස්ථාව වෙත ලබාදීම.

මෙම අමාත්‍ය මණ්ඩල යෝජනාවට මුදල් අමාත්‍යවරයා විසින් සිය නිරීක්ෂණ (ඇමුණුම - 105) 2015 සැප්තැම්බර් 21 දින ඉදිරිපත් කර තිබෙන අතර එමගින්,

1. අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් කරුණු සලකා බැලීමේදි පසුගිය වසර 5 ක කාලයක් මුළුල්ලේ ලක්විජය බලාගාරය සඳහා ගල් අඟුරු මිලදී ගැනිම මුල් කොන්ත්‍රාත්තුව සඳහා එළඹි ගිවිසුම් දීර්ඝ කිරිමේ ක්‍රියාවලියක් තුළ එක් සැපයුම්කරුවෙකු මගින් පමණක් සිදුකර ඇති බව නිරීක්ෂණය වන බව.

   ලක්විජය බලාගාරය සඳහා ගල් අඟුරු මිලදී ගැනීමට දිගුකාලීන කොන්ත්‍රාත් වලට ඇතුළත්වීමට පසුගිය වසර 5 ක කාලයක් තුළ අවස්ථා 4 කදි කැඳවා තිබූ ටෙන්ඩර් ප්‍රදානය කිරිමට අදාළව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ප්‍රසම්පාදන කමිටුව ලබාදුන් තීරණ අභියෝගයට ලක්ව ඇතිබවත් ඒ සෑම අවස්ථාවකදීම ප්‍රසම්පාදන අභියාචනා කමිටුව කොන්ත්‍රාත් අවලංගු කර නැවත ලංසු කැඳවිම නිර්දේශ කර ඇති බවත් නිරික්ෂණය වන බව.

   එම තත්ත්වය තුළ ප්‍රශ්තුත සංදේශයට අදාළ කොන්ත්‍රාත් ප්‍රදානය කිරිමට නිර්දේශ ලබාදීමේදි අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ප්‍රසම්පාදන කමිටුව ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හා නිතිමය කරුණු සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ අදහස් ද විමසා සිය නිර්දේශ ඉදිරිපත් කිරිමට කටයුතු කර ඇති නිසා නව ගිවිසුමකට එළඹිමට කටයුතු කළ යුතු බව එබැවින් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ මත පහත අංක (2) හි සඳහන් කොන්දේසි වලට යටත්ව මෙම ටෙන්ඩර් ප්‍රදානය කිරිමට එකඟවන බවත් සඳහන්කර තිබුණි.

2. 2.1.ගල් අඟුරු මිලදී ගැනිම සඳහා දිගුකාලීන කොන්ත්‍රාත්වලට ඇතුළත් වීමේදි නිව් කාසල් මිල දර්ශකය යොදා ගන්නා නමුත් බලශක්ති ප්‍රභවයන්හි මෑතකාලීනව දක්නට ලැබෙන අඛණ්ඩ මිල පහළ යාමේ ප්‍රවනතාවය මෙම ප්‍රසම්පාදනය සඳහා ඉදිරිපත් කළ මිල ගණන් තුළින් විද්‍යාමාන (reflect) නොවන බව නිරීක්ෂණය වේ. එනම් අමාත්‍ය මණ්ඩල සංදේශයේ දැක්වෙන මිල ගණන් මිට මාස කිහිපයකට ප්‍රථමයෙන් ඉදිරිපත් වූ මිල ගණන් වන අතර ඒ තුළින් ලෝක වෙළඳපොලේ ගල් අඟුරු සඳහා වූ ආසන්නතම තරගකාරි මිල ලබා ගැනිමේ වාසිය රටට නොලැබෙන බව පැහැදිලි වන බව.

එබැවින් විදුලිය ජනනය සඳහා බලාගාරය ගල් අඟුරු වෙනුවට ඉන්ධන භාවිතා කිරිමේ අවස්ථාවන්හිදි සාපේක්ෂව ඉහළ මිලක් වැය කිරිම හා ගල් අඟුරු සැපයුම අඛන්ඩව පවත්වා ගෙන යාමේ ජාතික වැදගත්කම ද සලකා එක් වර්ෂයක අවශ්‍යතාවය සඳහා පමණක් ආසන්නයේ සිදුකළ ක්ෂණික මිලදී ගැනීම් වලට අදාල මිල ගණන් සැලකිල්ලට ගෙන සිදු කරනු ලබන මිල කතිකාවකට යටත්ව ගල් අඟුරු සැපයිම සඳහා නිර්දේශිත සැපයුම්කරු සමඟ එක් වර්ෂයක් සඳහා ගිවිසුමකට එළඹීම සම්බන්ධයෙන් එකඟවන බවත් රේඛීය අමාත්‍යාංශය විසින් ගල් අඟුරු සපයා ගැනීම සඳහා අවුරුදු 2 ක දිගුකාලීන ගිවිසුමකට ඇතුලත්වීමට ලංසු කැඳවිය යුතු බව.

ඉහත දක්වන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය පිළිබඳව සිය නිරීක්ෂණ දක්වන බස්නාහිර සංවර්ධන සහ මහ නගර සංවර්ධන අමාත්‍යවරයා අමාත්‍ය මණ්ඩල සාමාජිකයෙකු ලෙස යෝජනා කර ඇත්තේ (ඇමුණුම 106)

(i) මෙම ටෙන්ඩරය අවලංගු කර අළුතින් ටෙන්ඩර් කැඳවන ලෙස ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය ලබාදී ඇති තීරණය පිළිගත යුතු බව.

(ii) එසේම ගල් අඟුරු කොන්ත්‍රාත්තුව වසරක් සඳහා පමණක් සීමා විය යුතු බවද දැනටමත් අමාත්‍ය මණ්ඩලය අනුමත කර ඇති ලෙසට ක්ෂණික ප්‍රසම්පාදනය මඟින් තවත් වසරක් යනතුරු (දිගුකාලීන ප්‍රසම්පාදනය සාර්ථක වී නව සැපයුම්කරුවෙකු තෝරා ගන්නා තුරු) ගල් අඟුරු මිලට ගත යුතු බව.

මෙහිදී වරාය හා නාවික අමාත්‍යවරයා අමාත්‍ය මණ්ඩල සාමාජිකයෙකු ලෙස ගල් අඟුරු ප්‍රවාහනයට සිය නිරීක්ෂණ (ඇමුණුම 106) දක්වමින් පවසා ඇත්තේ ගල් අඟුරු ප්‍රවාහනය කිරීම සහ බත්තල් වලින් ගොඩබෑම සඳහා ලංකා නැව් සංස්ථාවට මෙක්ට්‍රික් ටොන් 1 කට එ.ජ.ඩො. 14.50 ක් ගෙවන ලෙස අනුමැතිය ලබා දීම සුදුසු බවයි.

### 12.6.11 2015 සැප්තැම්බර් 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය

ඉහත 12.6.10 ඡේදයේ දැක්වෙන අමාත්‍ය මණ්ඩල සංදේශය සලකා බැලීමෙන් අනතුරුව, අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් තීරණ ලබා දී තිබුණි (ඇමුණුම 107).

(අ) පහත සඳහන් පරිදි ක්‍රියා කරන ලෙස විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයාට නියම කිරීම

(i) මුදල් ඇමතිතුමාගේ නිරීක්ෂණවල (2) වන ඡේදය දක්වා ඇති පරිදි, මෑතකදී සිදු කළ ක්ෂණික මිලදී ගැනීම්වලට අදාළව සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද ලංසු කරුවන් විසින් ඉදිරිපත් කරන ලද අවම මිල ගණන් සැලකිල්ලට ගනිමින්, මිල ගණන් අඩු කර ගැනීමේ හැකියාව පිළිබඳව ලංසුකරු සමඟ සාකච්ඡා කිරිමට යටත්ව, ලක්විජය ගල් අඟුරු බලාගාරයට ගල් අඟුරු සැපයීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කරන ලද ලංසුකරුවන් සමඟ එක් (01) වර්ෂයක කාලයකට පමණක් ගිවිසුමකට එළඹීම.

(ii) බාධාවකින් තොරව ගල් අඟුරු සැපයීම තහවුරු කිරීම පිණිස, 2015 ජූලි 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ලරිදි ක්ෂණික මිල දී ගැනිම් තුළින් ලක්විජය විදුලිබලාගාරය සඳහා තවදුරටත් ගල් අඟුරු මිලදී ගැනීම ; සහ සැපයුම් කාලය එක් (01) වර්ෂයකට සීමා කරමින්, අන්තර්ජාතික තරඟකාරි ලංසු කැඳවීමේ පටිපාටිය අනුගමනය කර එම විදුලිබලාගාරයට ගල් අඟුරු සැපයීම සඳහා වහාම අලුතෙන් ලංසු කැඳවීම.

(ආ) ගල් අඟුරු ප්‍රවාහන කොන්ත්‍රාත්තුව පිළිබඳව සංදේශයේ (6) වන ඡේදයේ (2.4) හි (ඇමුණුම 104) දැක්වෙන යෝජනාව සම්බන්ධයෙන් එකඟතාවයකට එළඹීමේ අරමුණින්, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති ඇමතිතුමා විසින් මුදල් ඇමතිතුමා සහ වරාය හා නාවික කටයුතු ඇමතිතුමා සමඟ සාකච්ජා කොට, එම සාකච්ජාවළදී එළඹෙන එකඟතාවයවන් පිළිබඳ වාර්තාවක් සලකා බැලීම පිණිස, අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කළ යුතුය.

(ඇ) පහත සඳහන් කාර්යයන් සඳහා කමිටුවක් පත් කරන ලෙස අතිගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිම.

(i) පුත්තලම ලක් විජය විදුලිබලාගාරයට (මෙ.වො.900) ගල් අඟුරු ප්‍රසම්පාදනය සඳහා මෑතකදී සිදු කළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලයේ වාර්තාවේ (2015 අගෝස්තු 05 දින පැවැත්වුණු එහි රැස්වීමට අදාළ ) අවධාරණය කර ඇති විෂමතාවන් පරික්ෂා කර බැලීම සඳහා; සහ

(ii) ඉහත ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ සිදු වී ඇති අඩු ලුහුඬුකම් පිළිබඳ වගකිව යුතු කිසිවෙකු වෙතොත් , ඔවුන්ට එරෙහිව;

සහ

එවැනි අඩු ලුහුඬුකම් ඉදිරියේදී නැවත සිදුවීම වළක්වාලීම පිණිස;

ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව නිර්දේශ අතිගරු ජනාධිපතිතුමා මඟින් අමාත්‍ය මණ්ඩල වෙත ඉදිරිපත් කිරීම (ඇමුණුම 9 A)

**12.6.12 ප්‍රසම්පාදන කමිටුව - 17 වන රැස්වීම**

ප්‍රසම්පාදන කමිටුව රැස්වීම් 2015 සැප්තැම්බර් 30 සහ 2015 ඔක්තෝබර් 01 දෙදින තුල පවත්වා ඇති අතර එහිදි මිල අඩු කරගැනීම පිළිබඳ Swiss Singapore සමාගම සමඟ සාකච්ඡා කර ඇත (ඇමුණුම - 108). ඒ සඳහා 2015 සැප්තැම්බර් 22 දිනැති අමාත්‍ය මණ්ඩල නියෝගය පාදක කරගෙන ඇත.

ඒ අනුව පහත එකඟතාවයන්ට ප්‍රසම්පාදන කමිටුව මෙහිදී එළඹ තිබුණි.

(අ) ගල් අඟුරු මිල නිව් කාසල් දර්ශකයේ සිට API 4 දර්ශකයට වෙනස් කිරීම.

(ආ) 2015 සැප්තැම්බර් මස API 4 මිල දර්ශකයන්ට අනුව ගල් අඟුරු ටොන් 01 ක් එ.ජ.ඩො. 58 බැගින් ගල් අඟුරු මෙ.ටො.මිලියන 1.92±20% ක් 2016 ජනවාරි සිට 2016 අප්‍රේල් සහ 2016 සැප්තැම්බර් සිට 2017 අප්‍රේල් කාල වකවානුව තුල මිලට ගැනීම.

(ඇ) ගල් අඟුරු මෙ.ටො ටොන් 01 ක් එ.ජ.ඩො.51.96 ක ස්ථිර මිලකට මෙ.ටො.330,000 ±20% ප්‍රමාණයක් මිලට ගැනීම.

(ඈ) ලංසු ලේඛනයේ සඳහන් අනෙකුත් කොන්දේසි නොවෙනස්ව තබාගැනීම.

මෙම ඡේදය පිළිබඳ විගණන නිරීක්ෂණ ඡේද අංක 18.3 (ඇ) හි දක්වා ඇත.

### 12.6.13 2015 ඔක්තෝබර් 02 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය

ප්‍රසම්පාදන කමිටුව නිර්දේශය පදනම් කරගනිමින් 2015 ඔක්තෝබර් 02 දින විදුලිබල හා පුනර්ජනීනය බලශක්ති අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබුණු අතර එමගින් පහත සදහන් යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා තිබුණි(ඇමුණුම 109).

(අ) අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබූ ප්‍රසම්පාදන කමිටුව, ටෙන්ඩරය පිරිනැමීමට නිර්දේශිත ලංසුකරු වන Swiss Singapore සමාගම සමඟ සාකච්ඡා කොට එකඟ වී ඇති පරිදි ලක්විජය තාප බලාගාරයට වසරක් සඳහා අවශ්‍ය ගල් අඟුරු මෙ.ටො.මිලියන 2.25±20% ප්‍රමාණයෙන් මෙ.ටො.330,000±20% ක් මෙ.ටො.01 ක් සඳහා එ.ජ.ඩො.51.96 FOB මිලකට ඉදිරි නොවැම්බර් හා දෙසැම්බර් මාස වලදී මිලදී ගැනීම. ඉතිරි ගල් අඟුරු මෙ.ටො.මිලියන 1.92±20% 2015 සැප්තැම්බර් මසට අදාල API 4 දර්ශකයේ මිල වන ටොන් 01 කට එ.ජ.ඩො.51.85 පදනම් කරගෙන මෙ.ටො. 01 ක් සඳහා එ.ජ.ඩො.58 ක FOB මිලට 2016 ජනවාරි සිට 2016 අප්‍රේල් දක්වා සහ 2016 සැප්තැම්බර් සිට 2017 අප්‍රේල් දක්වා සැපයීම සඳහා ටෙන්ඩරය Swiss Singapore සමාගමට පිරිනැමීම.

(ආ) ඉහත ගල් අඟුරු ප්‍රමාණයම ප්‍රවාහන සහ ගොඩබෑමට අදාල කොන්ත්‍රාත්තුව මෙ.ටො.01 ක් සඳහා එ.ජ.ඩො.14.50 කට ලංකා නැව් සංස්ථාවට පිරිනැමීම.

මෙම සංදේශයට මුදල් අමාත්‍යවරයා සිය නිරීක්ෂණ (ඇමුණුම 110) 2015 ඔක්තෝබර් 06 දින අමාත්‍ය මණ්ඩලය වෙත යොමුකොට ඇති අතර එමඟින් විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාවලට එකඟ වී ඇත. ඒ අනුව ඉහත සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2015 ඔක්තෝබර් 14 දින ලැබී ඇත. (ඇමුණුම 111)

### 12.6.14 ලංසු ප්‍රදානය කිරීම

අමාත්‍ය මණ්ඩල තීරණය, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2015 ඔක්තෝබර් 15 දින ලංකා ගල් අඟුරු සමාගමට දැනුම් දී ඇති අතර ලංකා ගල් අඟුරු සමාගම විසින් 2015 ඔක්තෝබර් 16 දින ලංසුව Swiss Singapore සමාගමට ප්‍රදානය කර ඇත. (ඇමුණුම 112)

**12.6.15 ලංසුව පිළිගැනීම සහ ගිවිසුමට එළඹීම**

2015 ඔක්තෝබර් 15 දින ජනාධිපති කාර්යාලය විසින් අභියාචනා ඉදිරිපත් කළ සියළු ලංසුකරුවන්ට මෙම ලංසුව පිළිබඳ අමාත්‍ය මණ්ඩලය විසින් එළැඹි තීරණය (ඉහත 12.6.14 හි දැක්වෙන) පිළිබඳ දැනුම් දී තිබිණි. අනතුරුව Swiss Singapore සමාගම සහ ලංකා ගල් අඟුරු සමාගම අතර ගිවිසුමට (ඇමුණුම 113) 2015 ඔක්තෝබර් 16 දින එළැඹ තිබුණි.

කෙසේවුවද මුල් ලංසු ලේඛණ වල ඇතුලත්ව තිබු මෙන්ම සියළු පාර්ශවයන් එකඟ වු කෙටුම්පත් ගිවිසුමෙහි පැවති ඇතැම් නිර්ණායක Swiss Singapore සමාගම, ලංකා ගල් අඟුරු සමාගම සමග අවසන් ගිවිසුමට එළඹීමේ දී සංශෝධනය කර තිබුණි. උදාහරණ ලෙස Swiss Singapore සමාගම සිය ලංසු ලේ ඛණ මගින් ගල් අඟුරු කැට වල ප්‍රමාණ නිර්නායකය (Grain Size) ලෙස උපරිම අගය (above 50 mm) සහ අඩු අගය (less than 2 mm) ලෙස පිළිවලින් 03% සහ 25% දක්වා තිබූ අතර ගිවිසුමෙහි එය 05% සහ 30% ලෙස දක්වා ඇත. (ඇමුණුම 113) (මෙම අගයන් ලංකා ගල් අඟුරු සමාගමෙහි ප්‍රමිතියන් අනුව ප්‍රතික්ෂේපිත අගයන් ද වේ)
ඉහත ඡේදය පිළිබඳ විගණන නිරීක්ෂණ ඡේද අංක 18.3(ඉ) සහ (ඊ) හි දක්වා ඇත.

# 13 ක්ෂණික ප්‍රසම්පාදන

## 13.1 ක්ෂණික ප්‍රසම්පාදනය අංක 01

### 13.1.1 ප්‍රසම්පාදනය සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාගැනීම

2015 ජූලි 13 දිනැතිව "පුත්තලම ගල් අඟුරු බලාගාරය සඳහා **හදිසි අවශ්‍යතාවය** සඳහා ක්ෂණික මිලදී ගැනීම් (Spot Market) යටතේ ගල් අඟුරු මිලදී ගැනීම්" නමින් විදුලි බල හා බල ශක්ති අමාත්‍යවරයා විසින් ඉදිරිපත්කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශයෙන්, (ඇමුණුම 114) පුත්තලම බලාගාරයට ඕනෑම හදිසි අවශ්‍යතාවයකදී අවශ්‍යවන ගල් අඟුරු මිලදී ගැනීම සඳහා ක්ෂණික මිලදී ගැනීම් ක්‍රමය (Spot Market) සුදුසු යයි යෝජනා කරමින් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලා තිබුණි.

ඒ අනුව අමාත්‍ය මණ්ඩලය විසින් 2015 ජූලි 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය (ඇමුණුම 115) මගින් පුත්තලම තාප බලාගාරයේ ජාතික වැදගත්කම සැලකිල්ලට ගනිමින් එහි මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම තහවුරු කිරීම පිණිස එකී බලාගාරයේ කිසියම් හදිසි අවශ්‍යතාවයකදී නිව් කාසල් දර්ශකය පාදකකර ගනිමින් එදිනෙදා වෙළඳපල මිල මත පදනම්ව

ක්ෂණික මිලදී ගැනීමේ ක්‍රමය යටතේ ගල් අඟුරු මිලදී ගැනීම සඳහා අවසර දී තිබුණි. තවද මේ සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනුලබන ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කිරීම පිණිස මහා භාණ්ඩාගාරයේ ලේකම්ට බලය පැවරීමටත් පළමු ක්ෂණික ප්‍රසම්පාදනය සඳහා පමණක්, මූලිකව වහා අවශ්‍ය ගල් අඟුරු ප්‍රමාණය සඳහා 2009 , 2011, 2013 සහ 2014 වර්ෂවල ටෙන්ඩර් කැඳවීම්වලට සහභාගීවීම මගින් ගල් අඟුරු සැපයීම සඳහා තාක්ෂණික වශයෙන් සුදුසුකම් ලැබූ සැපයුම්කරුවන් වෙතින් මිලගණන් කැඳවීමට සහ ඉදිරි ක්ෂණික මිලදී ගැනීම්වලදී වැඩි පිරිසකට සහභාගීවිය හැකි පරිදි වඩාත් විනිවිදභාවයෙන් යුතුව සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය ආරම්භකිරීමට කඩිනමින් ක්‍රියාකිරීමටත් ඉදිරියේදී පැවැත්වෙන ආසන්නම (earliest possible meeting) අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබා ගැනීමටත් යටත්ව ටෙන්ඩරය ප්‍රදානය කිරීමට අනුමැතිය ලබාදී තිබුණි.

මෙම ඡේදය පිළිබඳ විගණන නිරීක්ෂණ ඡේද අංක 18.4 (අ) හි දක්වා ඇත.

### 13.1.2 ලංසු ක්‍රියාවලිය

ඉහත ඡේදයේ අනුමැතිය අනුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් 2015 ජූලි 23 දින තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව නම්කර තිබුණි. ලංකා ගල් අඟුරු සමාගම විසින් ඉදිරිපත් කර තිබුණු ලංසු ලියවිලි තාක්ෂණික ඇගයීම් කමිටුව, 2015 ජූලි 24 දින විසින් පරික්ෂා කර ප්‍රසම්පාදන කමිටුව වෙත කර තිබුණු නිර්දේශයෙහි (ඇමුණුම 117) (The Salient Features of the bidding Document) යටතේ "No penalty for size consist" වශයෙන් සඳහන්කර තිබුණි. මෙම ප්‍රසම්පාදනය සඳහා වූ ලංසු ලියවිල්ලේ (18 පිටුව) (ඇමුණුම- 118) standard value for coal: Grain Size above 50 mm more than 5% and less than 2mm more than 30% by weight ලෙස සඳහන් කර ඇති අතර Reject value for coal යටතේද (ලංසු ලියවිල්ලේ 19 පිටුව) එය එසේම සඳහන්වේ. තවද ගිවිසුමෙහි ලංකා ගල් අඟුරු සමාගම Reject value for coal: Grain Size above 50 mm more than 5% and less than 2mm more than 30% by weight ලෙස (50 පිටුව) (ඇමුණුම 118) එලෙසම සඳහන් කර තිබුණි. තවද පෙර ලංසු සඳහා තාක්ෂණික වශයෙන් ප්‍රතිචාර දැක්වූ තෝරාගත් ආයතන 14 කින් ලංසු කැඳවීමටත් මෙ.ටො. 1ක් එ.ජ.ඩො.14.50 බැගින් ලංකා නැව් සංස්ථාව මගින් ප්‍රවාහනය කර ගැනීමටත් කර තිබුණු නිර්දේශය 2015 ජූලි 24 දින ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබුණි. (ඇමුණුම

119) ලංකා ගල් අඟුරු සමාගම විසින් 2015 ජූලි 27 දින ගල් අඟුරු මෙ.ටො 165,000 ± 10% ක් නිශ්චිත පිරිවිතරයන් අනුව ස්ථාවර මිලක් යටතේ ප්‍රසම්පාදනය සඳහා ලංසු කැඳවීම් ඊමේල් මගින් සිදුකර තිබුණි.

මෙම ඡේදය පිළිබඳ විගණන නිරීක්ෂණ ඡේද අංක 18.6 (අ) හි දක්වා ඇත.

### 13.1.3 ලංසු ඇගයීම

ලංසු 06 ක් ලැබී තිබුණු අතර ඒවා 2015 අගෝස්තු 10 දින විවෘත කර තිබුණි. ඒ අනුව ලංසුකරුවන් ඉදිරිපත් කළ ලංසු මිල ගණන් පහත දැක්වේ.

| සමාගමේ නම | ලංසු මිල (CIF) එ.ජ.ඩො | ලංසු මිල (FOB) එ.ජ.ඩො | අවම මිල මත හිමි ස්ථානය (CIF) |
|---|---|---|---|
| Liberty Commodities සමාගම | 69.47 | 55.70 | 1 |
| Noble Resources සමාගම | 70.52 | 57.00 | 2 |
| Adani Global සමාගම | 71.65 | 56.14 | 3 |
| Swiss Singapore සමාගම | 72.84 | 58.25 | 4 |
| Trafigura සමාගම | 74.70 | 60.60 | 5 |
| Suek AG of Switzerlan සමාගම | 78.02 | 64.00 | 6 |

### 13.1.4 ලංසු ප්‍රදානය කිරීම

ඉහත ඇගයීමේදී අඩුම ලංසුකරු වූ Liberty Commodities සමාගම වෙත ගල් අඟුරු මෙ.ටො 165,000 ± 10% ක්, එකක් එ.ජ.ඩො 69.47 (CIF) බැගින් මිලදී ගැනීමේ ලංසුව ප්‍රදානය කිරීමේ ලිපිය 2015 අගෝස්තු 11 යවා තිබුණු අතර ඒ සඳහා 2015 අගෝස්තු 17 දින ගිවිසුමට (ඇමුණුම 120) එළඹ තිබුණි.මෙම ගිවිසුමට එළඹීමේදී සල්ෆර් (sulfer) සහ අළු (Ash) යන නිර්ණායක මත මිල ගැලපීම් සූත්‍ර වෙනස්කර තිබුණි. ක්ෂණික මිලදීගැනීම් 02 සහ 04 සඳහා නව ගිවිසුම් වලට එළඹීමකින් තොරව මෙම ගිවිසුමම යාවත්කාලීන කර තිබුණි. එහෙයින් පළමු ක්ෂණික ප්‍රසම්පාදනයට අදාල ගිවිසුමේ තිබු ප්‍රශ්නකාරී තත්වය මත ඇතිවූ අවාසි දෙවන සහ සිව්වන ක්ෂණික ප්‍රසම්පාදනයන්හිදීද ඇතිව තිබුණි.

මෙම ඡේදය පිළිබඳ විගණන නිරීක්ෂණ ඡේද අංක 18.6 (ආ) හි දක්වා ඇත.

### 13.1.5 නැවත ඇණවුම් කිරීම

ක්ෂනික ප්‍රසම්පාදනය අංක 01 යටතේ මිලදී ගත් ගල් අඟුරු මෙ.ටොන් 165,000 ක ප්‍රමාණය 2015 ඔක්තෝබර් 15 දින දක්වා පමණක් ප්‍රමාණවත් බැවින්, ප්‍රසම්පාදනය මාර්ගෝපදේශ - 2006 හි 3.6 වගන්තියේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන තවත් සියයට 50 ක ප්‍රමාණයක් එනම් මෙ.ටොන් 82,500 ක් එම සැපයුම්කරුගෙන්ම මෙ.ටො එකක් එ.ජ.ඩො 69.47 ( CIF) ට බැගින් නැවත ඇණවුම් කිරීමට සහ ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව කටයුතු කිරීමට 2015 අගෝස්තු 20 දින පැවති රැස්වීමේදී ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය ලබාදී තිබුණි. (ඇමුණුම 121) ඒ අනුව ලංකා ගල් අඟුරු සමාගම විසින් එම අතිරේක සියයට 50 ප්‍රමාණය ප්‍රදානය කිරීමේ ලිපිය 2015 අගෝස්තු 27 දින Liberty Commodities සමාගම වෙත යවා තිබුණි.

මෙම ඡේදය පිළිබඳ විගණන නිරීක්ෂණ ඡේද අංක 18.6 (ඈ) හි දක්වා ඇත.

## 13.2 ක්ෂනික ප්‍රසම්පාදනය අංක 02

ඉහත 13.1.1 හි සඳහන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය පදනම් කරගනිමින් මෙම දෙවන ප්‍රසම්පාදනයට අදාල කටයුතු ආරම්භකර තිබුණි.

### 13.2.1 ලංසු ක්‍රියාවලිය

13.01.01 ඡේදයෙ සඳහන් අනුමැතිය ප්‍රකාරව ලංකා ගල් අඟුරු සමාගම විසින් 2015 අගෝස්තු 17 සුදුසුකම් ලත් ලංසුකරුවන් ලියාපදිංචි කර ගැනීම සඳහා අයදුම්පත් පුවත්පත් දැන්වීම් සහ Web Site මගින් කැඳවා තිබුණු අතර අයදුම්පත් 35 ක් නිකුත්කර තිබුණි. ඒ අනුව අයදුම්පත් 14 ක් ලැබී ඇති අතර 2015 අගෝස්තු 31 දින අයදුම්පත් විවෘත කර තිබුණි. අනතුරුව සුදුසුකම් සම්පූර්ණකළ ලංසුකරුවන් 08 ක් ලියාපදිංචි කර ගැනීමටත් ගල් අඟුරු මෙ.ටො 330,000 $\pm$ 10% ක් ප්‍රසම්පාදනය කර ගැනීමටත් FOB මිලට ලංසු කැඳවීමටත් ප්‍රවාහනය හා ගොඩබෑම එ.ජ.ඩො. 14.50 බැගින් නැව් සංස්ථාව මගින් සිදුකර ගැනිමටත් ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය දී තිබුණි (ඇමුණුම 122). ඒ අනුව ලියාපදිංචි ලංසුකරුවන් 08 දෙනාගෙන් 2015 සැප්තැම්බර් 01 දින ඊමේල් මගින් ලංසු කැඳවා තිබු අතර 2015 සැප්තැම්බර් 14 දින ලංසු වසා තිබුණි.

**13.2.2 ලංසු ඇගයීම**

මූල්‍ය යෝජනා ඉදිරිපත් කළ ලංසුකරුවන් සහ ඔවුන් ඉදිරිපත් කළ ලංසු මිල ගණන් පහත දැක්වේ.

| සමාගමේ නම | ලංසු මිල ගණන (FOB) එ.ජ.ඩො | අවම මිල මත හිමි ස්ථානය |
|---|---|---|
| Liberty Commodities සමාගම | 51.29 | 1 |
| Swiss Singapore සමාගම | 51.96 | 2 |
| Trafigura සමාගම | 52.33 | 3 |
| Adani Global සමාගම | 54.66 | 4 |
| Nobel Resources සමාගම | 55.55 | 5 |
| Vitol Asia සමාගම * | 56.55(156,000 MT)<br>57.90(110,000 MT)<br>64.10(55,000 MT) | 6 |

(* Vitol Asia සමාගම විසින් විවිධ ප්‍රමාණයන් සඳහා විවිධ මිල ගණන් ඉදිරිපත් කර තිබුණි)

**13.2.3 ලංසු ප්‍රදානය කිරීම**

ඉහත ඇගයීමේදී අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු Liberty Comodities සමාගමට ගල් අඟුරු මෙ.ටො 330,000 ± 10% ක් එකක් එ.ජ.ඩො. 51.29 (FOBT) බැගින් මිලදී ගැනීමේ ලංසුව ප්‍රදානය කිරීමේ ලිපිය 2015 සැප්තැම්බර් 18 දින යවා තිබුණු අතර එදිනම දෙපාර්ශවය අතර පැවති ඉහත 13.14 හි සඳහන් ගිවිසුම යාවත්කාලීන කර තිබුණි. (ඇමුණුම 123)

මෙම ඡේදය පිළිබඳ නිරීක්ෂණ ඡේද අංක 18.4 (අ) 18.6 (අ) සහ 18.6 (ආ )හි දක්වා ඇත.

**13.3 ක්ෂනික ප්‍රසම්පාදනය අංක 03**

තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රසම්පාදන කමිටුව වෙත 3 වන ක්ෂණික ප්‍රසම්පාදනය සඳහා නිර්දේශ ඉදිරිපත් කරමින් 2015 සැප්තැම්බර් 01 දින වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි (ඇමුණුම 124). මේ අතරතුර ලංකා ගල් අඟුරු සමාගම විසින් ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ගල් අඟුරු

මෙ.ටො 330,000 ± 10% ක් ප්‍රසම්පාදනය කර ගැනීම සඳහා ලංසු කැඳවා තිබුණි. කෙසේවුවද අමාත්‍යාංශ ලේකම්වරයාගේ 2015 ඔක්තෝබර් 06 දිනැති ලිපිය (ඇමුණුම 125) මගින් 3 වන ක්ෂණික ප්‍රසම්පාදනය නැවත දැනුම්දෙනතුරු අවලංගුකරන ලෙසට ලංකා ගල් අඟුරු සමාගම ට කරන ලද දැනුම් දීම මත ලංකා ගල් අඟුරු සමාගම විසින් 2015 ඔක්තෝබර් 05 දින ප්‍රසම්පාදනය අවලංගුකරන (ඇමුණුම 126) බව ලංසු කරුවන් වෙත දන්වා තිබුණි.

### 13.4 ක්ෂණික ප්‍රසම්පාදනය අංක 04

#### 13.4.1 ප්‍රසම්පාදනය සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාගැනීම

ඉහත 13.1.1 හි සඳහන් අමාත්‍ය මණ්ඩල අනුමැතීන් අනුව කටයුතු කර ඇත.

#### 13.4.2 ලංසු ක්‍රියාවලිය

ගල් අඟුරු මෙ.ටො 330,000 ± 10% ක් FOB මිලට ප්‍රසම්පාදනය කර ගැනීම සඳහා ලංසු කැඳවීමට ප්‍රසම්පාදන කමිටුව අනුමැතිය දී තිබුණි.ඒ අනුව 2015 දෙසැම්බර් 10 දින ඊ මේල් මගින් ලංසු කැඳවීම් සිදුකර තිබුණි. (ලංසුකරුවන් 2 නෙකු වන Frost International සහ MCS Holdings නව ලංසුකරුවන් ලෙස ලියාපදිංචි වීම නිසා ඉහත 13.2.1 හි සඳහන් ලියාපදිංචි ලංසු කරුවන් සංඛ්‍යාව මේ වන විට ලංසු කරුවන් 10 දක්වා වර්ධනය වී තිබුණි.)

#### 13.4.3 ලංසු ඇගයීම

ලංසු 05 ක් ලැබී තිබුණු අතර ඒවා 2016 ජනවාරි 05 දින විවෘත කර තිබුණි. ඒ අනුව ලංසුකරුවන් ඉදිරිපත් කළ ලංසු මිල ගණන් පහත දැක්වේ.

| **ලංසුකරු** | **ලංසු මිල ගණන (එ.ජ.ඩො.)** | **අවම මිල මත හිමි ස්ථානය (FOB)** |
|---|---|---|
| Liberty Commodities සමාගම | 49.85 | 1 |
| Adani Global Ltd | 50.20 | 2 |
| Swiss Singapore සමාගම | 51.69 | 3 |
| Trafigura සමාගම | 53.58 | 4 |
| Frost International සමාගම | 56.40 | 5 |

### 13.4.4 ලංසු ප්‍රදානය කිරීම

ඉහත ඇගැයීමේදී අඩුම මිල ඉදිරිපත්කළ ලංසුකරු වූ Liberty Commodities සමාගම වෙත ගල් අඟුරු මෙ.ටො 330,000 ±10% ක්, එකක් එ.ජ.ඩො. 49.85 (FOBT) බැගින් මිලදී ගැනීමේ ලංසුව ප්‍රදානය කිරීමේ ලිපිය 2016 ජනවාරි 07 යවා තිබුණු අතර ඒ සඳහා 2016 ජනවාරි 21 දින ගිවිසුම යාවත්කාලීන කර තිබුණි. (ඇමුණුම 127)

## 13.5 ක්ෂණික ප්‍රසම්පාදනය අංක 05

### 13.5.1 ප්‍රසම්පාදනය සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාගැනීම

ඉහත 13.1.1 හි සඳහන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.

### 13.5.2 ලංසු ක්‍රියාවලිය

ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් තාප ගල් අඟුරු මෙ.ටො 260000 ± 10% ක් සහ තාප නොවන ගල් අඟුරු මෙ.ටො 20000 ± 10% ක් FOB පදනම මත ප්‍රසම්පාදනය සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව ලංකා ගල් අඟුරු සමාගම විසින් 2016 පෙබරවාරි 18 දින ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ඊමේල් මගින් ලංසු කැඳවීම් සිදුකර තිබුණි. ලංසු ලේඛනයේ සඳහන් පරිදි තාප ගල් අඟුරු සහ තාප නොවන ගල් අඟුරු වල මිල ගණන් වෙන් වෙන්ව සඳහන්ව ඇත.

### 13.5.3 ලංසු ඇගයීම

ලංසු 03 ක් ලැබී තිබුණු අතර ඒවා 2016 මාර්තු 03 දින විවෘත කර තිබුණි. ඒ අනුව ලංසුකරුවන් ඉදිරිපත් කළ මිල ගණන් පහත දැක්වේ.

| සමාගම | තාප ගල් අඟුරු සඳහා ලංසු මිල (එ.ජ.ඩො.) | තාප නොවන ගල් අඟුරු සඳහා ලංසු මිල (එ.ජ.ඩො.) | තාප ගල් අඟුරු අවම මිල මත හිමි ස්ථානය |
|---|---|---|---|
| Adani Globle සමාගම | 50.25 | 33.00 | 1 |
| Liberty Commodities සමාගම | 51.38 | 25.00 | 2 |
| Swiss Singapore සමාගම | 52.33 | 21.38 | 3 |

### 13.5.4 ප්‍රදානය කිරීම

අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු Adani Global සමාගමට මෙ.ටො 1ක් එ.ජ.ඩො. 50.25 බැගින් තාප ගල් අඟුරු මෙ.ටො 260000 +/ - 10% ක්ද එ.ජ.ඩො 33.00 බැගින් තාප නොවන ගල් අඟුරු මෙ.ටො 20000 +/ -10% ක්ද ප්‍රසම්පාදනය කරගැනීම සඳහා ලංසු ප්‍රදානය කිරීමේ ලිපිය 2016 මාර්තු 04 දින යවා තිබු අතර 2016 මාර්තු 09 දින ගිවිසුමට එළඹ තිබුණි (ඇමුණුම 128).

## 14 ගල් අඟුරු මිලදී ගැනීම්/ලබා ගැනීම

ලංකා ගල් අඟුරු සමාගම ය මෙහෙයුම් ආරම්භ කළ දිනයේ සිට 2016 ජූනි දක්වා කළ තාප ගල් අඟුරු මිලදී ගැනීම්වල සාරාංශයක් පහත සටහනෙහි දැක්වේ.

| සැපයුම්කරු | ප්‍රමාණය (මෙ. ටො) | කාල පරාසය (නැව් භාර පත් අනුව) | | මුළු වියදම (එ.ජ.ඩො) |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| Noble Resources සමාගම (දිගුකාලීන ප්‍රසම්පාදන 02) | 4,298,692 | 30-11-2010 | 24-03-2015 | 338,362,445 |
| ලංකා නැව් සංස්ථාව (ප්‍රසම්පාදන ක්‍රියාමාර්ගයෙන් බැහැරව) | 284,978 | 07-03-2011 | 05-11-2012 | 32,157,128 |
| Liberty Commodities - ක්ෂණික ප්‍රසම්පාදන 1 | 226,290 | 01-09-2015 | 14-10-2015 | 12,295,615 |
| Liberty Commodities - ක්ෂණික ප්‍රසම්පාදන 2 | 370,594 | 04-10-2015 | 18-11-2015 | 18,296,805 |
| Swiss Singapore (දි. කා. ප්‍රසම්පාදන 06) | 1,064,724 | 16-11-2015 | 28-03-2016 | 57,932,357 |
| Liberty Commodities - ක්ෂණික ප්‍රසම්පාදන 4 | 383,804 | 24-01-2016 | 14-03-2016 | 18,229,353 |
| Adani Global - ක්ෂණික ප්‍රසම්පාදන 5 | 146,117 | 02-04-2016 | 05-04-2016 | 7,253,790 |
| එකතුව | 6,775,199 | | | 484,527,493 |

## 14.1 Noble Resources සමාගමින් මිලදී ගැනීම්

ඉහත 14 ඡේදයේ දක්වා ඇති පරිදි 2010 නොවැම්බර් 30 (පළමු ගල් අඟුරු තොගය පැටවූ දිනය) දින සිට 2015 මාර්තු 24 දක්වා එ.ජ.ඩො. මිලියන 338.36 ක් ගෙවා ගල් අඟුරු මෙ.ටොන් 4,298,692 ක් මිලදීගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

### 14.1.1 පළමු කොන්ත්‍රාත්තුව

ඉහත 14 ඡේදයේ දක්වා ඇති පරිදි 2010 නොවැම්බර් 30 දින සිට 2014 ජනවාරි 09 දක්වා එ.ජ.ඩො. මිලියන 203.66 ක් ගෙවා ගල් අඟුරු මෙ.ටොන් 2,237,994 ක් මිලදීගෙන තිබුණි.

### 14.1.2 පළමු දීර්ඝ කිරීම- අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව

2013 ඔක්තෝබර් 08 දින රැස්ව තිබුණු ප්‍රසම්පාදන කමිටුව ගල් අඟුරු මෙ.ටො.1 ක් එ.ජ.ඩො. 68.50 ක පාදක මිල මත (නිව් කාසල් දර්ශකය අනුව) අවශ්‍ය උපරිම අමතර ගල් අඟුරු ප්‍රමාණයවන මෙ.ටො.මිලියන 01 ක් Noble Resources සමාගමෙන් මිලදීගැනීමටත්, කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමටත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමටත් නිර්දේශකර තිබුණි.

ඒ අනුව එවකට රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරිය විසින් 2013 ඔක්තෝබර් 22 දිනැතිව ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශයක් (ඇමුණුම 129) අනුව සහ එවකට මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ සහ තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යවරයාගේ නිර්දේශ (ඇමුණුම 130) සලකා බලා වර්තමාන සැපයුම්කරු (Noble Resources සමාගම) සමඟ නැවත සාකච්ඡා කරන ලෙසත් එහි නිර්දේශ අමාත්‍යවරයා මඟින් නිර්දේශ ඉතා හදිසි කාරණයක් ලෙස සලකා 2013 නොවැම්බර් 11 දින අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙසත් 2013 ඔක්තෝබර් 31 දින පැවැත්වූ රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලය තීරණය (ඇමුණුම 131) කර තිබුණි.

2013 නොවැම්බර් 11 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අතිරේක ගල් අඟුරු තොග ප්‍රසම්පාදනය ලංකා ගල් අඟුරු සමාගම සහ Noble Resources සමාගම අතර වත්මන් ගිවිසුමේ නියමයන් සහ කොන්දේසිවලට අනුකූල විය යුතු බවත්, උපරිමය ගල් අඟුරු මෙ.ටො මිලියන 01 සීමාවකට යටත්ව මෙ.ටො.1 ක් එ.ජ.ඩො. 68.50 ක පාදක මිල අනුව නිශ්චය කළ යුතු බවත්, වත්මන් ගිවිසුමේ කාලය 2014 මාර්තු 31 දක්වා දීර්ඝ කළයුතු බවත් එවකට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ පරිදි ජාතික අවශ්‍යතාවය දිගුකාලීන වශයෙන් සපුරා

ගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ සහයෝගය ඇතිව තිරසර ක්‍රමවේදයක් සකස්කිරීමටත් ක්‍රියාකළ යුතු බවට තීරණයකර තිබුණි.

ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය 2013 නොවැම්බර් 12 දින අමාත්‍යාංශයට ලැබී එය එදිනම ලංකා ගල් අඟුරු සමාගම වෙත යවා තිබුණද (ඇමුණුම 132) ලංකා ගල් අඟුරු සමාගම ඒ බව Nobel Resource සමාගම වෙත දැනුම්දී තිබුණේ 2013 නොවැම්බර් 26 දිනවේ. ඉහත දක්වා ඇති පරිදි ගල් අඟුරු මෙ.ටො. මිලියනයක් ලබා ගැනීමට අනුමැතිය තිබුණද, ඉදිරි කාලය තුළ ගල් අඟුරු මෙ.ටො. ලක්ෂ 06 ක් ප්‍රමාණවත් බව ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලංකා ගල් අඟුරු සමාගම ය වෙත දන්වා තිබූ අතර, (ඇමුණුම 133) ඒ අනුව 2014 මාර්තු 31 දින දක්වා, සැපයීමට හැකි උපරිම ගල් අඟුරු ප්‍රමාණය සැපයීමටත්, ගල් අඟුරු මෙ.ටො. මිලියනය 1 න් ඉතිරි ප්‍රමාණය ඊළඟ වාරයේදී එම මිලටම (ගල් අඟරු මෙ.ටො.1 ක් එ.ජ.ඩො. 68.50 ක පාදක මිලට) සැපයීමටත් Nobel Resource සමාගම එකඟ වී (ඇමුණුම 134) තිබුණි. කෙසේවුවද ලංකා ගල් අඟුරු සමාගම, Nobel Resource සමාගම සමඟ ගල් අඟුරු මෙ.ටො.200,000 ක් 2014 අප්‍රේල් 15 දිනට පෙර සැපයීම සඳහා 2014 අප්‍රේල් 08 දින ගිවිසුමකට (ඇමුණුම 135) එළඹ තිබූ අතර, ඒ වනවිට ද Nobel Resource සමාගම විසින් ගල් අඟුරු මෙ.ටො. 210,972 ක් සපයා ඒ සඳහා එ.ජ.ඩො. මිලියන 14.22 ක් ගෙවා තිබුණි.

ඉහත ඡේදය පිළිබඳ විගණන නිරීක්ෂණ ඡේද අංක 18.4 (ආ) හි දක්වා ඇත.

**14.1.3 අමාත්‍ය මණ්ඩල අනුමැතියක් නොමැතිව, ලංකා ගල් අඟුරු සමාගම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මිලදී ගැනීම්,**

ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ලංකා ගල් අඟුරු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2014 ජූලි 22 දින රුස්වී ගල් අඟුරු මෙ.ටොන් 200,000 ±10% ක් Nobel Resource සමාගමින්ම එකක් එ.ජ.ඩො.74.42 (FOB) ක ස්ථාවර මිලක් යටතේ මිලදී ගැනීමට තීරණය කර තිබුණි. (ඇමුණුම 16) එම තීරණය අනුව 2014 අගෝස්තු 29 දින සිට 2014 ඔක්තෝබර් 01 දක්වා කාලයතුල ගල් අඟුරු මෙ.ටොන් 222,739 ක් එ.ජ.ඩො. මිලියන 16.04 කට මිලදීගෙන තිබුණි

මෙම ඡේදය පිළිබඳ විගණන නිරීක්ෂණ ඡේද අංක 18.4 (ඇ) හි දක්වා ඇත.

### 14.1.4 දෙවන දීර්ඝ කිරීම - අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව

12.5.7 ඡේදයේ දැක්වෙන පරිදි 2014 ඔක්තෝබර් 15 දින සිට 2015 මාර්තු 24 දක්වා එ.ජ.ඩො. මිලියන 104 ක් ගෙවා ගල් අඟුරු මෙ.ටොන් 1,626,987 ක් මිලදීගෙන තිබුණි. ඒ සමඟම එ.ජ.ඩො. 522,026 ක් වටිනා තාප නොවන ගල් අඟුරු මෙ.ටො. 10,012ක් ද මිලදී ගෙන තිබුණි.

මෙම ඡේදය පිළිබඳ විගණන නිරීක්ෂණ ඡේද අංක 18.8 හි දක්වා ඇත.

### 14.2 ලංකා නැව් සංස්ථාව මගින් මිලදී ගැනීම්/සැපයීම

ලංකා ගල් අඟුරු සමාගම ඇ.ඩො. මිලියන 29.59 ක් වටිනා තාප ගල් අඟුරු මෙ.ටොන් 228,984 ක් සහ එ.ජ.ඩො. මිලියන 4.29 ක් වටිනා තාප නොවන ගල් අඟුරු මෙ.ටො 54,557 ක් ලංකා නැව් සංස්ථාව මගින් ලබා ගැනීමට කටයුතුකර තිබුණි.

| | | තාප ගල් අඟුරු | | | තාප නොවන ගල් අඟුරු | | |
|---|---|---|---|---|---|---|---|
| **නැව් වාරය** | කාල පරිච්ඡේදය | ප්‍රමාණය (මෙ.ටො.) | (මෙ.ටො.)1 ක මිළ එ.ජ.ඩො. | වටිනාකම එ.ජ.ඩො. | ප්‍රමාණය (මෙ.ටො.) | (මෙ.ටො.)1 ක මිළ එ.ජ.ඩො. | වටිනාකම එ.ජ.ඩො. |
| **0 (DC 1)** | 2010/11 | - | - | - | 19,892 | 80.56(CIF) | 1,602,500 |
| **3** | 2010/11 | 81,688 | 150.92(CIF) | 12,328,353 | - | - | - |
| **13** | 2011/12 | 59,358 | 137.67(CIF) | 8,171,816 | 9,640 | 81.02(CIF) | 781,033 |
| **19** | 2012/13 | 32,827 | 107.78(CIF) | 3,538,094 | 12,375<br>12,650 | 80.72<br>72.14(CIF) | 998,910<br>912,571 |
| **20** | 2012/13 | 55,111 | 100.67 (CIF) | 5,548,024 | - | - | - |
| | | ---------<br>228,984 | | -------------<br>29,586,287 | ---------<br>54,557 | | ------------<br>4,295,014 |

**(අ) නැව් වාරය 0 (DC 1)**

බලාගාරයේ ගල් අඟුරු ගබඩා කිරීමට ප්‍රථම එහි බිම ඇතිරීම සඳහා ඇ.ඩො 2,764,939 (රු.313,348,188 ) ක් වටිනා තාප නොවන ගල් අඟුරු (Deaf Coal) මෙ.ටො. 49,542 ක් ලංකා නැව් සංස්ථාව මගින් ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව ලංකා ගල් අඟුරු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත ඇණවුම් කර තිබුණි (ඇමුණුම 140). මෙම ගල් අඟුරු තොගයෙන් මෙ.ටො. 29,650ක් මෙහෙයුම් අපහසුතා හේතුවෙන් ගොඩබා ගත නොහැකිව, ලංකා නැව්

සංස්ථාව මගින් තුන් වන පාර්ශවයකට අලෙවි කර තිබුණි. පසුව එනම් 2011 නොවැම්බර් 16 එම ප්‍රමාණය නැවත සැපයුම් කිරීමට ලංකා නැව් සංස්ථාව ගිවිසුම්ගතව තිබුණි. ඒ අනුව, නැව් වාර 13 මගින් එ.ජ.ඩො. 781,033 වටිනා ගල් අඟුරු මෙ.ටො. 9,640 ක් ද නැව් වාර 19 මගින් එ.ජ.ඩො. 998,910 වටිනා ගල් අඟුරු මෙ.ටො. 12,375 ක් ද සපයා තිබුණි. කෙසේ වුවද, එ.ජ.ඩො. 426,084 ක් වටිනා මෙ.ටො 7,635 ප්‍රමාණයක් සපයා නොතිබුණි (ඇමුණුම 141).

මෙම ඡේදය පිළිබඳ විගණන නිරීක්ෂණ ඡේද අංක 18.6 (උ) හි දක්වා ඇත.

**(ආ) නැව් වාරය 03**

ඉහත සඳහන් තාප නොවන ගල් අඟුරු මිලදී ගැනීමට 2011 දෙසැම්බර් 21 දින අංක LCC/CSC දරන ගිවිසුමට එළඹීමේදී (ඇමුණුම 142) ලංකා නැව් සංස්ථාව වෙතින් ප්‍රසම්පාදන ක්‍රියා මාර්ගයෙන් බැහැරව සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව, තාප ගල් අඟුරු මිලදී ගැනීමට ලංකා ගල් අඟුරු සමාගම එකඟ වී තිබුණි. ඒ අනුව මෙ.ටො. 1 ක් එ.ජ.ඩො. 150.92 CIF (එ.ජ.ඩො.124.24 FOB) බැගින් එ.ජ.ඩො.12,328,353 ක් (රු.1,602,685,890) වටිනා තාප අඟුරු මෙ.ටො.81,688 ක් (Taurine Iron Steel සමාගමින්) මිලදී ගෙන තිබුණි. කෙසේවුවද, මෙම අවස්ථාව වනවිට Noble Resources සමාගම විසින් ද (ප්‍රවාහනය ලංකා නැව් සංස්ථාව මගින්) ගල් අඟුරු මෙ.ටො. 1 ක් එ.ජ.ඩො. 148.29 CIF (එ.ජ.ඩො.121.61 FOB) බැගින් තාප ගල් අඟුරු සපයමින් තිබුණි. ඒ අනුව මෙ.ටො. එකක් එ.ජ.ඩො. 148.29 CIF (එ.ජ.ඩො. 121.61 FOB) ක් බැගින් මිලකට මිලදී ගැනීමේ හැකියාව තිබියදී ඉහත පරිදි වැඩි මිළගණන් වලට ලබාගෙන තිබුණි.

මෙම ඡේදය පිළිබඳ විගණන නිරීක්ෂණ ඡේද අංක 18.6 (ඇ) හි දක්වා ඇත.

**(ඇ) නැව් වාරය 13**

ලංකා ගල් අඟුරු සමාගම ප්‍රසම්පාදන ක්‍රියා මාර්ගයෙන් බැහැරව සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව, ලංකා නැව් සංස්ථාව මගින් අංක LCC/CSC දරන 2011 දෙසැම්බර් 21 දිනැති ගිවිසුම (ඇමුණුම 142) අනුව මෙ.ටො. 1ක් එ.ජ.ඩො. 137.67 CIF (එ.ජ.ඩො.107.63 FOB) බැගින් එ.ජ.ඩො 8,171,816 ක් වටිනා තාප ගල් අඟුරු මෙ.ටො. 59,358 ක් (Taurine Iron Steel සමාගමින්) මිලදී ගෙන තිබුණි. කෙසේවුවද, මෙම අවස්ථාව වනවිට Noble Resources සමාගම විසින් ද (ප්‍රවාහනය ලංකා නැව් සංස්ථාව මගින්) ගල් අඟුරු මෙ.ටො. 1ක් එ.ජ.ඩො. 132.47 CIF (එ.ජ.ඩො.102.43 FOB) බැගින් තාප ගල් අඟුරු සපයමින් තිබුණි. ඒ අනුව මෙ.ටො.

එකක් එ.ජ.ඩො. 132.47 CIF (එ.ජ.ඩො.102.43 ( FOB) බැගින් මිලකට මිලදී ගැනීමේ හැකියාව තිබියදී ඉහත විස්තර කර ඇති පරිදි මෙ.ටො. 59,358 ක් වැඩි මිළගණන් වලට ලබාගෙන තිබුණි.

මෙම ඡේදය පිළිබඳ විගණන නිරීක්ෂණ ඡේද අංක 18.6 (ඉ) හි දක්වා ඇත..

## 14.3 16 සහ 17 වන නැව් වාර මඟින් මිලදී ගන්නා ලද ගොඩබෑමට නොහැකි වූ ගල් අඟුරු 18 වන නැව් වාරයෙන් නැවත සැපයීම

දෙවන ප්‍රසම්පාදනයට අදාලව සැපයුම්කරු වූ Noble Resources වෙනුවෙන් ලංකා නැව් සංස්ථාව විසින් 16 සහ 17 වන නැව් වාර දෙකට ගල් අඟුරු මෙ.ටො. 142,350 ක් ඉන්දුනිසියාවෙන් පිළිවෙලින් 2012 අප්‍රේල් 17 සහ 2012 අප්‍රේල් 23 යන දිනයන්හිදී නැව්ගත කර තිබුණි. නොරොච්චෝලේ ප්‍රදේශයේ වාරකන් කාලය මැයි - සැප්තැම්බර් අවසානය දක්වා වන අතර, 16 සහ 17 වන නැව් වාර මඟින් මිලදී ගන්නා ලද ගල් අඟුරු අයහපත් කාලගුණය හේතුවෙන් ගල් අඟුරු මෙ.ටො. 85,891 ක් ගොඩබෑමට ලංකා නැව් සංස්ථාව ට නොහැකි වී තිබුණි.
මෙම හේතුව නිසා, ගොඩබෑමට නොහැකි වූ ගල් අඟුරු තොගය 3 වන පාර්ශවයකට අලෙවිකර, පසුව සමාන ප්‍රමිතියෙන් යුතු ගල් අඟුරු එම පාර්ශව මඟින් නැවත ගෙන්වා ගැනීම සඳහා 2012 ජූනි 28 දින ගල් අඟුරු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණයකට එළඹ තිබුණි. ඒ අනුව ලංකා නැව් සංස්ථාව ගල් අඟුරු මිලදී ගැනීම සඳහා Taurine Iron Steel Company (Pvt) Ltd නැමැති සමාගම සමඟ ගිවිසුමකටත්, ලංකා ගල් අඟුරු සමාගම ලංකා නැව් සංස්ථාව ය සමඟ 2012 ජූනි 29 දින ගිවිසුමකටත් එළඹ තිබුණි. (ඇමුණුම 144)

ඉහත පරිදි ලංකා නැව් සංස්ථාව ය විසින් ගල් අඟුරු මෙ.ටො. 85,891 ක් සැපයිය යුතුව තිබුණද, එයින් ගල් අඟුරු මෙ.ටො. 55,994 ක් පමණක් සපයා තිබුණි. තවදුරටත් සැපයිය යුතුව තිබුණු එ.ජ.ඩො 3,558,763 වටිනා ගල් අඟුරු මෙ.ටො. 29,896 ක් ලබා ගැනීමට කටයුතු නොකර ලංකා නැව් සංස්ථාව වෙතින්ම, ලංකා ගල් අඟුරු සමාගම විසින් 19 වන නැව් වාරය සඳහා එ.ජ.ඩො. 4,076,640 ( රු.529,963,200) වටිනාකමින් යුත් ගල් අඟුරු මෙ.ටො. 32,827 ප්‍රමාණයක්ද එ.ජ.ඩො. 809,760 වටිනා තාප නොවන ගල් අඟුරු මෙ.ටො. 12,650 ද 20 වන නැව් වාරය සඳහා එ.ජ.ඩො 6,228,200 ( රු.809,666,000) වටිනාකමින් යුත් ගල් අඟුරු මෙ.ටො. 55,111 ප්‍රමාණයක්ද සඳහා ණයවර ලිපි (ඇමුණුම 145) විවෘත කර තිබුණි.

නැව් වාර 18,19,20 මගින් Taurine Iron Steel සමාගමෙන් ගෙන්වන ලද ගල් අඟුරු නියමිත ප්‍රමිතියෙන් තොර බවට එනම්, තාප ජනක අගය 5,900 ට වඩා අඩු බවට ගල් අඟුරු ගොඩබාන අවස්ථාවේ ලංකා විදුලිබල මණ්ඩලය ය ලබා ගෙන තිබුණු ගුණාත්මක වාර්තාවේ (Quality Report) හි සඳහන් වී තිබුණි.

මෙම ඡේදය පිළිබඳ විගණන නිරීක්ෂණ ඡේද අංක 18.6 (ඊ) සහ (ඌ) හි දක්වා ඇත.

### 14.4 Liberty Commodities සමාගම මගීන් මිලදී ගැනීම්

2015 සැප්තැම්බර් සිට 2016 මාර්තු දක්වා ලංකා ගල් අඟුරු සමාගම ලිබර්ටි කොමොඩිටීස් සමාගම වෙතින් ගල් අඟුරු මෙ.ටොන් 980,688 ක් මිලදීගෙන ඇති අතර, ඒ සඳහා වැයවී ඇති මුදල එ.ජ.ඩො. 48,821,773 කි.

### 14.5 Swiss Singapore සමාගම මගින් මිලදී ගැනීම්

2015 නොවැම්බර් 16 දින සිට 2016 මාර්තු 28 දින දක්වා ලංකා ගල් අඟුරු සමාගම Swiss Singapore සමාගම වෙතින් ගල් අඟුරු මෙ.ටොන් 1,064,724 ක් මිලදීගෙන ඇති අතර ඒ සඳහා වැයවී ඇති මුදල එ.ජ. ඩො. 57,932,357 කි.

### 14.6 Adani Global සමාගම මගින් මිලදී ගැනීම්

ලංකා ගල් අඟුරු සමාගම එ.ජ.ඩො. 7,253,790 ක් වටිනා තාප ගල් අඟුරු මෙ.ටොන් 146,117 ක් සහ එ.ජ.ඩො. 987,477 ක් වටිනා තාප නොවන ගල් අඟුරු මෙ.ටො 20,789 ක් Adani Global සමාගම මගින් මිලදීගෙන තිබුණි.

## 15. ගල් අඟුරු ප්‍රවාහනය

ලංකා ගල් අඟුරු සමාගම විසින් 2010 නොවැම්බර් 30 සිට 2016 මැයි 09 දක්වා මිලදීගත් තාප ගල් අඟුරු මෙ.ටොන් 6,775,199 ක් සහ තාප නොවන ගල් අඟුරු මෙ.ටො 85,358 ක් ප්‍රවාහනය සඳහා එ.ජ.ඩො. 145,142,587 ක් වැය කර ඇත.

ලංකා නැව් සංස්ථාවට ගල් අඟුරු ප්‍රවාහනය සඳහා එ.ජ.ඩො. 141,232,129 ක් ද Liberty Commodities සමාගමට එ.ජ.ඩො. 3,910,458 ද වශයෙන් ගල් අඟුරු ප්‍රවාහනය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගෙවා තිබුණි. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ

| සැපයුම්කරු | ප්‍රමාණය මෙ.ටො | | නැව් වාර සංඛ්‍යාව | ලංකා නැව් සංස්ථාවට එ.ජ.ඩො. | Liberty Commodities සමාගමට එ.ජ.ඩො. |
|---|---|---|---|---|---|
| | තාපගල් අඟුරු | තාප නොවන ගල් අඟුරු | | | |
| Noble Resources සමාගම | 4,298,692 | 10,012 | 73 | 105,500,814 | - |
| ලංකා නැව් සංස්ථාව | 284,978 | 54,557 | 9 | 7,630,092 | - |
| Liberty Commodities සමාගම | 980,688 | - | 18 | 10,182,046 | 3,910,458 |
| Swiss Singapore සමාගම | 1,064,724 | - | 18 | 15,491,734 | - |
| Adani Global සමාගම | 146,117 | 20789 | 3 | 2,427,443 | - |
| **එකතුව** | **6,775,199** | **85,358** | **121** | **141,232,129** | **3,910,458** |
| **මුළු එකතුව** | | | | | **145,142,587** |

## 16. ගල් අඟුරු ගබඩා කිරීම සහ අළු අපහරණය

ගල් අඟුරු ගබඩා කිරීම හා අළු අපහරණය සම්බන්ධයෙන් අණාවරණය වූ විගණන නිරීක්ෂන ඡේද අංක 18.11 හි දැක්වේ.

## 17 නිෂ්කාර්ය වත්කම්

ගල් අඟුරු ප්‍රවාහන කටයුතු සඳහා බලාගාරය ආරම්භයේ දී රු1,129,844,592 (ඇමුණුම 146) වැයකර මිලදී ගෙන තිබු බෝට්ටු 02 ක් සහ බත්තල් 03 ක් අදාල කාර්යය සඳහා භාවිතයට ගත නොහැකි වීම හේතුවෙන් ඒවා ත්‍රිකුණාමලය සහ කොළඹ වරායන්වල නිෂ්කාර්යව වරාය රුදවුම් ගාස්තු ගෙවමින් ගාල් කර තිබුණි.

මෙම ඡේදය පිළිබඳ විගණන නිරීක්ෂන ඡේද අංක 18.12 හි දක්වා ඇත.

## 18. විගණන නිරීක්ෂණ

ඉහත ඡේදයන්ගේ දක්වා ඇති කරුණුවලට අදාල විගණන නිරීක්ෂණයන් හඳුනාගත් එක් එක් ශීර්ෂය යටතේ පහතින් දක්වා ඇත.

### 18.1 ලංකා ගල් අඟුරු සමාගම පිහිටුවීම සහ එහි ක්‍රියාකාරීත්වය

ඉහත 5 ඡේදයේ දක්වා ඇති පරිදි නොරොච්චෝලේ, ත්‍රිකුණාමලය සහ හම්බන්තොට ඉදිකිරීමට සැලසුම්කර තිබුණු ගල් අඟුරු විදුලි බලාගාර සඳහා අවශ්‍ය ගල් අඟුරු මිලදී ගැනීමේ නිශ්චිත කාර්යය ඉටුකිරීම වෙනුවෙන් ලංකා ගල් අඟුරු සමාගම ය පිහිටුවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය (ඇමුණුම 4) දී තිබුණද සමාගම සංස්ථාපනය කිරීමේදී 5.2 ඡේදයේ දැක්වෙන පරිදි පාර්ලිමේන්තු පනත් මගින් වෙනත් රාජ්‍ය ආයතනවෙත පැවරී තිබෙන කාර්යයන්ද ලංකා ගල් අඟුරු සමාගමෙහි යෙහි අරමුණුවලට (ඇමුණුම 6) ඇතුලත්කර තිබුණු අතර එමගින් සමාගම පිහිටුවීමේ අරමුණවලට වඩා පුලුල් විෂය පථයක් ආවරණය කරගෙන ඇති බව නිරීක්ෂණය විය.

### 18.2 ලංසු කැඳවීමේ ක්‍රියාවලියේ අඩුපාඩු

(අ) 12.1.1 (ආ) ඡේදය පරිදි පළමු ප්‍රසම්පාදනයට අදාළව පැවැත්විය යුතුව තිබු තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව ඒකාබද්ධ පළමු රැස්වීම පවත්වා නොතිබීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.1 (ඇ) වගන්තිය (ඇමුණුම 147) උල්ලංඝනය කිරිමක් ලෙස නිරික්ෂණය විය.

(ආ) 12.1.1 (ඇ) ඡේදය අනුව, පළමු ප්‍රසම්පාදනයේදී අභිප්‍රාය ප්‍රකාශ කැඳවීම සඳහා පලකරනලද පුවත්පත් දැන්වීමේ (ඇමුණුම 22) ගල් අඟුරු සැපයීම හෝ ඒ හා සමාන ව්‍යාපාරයක වර්ෂ 5 ක පලපුරුද්ද තිබියයුතු බව සඳහන්කර තිබුණද පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා අයදුම්පත් නිකුත්කිරීමේදී වසර 3 පලපුරුද්දක් සපුරා තිබු ආයතන වෙතද අයදුම්පත් නිකුත්කර තිබුණි. මෙය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.12.1 (ඊ) වගන්තිය (ඇමුණුම 148) උල්ලංඝනය කිරීමක් ලෙස නිරික්ෂණය විය. තවද එමඟින් අයදුම් කිරීමට හැකිව තිබුණු ආයතනවලට අවස්ථාව අහිමි කර ඇති බවත් එමඟින් ලංකා

ගල් අඟුරු සමාගම යට අවාසිසහගත ලෙස තරඟකාරීත්වය අඩු කරගෙන ඇති බවත් නිරික්ෂණය විය.

(ඈ) 12.1.5 ඡේදයේ විස්තර කර ඇති පළමු ප්‍රසම්පාදනයට අදාල දෙවන, තෙවන සහ පස්වන සංශෝධන ලංසු කරුවන්ට යැවූ බවට සාක්ෂි නොවීය. තවද පළමු සහ සිව්වන සංශෝධන දැනුම් දීමට සකස් කළ ලිපිවල ඡායා පිටපත්හි අත්අකුරින් ලියා තිබූ සටහන් බලධාරියකු විසින් අත්සන තබා තහවුරු කර නොතිබුණු හෙයින් එම සංශෝධනද ලංසුකරුවන් සියලුදෙනා වෙත දැනුම් දී ඇති බව නිශ්චිතව තහවුරු නොවූයෙන් මෙහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.14 (අ) වගන්තිය (ඇමුණුම 149) උල්ලංඝණය කර ඇති බව නිරික්ෂණය විය.

(ඇ) 12.3.2 ඡේදයේ සඳහන් පරිදි ලංකා ගල් අඟුරු සමාගම විසින් කොන්ත්‍රාත්තු පනත යටතේ ලියාපදිංචිවීමේ අවශ්‍යතාවය පිළිබඳ නිර්ණායකයක් ලෙස ලංසු ලේඛණයට ඇතුලත් කළයුතුව තිබුණද එසේ කටයුතුකර නොතිබුණි. එසේම ඉහත සඳහන් අවශ්‍යතාවය පිළිබඳව නීති උපදෙස් ලබාගෙන ලංසු ලේඛණ සංශෝධනය කිරීමට ප්‍රසම්පාදන කමිටුව විසින් ලංකා ගල් අඟුරු සමාගමට උපදෙස් දී තිබුණු අතර ඒ අනුව කටයුතුකර නොතිබීම මෙම ප්‍රසම්පාදනය අවලංගු කිරීමට මූලික හේතුව වී තිබූ බවද නීරීක්ෂණය වීය.

තවද 2006 රාජ්‍ය ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ අතිරේක අංක 13 (ඇමුණුම 150) ප්‍රකාරව රු.මිලියන 5 ඉක්මවන සෑම කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන්ම 1987 අංක 13 දරන රාජ්‍ය කොන්ත්‍රාත්තු පනතේ 8 වගන්තිය ප්‍රකාරව (ඇමුණුම 33) ලියාපදිංචිවීම අවශ්‍යබව සඳහන් වුවද 5 වන ප්‍රසම්පාදනය දක්වාම ලංකා ගල් අඟුරු සමාගම එම අවශ්‍යතාවය නොසලකා කටයුතු කර තිබුණි.

(ඉ) 12.6.5 ඡේදය අනුව 6 වන ප්‍රසම්පාදනයට අදාලව ලංසු ලේඛන හය වතාවක් සංශෝධනය (ඇමුණුම 82 ) කිරීම හේතුවෙන් නිසා ලංසු වැසීමේ දිනය මාස 03 කින් ප්‍රමාද වී තිබුණි. මේවන විට ලංසු ක්‍රියාවලීන් 5කට අදාලව කටයුතුකර තිබුණද එයින් ලබාගත් අත්දැකීම් තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව විසින්

උපයෝගීකර නොගැනීම නිසා මෙම ප්‍රසම්පාදනයට අදාල කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට මාස 08 ක දීර්ඝ කාලයක් ගතකර තිබූබව නිරීක්ෂණය විය.

## 18.3 ලංසු ඇගයීමේ ක්‍රියාවලියේ අඩුපාඩු

(අ) 12.6.6 (එ) ඡේදය අනුව 6 වන ප්‍රසම්පාදනයේදී සාරානුකූල ප්‍රතිචාරාත්මක ලංසුකරුවකු තෝරාගැනීමට පෙර, SCAPC විසින් Noble Resources සමාගම සමඟ ලංසුව ඉදිරිපත්කළ මිල තවදුරටත් අඩුකර ගැනීම සඳහා සාකච්ඡා කළේද නැත්ද යන්න නිශ්චිතව තහවුරු නොවීය.

(ආ) ඉහත 12.6.6 (ඔ) ඡේදයේ සඳහන් පරිදි 6 වන ප්‍රසම්පාදනයේ දී , 2015 ජූනි 26 දිනැති Suek AG සමාගම වෙතින් ලද ඊ-මේල් පණිවුඩයක් (ඇමුණුම 94) Swiss Singapore සමාගම විසින් 2015 ජූනි 29 දින එවන ලද ලිපියක් (ඇමුණුම 92) පිළිබඳව ප්‍රසම්පාදන කමිටුව විසින් සලකා බැලීම ලංසු ලියවිල්ලේ 5.2 වගන්තියට යටත්ව, 5.5 වගන්තියට (ඇමුණුම 152) පටහැනි වුවද එවැනි අවස්ථාවකදී කළයුතු ලංසුව ප්‍රතික්ෂේප කිරීම ප්‍රසම්පාදන කමිටුව විසින් Swiss Singapore සමාගමට සහ Suek AG සමාගම එරෙහිව ක්‍රියාත්මකකර නොතිබුණු බව නිරීක්ෂණයවිය.

(ඇ) ඉහත 12.6.6 (ඕ) ඡේදයෙහි සඳහන් පරිදි 6 වන ප්‍රසම්පාදනයේ ලංසු 2 වන වර ඇගැයීමේදී ලංසු ලේඛනවල ඇතුලත්ව තිබුණු ගල් අඟරු කැටවල ප්‍රමාණය මත අයකරන අධිභාරය ඉවත්කර ඇගයීම් සිදුකිරීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.20 (ආ) සහ 7.9.10 (ඇමුණුම 154) වගන්ති උල්ලංඝණය කිරීමක් බව නිරීක්ෂණ විය.

(ඈ) 12.6.4.2 ඡේදයේ සඳහන් පරිදි දෙවන පූර්ව ලංසු රැස්වීමේදී (ඇමුණුම 81) විභව ලංසුකරුවන් විසින් “මිල පදනම” ලෙස එක් එක් රට වල යොදාගන්නා මිල දර්ශක අනුව මිල ගණන් ඉදිරිපත් කළ හැකිද යන්න විමසා තිබුණද (උදාහරණ ලෙස ඒපීඅයි4 දර්ශකය) එම අවස්ථාවේදී ප්‍රසම්පාදන කමිටුව එසේ කළ නොහැකි බව දක්වා පසු අවස්ථාවකදී (12.6.12 ඡේදයේ සඳහන් පරිදි ) නිව් කාසල් දර්ශකය වෙනුවට ඒපීඅයි4 දර්ශකය යොදාගෙන තිබුණි. එලෙස පසු අවස්ථාවකදී දර්ශකය වෙනස් කිරීම පූර්ව

එකඟතාවයන්ට මෙන්ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.20 වගන්තියට (ඇමුණුම 155) පටහැනිව කටයුතු කිරීමක් ලෙස නිරීක්ෂණය විය.

(ඉ) 12.6.15 ඡේදය අනුව 6 වන ප්‍රසම්පාදනයේ දී මුල් ලංසු ලේඛණවලට ඇතුලත්ව තිබුණු කෙටුම්පත් ගිවිසුමෙහි (ඇමුණුම 157) පැවති සියළු පාර්ශවයන් එකඟ වූ ඇතැම් නිර්ණායක ලංකා ගල් අඟුරු සමාගම Swiss Singapore සමාගම සමඟ ගිවිසුමට (ඇමුණුම 158) එළඹීමේ දී සංශෝධනය කර තිබීම නිසා මූලික ලංසු ලියවිලිවල ඇතුලත් ගල් අඟුරු කැටවල විශාලත්වය සම්මත ප්‍රමාණයෙන් බැහැරවීම මත අයකරන අධිභාරය (Price Penalty for Size Consist) සංශෝධිත ගිවිසුම අනුව අයකිරීමට නොහැකි වී තිබුණි. ඒ අනුව Swiss Singapore සමාගමින් අයකර ගැනීමට නොහැකි වූ ඇස්තමේන්තුගත අධිභාරය එ.ජ.ඩො.8,754,979 ක් එනම් (රු.1,138,147,270) කි (ඇමුණුම 159).

ගල් අඟුරු ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භයේ සිටම (පළමු ප්‍රසම්පාදනයේ සිට පස්වන ප්‍රසම්පාදනය දක්වා) භාවිතාකළ නිර්නායක හයවන ප්‍රසම්පාදනයේදී ලංසු ලේඛණවල ඇතුලත්කර තිබුණු නමුත් ඊට වෙනස් ආකාරයකට මෙයින් එක් නිර්නායකයක් වෙනත් ආකාරයකට යොදාගෙන නැවත ඇගයීමට භාජනය කිරීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.3.20 (ආ) වගන්තිය උල්ලංඝනය කිරීමක් බව නිරීක්ෂණය වූ අතර මෙය සැමට අවස්ථාව ලබාදීමේ මූලධර්මයද උල්ලංඝණය කිරීමකි. (ඇමුණුම 160)

Noble Resources සමාගම විසින් 2010 නොවැම්බර් සිට 2015 මාර්තු 24 දක්වා කාලය තුල සපයන ලද ගල් අඟුරු මෙ.ටො.4,298,692 වෙනුවෙන් ගල් අඟුරු කැටවල විශාලත්වය සම්මත ප්‍රමාණයෙන් බැහැරවීම මත (Price Penalty for Size Consist) රු. 29,683,391 ක අධිභාරයක් අයකරගෙන තිබුණි (ඇමුණුම 156).

(ඊ) 12.6.15 ඡේදය අනුව, මුල් ලංසු ලේඛණ වල ගල් අඟුරු කැටවල විශාලත්වය යන නිර්නායකයෙහි උපරිම අගය (above 50 mm) 3% සහ අඩු අගය (less than 2 mm) 25% ලෙස දක්වා තිබුණද ලංකා ගල් අඟුරු සමාගම ය Swiss Singapore සමාගම සමඟ ගිවිසුමට එළඹීමේ දී (ඇමුණුම 113) එම අගයන් පිළිවෙලින් (above 50 mm) 5% සහ (less than 2 mm) 30% ලෙස වෙනස්කර තිබුණි.

**18.4 අමාත්‍ය මණ්ඩල තීරණයන්ට අනුකූලව කටයුතු නොකිරීම / අනුමැතියකින් තොරව කටයුතු කිරීම.**

(අ) 13.1 ඡේදය, 13.2 ඡේදය හා 13.4 ඡේදයන්හි විස්තර දැක්වෙන පළමුවන, දෙවන හා සිව්වන ක්ෂණික මිලදී ගැනීම් පිළිවෙලින් 2015 අගෝස්තු 11, 2015 සැප්තැම්බර් 18 සහ 2016 ජනවාරි 21 යන දිනයන්හි ප්‍රදානය කර තිබුණි. එක් එක් ප්‍රදානයෙන් අනතුරුව ඉදිරියේදී පැවැත්වෙන ආසන්නම (earliest possible meeting) අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී (ඇමුණුම 118) එම ප්‍රදානයන් සඳහා අමාත්‍ය මණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබා ගැනීමට යටත්ව ටෙන්ඩරය ප්‍රදානය කිරීමට 2015 ජූලි 22 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාදී තිබුණද ඉහත ප්‍රසම්පාදනයන් සඳහා ආවරණ අනුමැතිය ලබාගෙන තිබුණේ පිළිවෙලින් 2015 දෙසැම්බර් 09, 2016 ජනවාරි 27 සහ 2016 ජූලි 12 යන දිනයන්හිදීය. තවද 13.5.4 ඡේදය අනුව 2016 මාර්තු 04 දින ප්‍රදානයකර තිබුණු 5 වන ක්ෂණික ටෙන්ඩරය සඳහා අමාත්‍ය මණ්ඩලයේ ආවරණ අනුමැතිය මෙම වාර්තාවේ දින දක්වාම ලබා ගෙන නොතිබුණි. මේ අනුව අමාත්‍ය මණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබා ගැනීමේ අසාමාන්‍ය ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

(ආ) 14.1.2 ඡේදය අනුව ගල් අඟුරු මෙ.ටො. එකක් එ.ජ.ඩො. 68.5 බැගින් උපරිමය ගල් අඟුරු මෙ.ටො. මිලියන 01 ක සීමාවකට යටත්ව 2014 මාර්තු 31 දිනට පෙර Noble Resources සමාගමින් (පෙර සැපයුම්කරු) මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය 2013 නොවැම්බර් 11 දින තීරණය කර තිබුණි. කෙසේවුවද ලංකා ගල් අඟුරු සමාගම ය Noble Resources සමාගම සමඟ ගිවිසුම්ගත නොවී ගල් අඟුරු මෙ.ටො 210,972 ක් 2014 පෙබරවාරි 17 සිට 2014 මාර්තු 23 දක්වා කාලයතුල මිලදීගෙන තිබුණි. පසුව 2014 අප්‍රේල් 08 දින මෙම ගල් අඟුරු ප්‍රමාණයෙන් මෙ.ටො. 200,000 $\pm$ 10% ක් සඳහා Noble Resources සමාගම සමඟ ගිවිසුමකට එළඹ තිබුණි (ඇමුණුම 161). මෙලෙස ගිවිසුම්ගත නොවී භාණ්ඩ ලබාගැනීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.2 වගන්තියට පටහැනිව කටයුතු කිරීමකි (ඇමුණුම 162).

උපරිමය ගල් අඟුරු මෙ.ටො. මිලියන 01 ක් 2014 මාර්තු 31 දිනට පෙර මිලදී ගත යුතු බව අමාත්‍ය මණ්ඩල තීරණයකර තිබුණද Noble Resources සමාගම දිගකාලීන ප්‍රසම්පාදන ගිවිසුම අනුව ඒ වන විටත් ගල් අඟුරු සැපයීම කරමින් පැවති අතර ඊට අමතරව තවත් මෙ.ටො. මිලියන 01 ක් මාස 5ක් ඇතුලත ගොඩබෑම ප්‍රායෝගිකව කළ

නොහැකි බව අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීමේදී සඳහන්කර නොතිබුණි. ගල් අඟුරු මෙ.ටො. මිලියන 01 ක් එම කාලයතුල ගොඩබෑ නොහැකි බව ලංකා විදුලිබල මණ්ඩලය විසින් ද තහවුරු කර තිබුණි.

(ඈ) 14.1.3 ඡේදය අනුව ගල් අඟුරු මෙ. ටො 200,000 ක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියකින්ද තොරව ලංකා ගල් අඟුරු සමාගම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් පදනම්ව 2014 ජූලි 24 දින (ඇමුණුම 163) Noble Resources සමාගම සමඟ ගිවිසුමකට එළඹ (මෙ.ටොන් 200,000 ±10%) ගල් අඟුරු මෙ. ටො 1 ක් එ.ජ.ඩො 74.42 ක ස්ථාවර මිලකට (FOB) ගල් අඟුරු මෙ. ටො 222,739 ක් එ.ජ.ඩො. මිලියන 16.04 කට මිලදී ගෙන තිබුණි. මෙය විනිවිදභාවයකින් සිදුනොකළ ගනුදෙනුවක් ලෙස නිරීක්ෂණය කරනු ලැබේ.

ඉහත අවශ්‍යතාවය පිළිබඳ ගැටලු සහගත තත්ත්වයක් පැනනගින බවත් දීර්ඝකාලීන ප්‍රසම්පාදනයක් සඳහා ලංසු කැඳවා ලංසුකරුවකු තෝරාගෙන සිටින අවස්ථාවක ඉහත පරිදි හදිසියේ ගල් අඟුරු මෙ. ටො 200,000 ක් Noble Resources සමාගමෙන් මිලදී ගැනීම ප්‍රශ්නකාරී ගනුදෙනුවක් බවත් නිරීක්ෂණය කරනු ලැබේ.

(ඈ) 12.1.8 ඡේදය අනුව පළමු දීර්ඝ කාලීන ප්‍රසම්පාදනය 2009 ජූනි 26 දින ප්‍රසම්පාදන කමිටුව ය විසින් අවලංගුකර තිබුණද ඒ පිළිබඳව අමාත්‍ය මණ්ඩලය දැනුවත්කර නොතිබූ අතර 12.2.1 හි සඳහන් දෙවන ප්‍රසම්පාදනය ආරම්භ කිරීම සඳහාද අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

## 18.5 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයට අනුකූල නොවීම

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ප්‍රකාරව (ඇමුණුම 167) ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කළයුතුව තිබියදී සහ ගල් අඟුරු සමාගමේ ආරම්භක අවස්ථාවේදී භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක NPA/DM/104-20-73 හා 2008 අප්‍රේල් 23 දිනැති ලිපිය මගින් දන්වා තිබියදීත් එසේ කටයුතු කර නොබුණි. තවද අමාත්‍ය මණ්ඩලය විසින්ද ඒ පිළිබඳව නැවැතත් අවධානය යොමුකරවා තිබියදී ලංකා ගල් අඟුරු සමාගම විසින් 2016/2017 කාලය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය වෙත ලබාදී තිබුණේ 2016 ජනවාරි 25 දිනදීය.

(ආ) ඇමුණුම 169 හි දැක්වෙන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 1.2.1. (අ), (ආ) හා (ඊ) හි උපදෙස් ප්‍රකාරව කටයුතුකර නොතිබීම හේතුවෙන් LCC, තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව විසින් ගල් අඟුරු ප්‍රසම්පාදනයන්ට අදාලව රාජ්‍ය ප්‍රසම්පාදනයේ අරමුණු නොසලකා හැර තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ/ කාර්ය සංග්‍රහයේ අංක 4.2.3 හි (ඇමුණුම 170) උපදෙස් අනුව රු. මිලියන 3,000 ට වැඩි කොන්ත්‍රාත්තු සඳහා ලංසු භාර ගැනීම අවසන් කිරීම සඳහා සති 12 ක කාලයක් ලබා දිය වුවත් එසේ ලබානොදුන් අවස්ථා විය.

12.5.2 ඡේදයෙහි විස්තර දැක්වෙන 5 වන ප්‍රසම්පාදනයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.15 ප්‍රකාරව (ඇමුණුම 171) සංශෝධනයන් සඳහා ලංසු කරුවන් වෙත ප්‍රමාණවත් කාලයක් ලබාදී නොතිබුණි. 5 වන ප්‍රසම්පාදනයේදී 3 වන සංශෝධනය 2014 ජූනි 24 සහ 26 දිනයන්හිදීද 4 වන සංශෝධනය 2014 ජූනි 26 දිනද ලංසු කරුවන්වෙත යවා තිබුණු බව සඳහන් වුවද (තහවුරු කිරීම් නැත) ලංසු වැසීමේ දිනය 2014 ජූලි 03 වූ බැවින් ලංසුකරුවන්වෙත ප්‍රමාණවත් කාලයක් ලබාදී නොමැතිබව නිරීක්ෂණය විය. (එක් ලංසු කරුවෙක් වන කොල්මා සමූහය විසින් ඉදිරිපත්කර තිබුණු අභියාචනය (ඇමුණුම 173) මගින් තමන්ට සෑහීමට පත්විය හැකි පරිදි ලංසුවක් ඉදිරිපත් කිරීමට කාලයක් ලබාදී නොතිබූ බව ඔවුන්ගේ අභියාචනයේ සඳහන් කර තිබුණු බව අභියාචනා මණ්ඩල වාර්තාවේ දක්වා තිබුණි. තවද අභියාචනා මණ්ඩලය විසින් ද ඒ බව තහවුරු කර තිබුණි.)

(ඇ) ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ අංක 2.4 (ඇමුණුම 174) අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව වාර්තාවල එහි සාමාජිකයන් සාමුහිකව මෙන්ම ඊට අතිරේක වශයෙන් තම තමන්ට පවරා ඇති පුද්ගලික වගකීම් භාරය තහවුරු කිරීම පිණිස එක් එක් සාමාජිකයා වෙන් වෙන්ව අත්සන් තැබිය යුතු වුවත් ඇතැම් තාක්ෂණික ඇගයීම් කමිටුව වාර්තාවල සියලුම සාමාජිකයන් අත්සන් තබා නොතිබුණි. (ඇමුණුම 175)

(ඉ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අංක 8.8 අනුව (ඇමුණුම 176) අනාගතයේදී වඩා ප්‍රතිචාර සහිත සහ තරඟකාරී ලංසු ඉදිරිපත් කරන ලෙස ලංසුකරු මුලුමනින්ම දැනුවත් කිරීමේ අරමුණු ඇතිව ලංසු ප්‍රදානයෙන් පසු, අසාර්ථක ලංසුකරුවන්ගේ අඩුලුහුඩුතා සංක්ෂිප්තව දැන්විය යුතුවුවද එසේ කටයුතුකර නොතිබුණි.

(ඊ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අංක 8.10.2 ප්‍රකාරව (ඇමුණුම 178) කොන්ත්‍රාත් අගය රු.මිලියන 250 කට වැඩි අවස්ථාවලදී කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම, වැඩි වශයෙන් අලෙවි වන එක් ජාතික පුවත් පතක ද රජයේ ගැසට් පත්‍රයේ ද පළ කිරීම අනිවාර්ය බව දැක්වෙන නමුත් ගල් අඟුරු ප්‍රසම්පාදනයන්ට අදාලව ලංකා ගල් අඟුරු සමාගම ය එම උපදෙස් පිළිපැද නොතිබුණි.

(උ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 7.12.4 අනුව (ඇමුණුම 179) සම්මුති සාකච්ඡාවල වාර්තා සටහන් තබා ගතයුතු අතර එකඟ වූ හා සාකච්ඡාකළ නියමයන් සහ කොන්දේසි පිළිබඳ අවබෝධතා ගිවිසුමක්ද ලියා අත්සන් කරගතයුතු වුවත් ගල් අඟුරු ප්‍රසම්පාදනයන්ට අදාලව එලෙස කටයුතුකර නොතිබුණි.

(ඌ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ / කාර්ය සංග්‍රහයේ අංක 8.9.3 ප්‍රකාරව (ඇමුණුම 180) කොන්ත්‍රාත් අගය රු. මිලියන 500 කට වැඩිවන අවස්ථාවලදී කොන්ත්‍රාත් ගිවිසුම රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයා අත්සන් කළ යුතු වුවත් විෂයගත කිසිදු කොන්ත්‍රාත් ගිවිසුමක් රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අත්සන් තබා නොතිබුණු අතර සෑම ගල් අඟුරු ප්‍රසම්පාදන ගිවිසුමක්ම ලංකා ගල් අඟුරු සමාගම සභාපතිවරයා අත්සන් තබා තිබුණි.

(ඔ) හයවන ප්‍රසම්පාදන කටයුතු සඳහා අමාත්‍ය මණ්ඩල එකඟතාවය මත රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් 2014 සැප්තැම්බර් 19 දින ප්‍රසම්පාදන කමිටුව පත්කර තිබුණු අතර අනතුරුව 2015 ජනවාරි 20 දින ප්‍රසම්පාදන කමිටුව නැවත පත්කර තිබුණි. කෙසේවුවද මෙම ප්‍රසම්පාදනයේ 9 වන ප්‍රසම්පාදන කමිටුව රැස්වීමේ සිට 15 වන රැස්වීම දක්වා වූ රැස්වීම් හතකට රේඛීය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා විකල්ප සාමාජිකයෙක් ලෙස සහභාගීවී තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.8 ප්‍රකාරව ඔහු විධිමත් පත්වීම් ලාභියකු නොවූයෙන් එම සහභාගීත්වයේ නීත්‍යානුකූල භාවය ප්‍රශ්නකාරීබව නිරීක්ෂණයවිය (ඇමුණුම 197).

### 18.6 ගනුදෙනුවල ආර්ථිකමයබව, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය

(අ) 13.1.2 ජේදයේ සඳහන් පරිදි ක්ෂණික මිලදී ගැනීම් යටතේ ගල් අඟුරු කැටයක ප්‍රමාණය සහ බර පිළිබඳව ලංසු ලියවිල්ලේ දක්වා තිබියදී Quality price adjustments යටතේ (53 පිටුව) (ඇමුණුම 118) "Size consist: not applicable" ලෙස සඳහන්කර ඇත. පළමු ප්‍රසම්පාදනයේ සිට හය වන ප්‍රසම්පාදනය දක්වා මෙම නිර්නායකය ඇතුළත්ව තිබුණු අතර, ක්ෂණික ප්‍රසම්පාදනවලදී මෙම නිර්නායක ඉවත්කිරීම සාධාරණ හේතු දැක්වීමකින්, විධිමත් අධ්‍යයනයකින් සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව සිදුකර තිබුණි.

ඉහත සඳහන් පරිදි විධිමත් අධ්‍යයනයකින් හෝ අනුමැතියකින් තොරව Quality price adjustments සඳහා Grain Size නිර්නායකය ඉවත්කිරීම හේතුවෙන් Liberty Commodities වෙතින් 1,2 සහ 4 වන ක්ෂණික ප්‍රසම්පාදනයන්හිදී පිළිවෙලින් එ.ජ.ඩො. 758,358 ක (රු.98,586,540), එ.ජ.ඩො 562,763 ක් (රු.73,159,190) සහ එ.ජ.ඩො 409,537 ක (රු.53,239,810) ක අධිභාර අයකරගත නොහැකිව තිබුණි (ඇමුණුම 181).

තවද, ඉහත දැක්වෙන 4 වන ක්ෂණික ප්‍රසම්පාදනයේදී අයකර ගත හැකිව තිබුණු මුදල එම මුළු ගල් අඟුරු තොගයෙන් 28% ක් සඳහා පමණි. ඉතිරි 72% ( නැව් වාර 106,107,108,113 සහ 114 ) එනම් ගල් අඟුරු මෙ. ටො 275,144 ක් (ඇමුණුම 181) සඳහා ස්වාධීන තත්වපරීක්ෂණ (ඇමුණුම 182) වාර්තාවේ කැටවල තිබියයුතු ප්‍රමාණ නිර්නායකය පිළිබඳ තොරතුරු ඇතුලත් වී නොතිබුණු හෙයින් එම ගල් අඟුරු මෙ. ටො 275,144 ට අදාලව අයකරගතව හැකිව තිබුණු අධිභාර මුදල ගණනය කළ නොහැකි විය.

ස්වාධීන තත්ත්ව පරීක්ෂණ ආයතනය විසින් 2016 ජනවාරි 30 දින දක්වා තත්ත්ව පරීක්ෂණ වාර්තාවල Grain Size එක ඇතුලත් කර තිබුණි. කෙසේවුවද 2016 පෙබරවාරි 16 දිනෙන් පසුව මෙම තොරතුරු එම වාර්තාවට ඇතුලත්කර නොතිබුණි. Grain Size පිළිබඳ තොරතුරු වාර්තාවෙන් ඉවත්කරන ලෙසට සහ නැවත එය ඇතුලත්කරන ලෙසට ලංකා ගල් අඟුරු සමාගම විසින් තත්ත්ව පරීක්ෂණ ආයතනය වෙත දැනුම්දුන් බවට තහවුරුකර ගැනීම සඳහා සහ මෙම තොරතුරු ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් ලංකා

ගල් අඟුරු සමාගම තත්ත්ව පරීක්ෂණ ආයතනයෙන් විමසීමක් කළ බවට හෝ කිසිදු ක්‍රියාමාර්ගයක් ගත්බවටද සාක්ෂි ඉදිරිපත් නොවීය.

තවද (13.1.2 ඡේදයේ සඳහන් පරිදි) Grain Size එක Quality price adjustments සළකා නොබැලීම හේතුවෙන් Adani Global සමාගමෙන් 5 වන ක්ෂණික ප්‍රසම්පාදනයේදී එ.ජ.ඩො 1,194,612 ක (රු.155,299,560) (ඇමුණුම 183) අධිභාරයක් අයකරගත නොහැකිව තිබුණි.

(ආ) 13.1.4 ඡේදය අනුව Liberty Commodities සමාගම සමඟ අවසන් ගිවිසුමට එළඹීමේදී කෙටුම්පත් ගිවිසුමේ තිබුණු සල්ෆර් (sulfer) සහ අළු (Ash) යන නිර්ණායක මිල ගැලපීම් සූත්‍ර වෙනස්කර තිබීම පිළිබඳව ලංකා ගල් අඟුරු සමාගම ය නිසි අවධානය යොමු නොකිරීම හේතුවෙන් Liberty Commodities වෙත 1 වන ක්ෂණික ප්‍රසම්පාදනය වෙනුවෙන් ගල් අඟුරු මෙ.ටො.226,290 ක් සඳහා එ.ජ.ඩො 173,134 ක්ද (රු.22,507,420), 2 වන ක්ෂණික ප්‍රසම්පාදනය වෙනුවෙන් ගල් අඟුරු මෙ.ටො. 370,594 සඳහා ලංසු කරුට එ.ජ.ඩො.391,192 ක්ද (රු.50,854,960), 4 වන ක්ෂණික ප්‍රසම්පාදනය වෙනුවෙන් ගල් අඟුරු මෙ. ටො 383,804 සඳහා එ.ජ.ඩො. 1,011,304 ක්ද (රු. 131,469,520) (ඇමුණුම 184) වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) 13.01.05 ඡේදය අනුව නැවත ඇණවුම් කිරීමේදී ප්‍රසම්පාදන කමිටුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 3.6 පරිදි කටයුතු කර නොතිබුණි (ඇමුණුම 185).

(ඈ) 14.2 (ආ) ඡේදයේ විස්තර කර ඇති පරිදි ගල් අඟුරු මෙ.ටො. එකක් එ.ජ.ඩො. 148.29 CIF (එ.ජ.ඩො.121.61- FOB) ක මිලකට Nobel Resourses මගින් මිලදී ගැනීමේ හැකියාව තිබියදී ලංකා නැව් සංස්ථාව මගින් (Taurine Iron Steel සමාගමින් මිලදී ගෙන ඇති ) වැඩි මිළගණන් වලට ලබාගැනීම හේතුවෙන්, එ.ජ.ඩො. 215,236 ක (රු.27,980,680) (ඇමුණුම 186) ඇස්තමේන්තුගත අලාභයක් සිදුවී තිබුණි. තවද මෙම ඇණවුම ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව සිදුකර තිබුණි.

(ඉ) 14.2 (ඇ) ඡේදයේ විස්තර කර ඇති පරිදි ගල් අඟුරු මෙ.ටො. එකක් එ.ජ.ඩො. 132.47 CIF (එ.ජ.ඩො. 102.43 ( FOB) ක මිලකට Nobel Resourses මගින් මිලදී ගැනීමේ හැකියාව තිබියදී මෙ.ටො. 59,358 ක් වැඩි මිළගණන් වලට ලංකා නැව් සංස්ථාව මගින් (Taurine Iron Steel සමාගමින් මිලදී ගෙන ඇති )ලබාගැනීම හේතුවෙන්, එ.ජ.ඩො. 308,930 (රු.40,160,900) ක (ඇමුණුම 186) ඇස්තමේන්තුගත අලාභයක් සිදුවී තිබුණි. තවද මෙම ඇණවුම ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව සිදුකර තිබුණි.

(ඊ) 14.3 ඡේදයේ විස්තර කර ඇති පරිදි ලංකා නැව් සංස්ථාව ය Taurine Iron Steel සමාගමින් මිලදී ගෙන ඇති 18, 19 හා 20 යන නැව් වාර මගින් ගෙන්වන ලද ගල් අඟුරු නියමිත ගුණත්වයෙන් නොතිබූ බැවින් එම ගල් අඟුරු මඟින් ජනනය කරන ලද විදුලි ඒකක ප්‍රමාණය අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩු අගයක් ගෙන තිබීම හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය ගණනය අනුව අහිමිවී තිබුණු ආදායම රු. 852,768,000 කි (ඇමුණුම 187).

(උ) 14.2 (අ) ඡේදය අනුව බලාගාරයේ ගල් අඟුරු ගබඩා කිරීමට ප්‍රථම එහි බිම ඇතිරිය යුතු එ.ජ.ඩො 2,764,939 (රු.313,348,188) ක් වටිනා තාප නොවන ගල් අඟුරු (Deaf Coal) මෙ.ටො. 49,542 ක් ඇණවුම් කර ඒ සඳහා ගෙවීම් කර තිබුණ ද එයින් මෙ.ටො. 41,907 ක් පමණක් සපයා තිබුණි. ඒ අනුව, එ.ජ.ඩො. 426,084 (රු.55,390,920) ක් වටිනා තාප නොවන ගල් අඟුරු මෙ.ටො 7,635 ක (ඇමුණුම 141) ප්‍රමාණයක් ලංකා නැව් සංස්ථාව විසින් ලංකා විදුලිබල මණ්ඩලය වෙත 2016 ඔක්තෝබර් 31 දින දක්වාම සපයා නොතිබුණි. තවද මෙම ඇණවුම ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් සහ අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව සිදුකර තිබුණි.

(ඌ) 14.3 ඡේදයේ විස්තර කර ඇති පරිදි ලංකා නැව් සංස්ථාව විසින් ගල් අඟුරු මෙ.ටො. 85,891 ක් සැපයිය යුතුව තිබුණද, එයින් ගල් අඟුරු මෙ.ටො. 55,994 ක් පමණක් සපයා තිබුණි. තවදුරටත් එ.ජ.ඩො. 3,558,763 (රු.462,639,190) වටිනා ගල් අඟුරු මෙ.ටො 29,896 ප්‍රමාණයක් 2016 ඔක්තෝබර් 31 දින දක්වාම ලංකා නැව් සංස්ථාව සපයා නොතිබුණි (ඇමුණුම 188).

## 18.7 තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුවල ක්‍රියාකාරිත්වය

2008 වර්ෂයේ සිට 2016 ඔක්තෝබර් 31 දක්වා කාලයතුල කටයුතු ආරම්භ කර තිබුණු දීර්සකාලීන සැපයුම් ප්‍රසම්පාදන 06 න් 03 ක් (පළමු, තෙවන සහ පස්වන ) අවලංගුකර තිබුණු අතර හතරවන ප්‍රසම්පාදනය ලංසු කැඳවීමකින්ද තොරව නවතා තිබුණි. ලංසු කරුවන් අපහසුතාවයට පත්වන වන ආකාරයට වරින්වර ලංසු ලියවිලි සංශෝධනය කිරීමත් ඒ අනුව ලංසු ලියවිලි ලබාගැනීමේ කාලය සහ ලංසු වැසීමේ කාලය දීර්සකර තිබීමත් දක්නට ලැබුණි. තෙවන දිගුකාලීන ප්‍රසම්පාදනයේදී ලංසු කැඳවීමේ සිට එය අවලංගු කරන තෙක් ගතකර තිබුණු කාලය අවුරුදු 1 මාස 4 කි.

## 18.8 බලාගාරය අඩු ධාරිතාවයෙන් ක්‍රියා කිරීම

බලාගාරය සඳහා අවශ්‍ය ප්‍රමාණයට ගල් අඟුරු සපයා නොතිබීම හේතුවෙන් අමතර වියදමක් දැරීමට සිදුව තිබුණු අතර එම ඇස්තමේන්තුගත අමතර වියදම රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ ගණනය කිරීම අනුව රු. 12,500,000,000 ක් (ඇමුණුම 190) සහ ලංකා විදුලිබල මණ්ඩලය සභාපතිගේ ගණනය කිරීම අනුව (ඇමුණුම 191) රු.983,230,000 ක් විය.

## 18.9 පාරසරික බලපෑම්

විදුලි බලාගාරය සඳහා සැළසුම් සකස් කිරීමේදී බලාගාරයෙන් දෛනිකව බැහැරවන පාවෙන අළු, පරිසරයට අනාරක්ෂිතව මුදාහැරෙන ලෙස තැන්පත් කිරීම හේතුවෙන් මෙම අළු සුළඟට ගසාගෙන යාමෙන් අවට ජන ජීවිතවලට සහ වගාවන්ට සැලකියයුතු හානියක් සිදුව තිබුණද ඒ සඳහා ප්‍රමාණවත්, කඩිනම් හා ස්ථිරසාර විසඳුම් ලබාදී නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 18.10 ගල් අඟුරු ප්‍රවාහනය

නැව් වාර අංක 01 සිට 15 දක්වා ගණනය කරන ලද ප්‍රමාද ගාස්තුව එ.ජ.ඩො. 692,412 ක් වූ අතර (ඇමුණුම 192) මින් එ.ජ.ඩො. 256,301 ක් එනම් රු. 27,435,577 (ඇමුණුම 192) ක් ගෙවා තිබුණි. 2014-2015 කාල වකවානුව සඳහා ගෙවා තිබුණු ප්‍රමාද ගාස්තුව එ.ජ.ඩො. 4,503,826.21 (රු.607,115,773) කි (ඇමුණුම 193). තවද නැව් අංක 1-15 දක්වා පමා ගාස්තු

ගෙවීම සඳහා කමිටුවක් පත්කර එම කමිටු නිර්දේශය මත ගෙවීම් කළද මෙම කාලය සඳහා එසේ නිර්දේශ නොමැතිව ගෙවා තිබුණි. 2016 ඔක්තෝබර් 10 දින වන විට 2015 නොවැම්බර්- 2016 අප්‍රේල් කාලය වෙනුවෙන් ගොඩබෑමේ පමා ගාස්තු ලෙස රු. 115,070,656 ක් (ඇමුණුම 194) සඳහා එකඟග වී තිබුණි.කෙසේවුවද අවසාන වශයෙන් මෙම ප්‍රමාද ගාස්තුව රජයට වැය බරක් වී තිබුණි.

## 18.11 ගල් අඟුරු ගබඩා කිරීම

ගල් අඟුරු බලාගාරයේ අංගනය තුල පවත්නා ධාරිතාවය අනුව ගල් අඟුරු මෙ. ටො. 900,000 ක් (ඇමුණුම 191) පමණක් ගබඩා කළ හැකි වන අතර මාස 6 ක කාලයක් ගල් අඟුරු ආනයනය කළ නොහැකි බැවින් එකි කාලයට අවශ්‍ය ගල් අඟුරු ගබඩා කිරීමට ගබඩා අංගනය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

## 18.12 නිෂ්කාර්ය වත්කම් සම්බන්ධයෙන් අනාවරණය වු නිරීක්ෂන

ඉහත 17 ජේදයේ දක්වා ඇති යාත්‍රා භාවිතා නොකර ගාල් කර තැබීම වෙනුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 177 ක (ඇමුණුම 146) පිරිවැයක් ලංකා විදුලිබල මණ්ඩලය දරා තිබුණි.

## 18.13 ලංකා ගල් අඟුරු සමාගම සම්බන්ධ නිරීක්ෂණ

(අ) ලංකා ගල් අඟුරු සමාගම, රේඛීය අමාත්‍යාංශය, ලංකා නැව් සංස්ථාව සහ ලංකා විදුලිබල මණ්ඩලය සමඟ නිසි හා ප්‍රමාණවත් සම්බන්ධීකරණයක් පවත්වාගෙන ගොස් නොතිබුණුබව නිරීක්ෂණයවිය.

(ආ) ලංකා ගල් අඟුරු සමාගම ය ගිවිසුම් වලට එළඹීමේදී එවායේ නෛතික වලංගුභාවය සහ නෛතික පසුබිම පිළිබඳව නීතිපති වෙතින් අවශ්‍ය නිශ්කාෂන ලබාගෙන නොතිබුණු අවස්තාවන් පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) 2009 වර්ෂයේ සිටම වරින්වර අවස්ථා විශාල ගණනකදී ලංසු ලිපි සංශෝධන කර තිබූ අතර ඒ මගින් ලංසු කරුවන්ට සිදුවන අහිතකර බලපෑම් තේරුම්ගෙන ඒවා නිවැරදි

කිරීමට **ලංකා ගල් අඟුරු සමාගම** සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් කටයුතු නොකිරීමේ හේතුවෙන් අභියාවනා මත සමස්ථ ටෙන්ඩර් ක්‍රියාවලියම නතර කිරීමට සිදුවූ අවස්ථා පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) 2009-2016 මැයි දක්වා කාලය තුළ සෑම නැව් වාරයකදීම ගොඩබෑම් වරායෙන් ගල් අඟුරු සාම්පල් ලබාගෙන ඒවා රසායනාගාර වෙත යවා තත්ත්ව පරීක්ෂාවකට භාජනය කර තිබුණද එම තත්ව සහතික (ඇමුණුම් 195 සහ 196) ලැබීමට පෙර එතෙක් රඳවාගෙන තිබුණු 15% ක මුදලද නිදහස්කර තිබුණු බව නිරීක්ෂණය විය. නිදසුන් කීපයක් පහත දැක්වේ.

| **නැව් වාර අංකය** | **සාම්පලය ලබා ගත් දිනය** | **තත්ව සහතිකය නිකුත්වූ දිනය** | **ගෙවීම් අවසන් කළ දිනය** |
|---|---|---|---|
| 100 | 2016.02.03 | 2016.03.09 | 2016.02.08 |
| 101 | 2016.02.15 | 2016.04.08 | 2016.02.24 |
| 102 | 2016.02.19 | 2016.04.18 | 2016.02.18 |

## 19 නිර්දේශ

01. ලංසු ලියවිලිවල ඇතුලත් සංරචකයන් තාක්ෂණික විශේෂඥයින්ගේ උපදෙස් මත නිවැරදිව පිළියෙල කළ යුතුය. එසේම ලංසු ඇගයීමේ දී ඊට අදාලවන තාක්ෂණික නිර්නායක පිළිබඳව තිබිය යුතු ප්‍රමිතීන්, තාක්ෂණික දැනුමක් ඇති කමිටුවක් මගින් නිශ්චිත වශයෙන්ම තීරණය කළ යුතුය.

02. ප්‍රසම්පාදනයන්ට අදාල ලිපිගොනු ක්‍රමවත්ව පවත්වා ගැනීම සඳහා නිලධාරීන්ට නිශ්චිත උපදෙස් ලබාදී ඒ සම්බන්ධ වගකීම් පැවරිය යුතුය.

03. ලංසු ලියවිලි ලබාගත් ලංසු කරුවන් සම්බන්ධයෙන් දත්ත ගොනුවක් පවත්වාගෙන යාම සහ ලංසු ලියවිලි සහ අනෙකුත් සංශෝධනයන් සියලු අදාල පාර්ශවයන්ට යවනලද බවට/යැවූ බවට සනාථන කිරීම් ලබාගැනීම කළ යුතුය.

04. ගල් අඟුරු ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් බලාගාරයේ අවශ්‍යතාවය, ගබඩා පහසුකම්, කාලගුණ විපර්යාසයන් සහ අනෙකුත් අවශ්‍යතාවයන් පිළිබඳව අවධානය යොමු කිරීමෙන් අනතුරුව ලංකා ගල් අඟුරු සමාගම ය රේඛීය අමාත්‍යාංශය, ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා නැව් සංස්ථාව යන ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් විධිමත් ප්‍රායෝගික වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර යාවත්කාලීන කර ක්‍රියාත්මක කළ යුතුය.

05. අමාත්‍ය මණ්ඩලයට නිවැරදි තීරණවලට එළඹීම සඳහා අවශ්‍ය සියලුම අදාල තොරතුරු අමාත්‍ය මණ්ඩල සංදේශ මගින් අමාත්‍ය මණ්ඩලය වෙත සංනිවේදනය කිරීමට වගකිවයුතු නිලධාරීන් ක්‍රියාකළ යුතුය.

06. බලාගාරයේ අපද්‍රව්‍ය ලෙස පිටවන මුළු අළු ප්‍රමාණයම වෙනත් අතුරු නිෂ්පාදනයන්හි අමුද්‍රව්‍යයක් ලෙස යොදාගැනීම පිළිබඳව අවධානය යොමුකළ යුතුය. එසේම ගල් අඟුරු බලාගාරයේ ක්‍රියාකාරීත්වය නිසා සිදුවන පරිසර හානිය අවම කිරීම සඳහා වෙනත් රටවල් විසින් යොදාගනු ලබන ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනය කර ඒවා අනුගමනය කළ යුතුය.

07. ප්‍රසම්පාදනයේදී ආරක්ෂා විය යුතු මුදලට අගය යන සංකල්පය ආරක්ෂා වන පරිදි ආර්ථිකමයභාවය, කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය යන ගුණාංග රැකෙන පරිදි ප්‍රසම්පාදන කටයුතු මෙහෙයවිය යුතුය.

08. පූර්ව ලංසු රැස්වීම් වඩාත් ඵලදායී වන ආකාරයට පැවැත්වීමට අදාල පාර්ශවයන් වග බලා ගතයුතු අතර එමඟින් ඉදිරියේදී ඇතිවිය හැකි ගැටළු අවම කරගැනීමට කටයුතු කළ යුතුය.

09. අමාත්‍යාංශය, ලංකා ගල් අඟුරු සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලයය අතර මනා සම්බන්ධීකරණයක් සහ වගකීමක් ගොඩ නැගෙන පරිදි රැස්වීම් පැවැත්වීම සහ එකී රැස්වීම්වල වාර්තා අදාල පාර්ශවයන් අතර විධිමත්ව හුවමාරු කර ගතයුතුය.

10. නැව්වලින් බත්තල් වලට ගල් අඟුරු ගොඩබෑමේ දී ලංකා විදුලිබල මණ්ඩලය හි අධීක්ෂණයක් පවත්වාගත යුතුය. තවද අදාල තත්ත්ව පරීක්ෂණ සඳහා සියලුම වියදම් ලංකා විදුලිබල මණ්ඩලය දරන බැවින් පරීක්ෂණ ක්‍රියාවලියට ලංකා විදුලිබල මණ්ඩලය හි සහභාගීත්වයද සහිත ක්‍රමවේදයක් හඳුන්වාදිය යුතුය.

11. ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී අනුකූල විය යුතු වලංගු නීති රීති සහ පොදුවේ සම්මත නියමයන්ට සෑම විටම අනුගත විය යුතුය.

12. ගල් අඟුරු සම්බන්ධයෙන් වෙළඳපලෙහිවන මිල උච්චාවචනයන්හි වාසිය රජයට ලැබෙන පරිදි ඒ පිළිබඳව අවධානය යොමුකරමින් ලංසු කැඳවීම සහ ප්‍රසම්පාදන ක්‍රමය තීරණය කිරීම කළයුතුය.

13. ලංකා ගල් අඟුරු සමාගම ගිවිසුම් වලට එළඹීමේදී එවායේ නෛතික පසුබිම පිළිබඳ තහවුරු කර ගැනීම සඳහා නීතිපති නිෂ්කාශනය ලබා ගත යුතුය.

14. ගල් අඟුරු ප්‍රවාහනය සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ඇති කිරීම මගින් තරඟකාරී වාසි ලබා ගැනීමට ලංකා ගල් අඟුරු සමාගම කටයුතු කළ යුතුය.

15. එකඟවූ පිරිවිතරයන්ට අනුකූලව අදාල තත්ත්ව පරීක්ෂණ වාර්ථාවන් හි ප්‍රතිඵල අනුව ඉදිරි කටයුතු සිදුවන බව තහවුරු කර ගැනීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් සකස් කළ යුතුය.

16. තාක්ෂණික වශයෙන් සුදුසුකම් ඇති සැපයුම් කරුවන් වාර්ෂිකව ලියාපදිංචි කර එම සැපයුම් කරුවන් මගින් තරඟකාරී මිල ගණන් කැඳවා අවශ්‍ය අවස්ථාවලදී එම ලංසුමත ක්ෂණික මිලදී ගැනීම් සිදුකිරීම සම්බන්ධයෙන් සලකා බැලිය යුතුය.

17. ගල් අඟරු බලාගාර සඳහා අවශ්‍ය උසස් තත්වයේ ගල් අඟරු මිලදී ගැනීම සඳහා අතරමැදි සැපයුම් කරුවන් වෙනුවට ගල් අඟුරු ආකර හිමියන් ප්‍රසම්පාදන කාර්යයට සෘජුව සම්බන්ධකර ගැනීමේ හැකියාව සලකා බැලිය යුතුය.

18. දැනට වර්ෂයේ මාස 6 ක් පමණක් සිදු කළ හැකි ගල් අඟුරු ගොඩ බෑමේ කටයුතු වර්ෂ පුරා සිදු කළ හැකි වන පරිදි අවශ්‍ය යටිතල පහසුකම් වර්ධනය කළ යුතුය.

19. බලාගාරයේ උපරිම බලශක්ති උත්පාදනය තහවුරු කර ගැනීම සඳහා ගල් අඟුරු ඌනතාවයත් ඇති නොවන පරිදි ආරක්ෂිත තොගයක් පවත්වාගෙන යාම සඳහා ගබඩා පහසුකම් වැඩිදියුණු කළ යුතුය.

20. දැනට භාවිතයට ගත නොහැකිව කොළඹ සහ ත්‍රිකුණාමලය වරායන්හි නිශ්කාර්යව රඳවා තිබෙන බත්තල් භාවිතයට ගැනීම හෝ අපහරණය කිරීම සඳහා කටයුතු කළ යුතුය.

21. ලංසු ලේඛණවල ඇතුලත් තොරතුරු ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සංශෝධන ගණනාවක් ඉදිරිපත්කර තිබීම, ලංසුකරුවන් වෙත සංශෝධන ප්‍රමාණවත් කාලයත් ඇතිව ලබා නොදීම, තාක්ෂණික ඇගයීමේදී යොදා ගන්නා නිර්නායකයන්වල අඩුපාඩු, ලංසු ඇගයීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව විසින් ගන්නාලද තීරණවල අඩුපාඩු, ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා අසාමාන්‍ය කාලයක් ගතකිරීම, ලංසු ලේඛණ වල විනිවිදභාවය වැඩි දියුණුකර ගැනීම වැනි අඩුපාඩු මගහැර ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි පැවතිය යුතු තරගකාරීත්වය ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය.

22. නොරොච්චෝලේ ලක්විජය බලාගාරය ජාතික ආර්ථිකයට කර ඇති දායකත්වය හඳුනාගැනීම සඳහා කිසියම් කාලපරිච්ඡේදයක්තුල මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය (Profit Centre) සහ යම් නිශ්චිත දිනකට මූල්‍ය තතත්වය එළිදරව්වන පරිදි ගිණුම් වාර්තා පවත්වාගෙන යායුතුය.

23. ලෝකයේ බොහෝ සංවර්ධිත රටවල් ආර්ථිකය ස්ථාවර මට්ටමකට ගෙනඒම සඳහා වඩාත් ලාභදායීවන බල ශක්ති උත්පාදන මාර්ගයක්වන ගල් අඟුරු යොදාගෙන ඇති බැවින් ආර්ථිකය ස්ථාවර මට්ටමකට පැමිණෙනතෙක් ගල් අඟුරු භාවිතයෙන් බලශක්ති උත්පාදනය ප්‍රවර්ධනය කළයුතුය.

## 20. නිගමන

(අ) ප්‍රසම්පාදන ක්‍රියාවලියේ මූලික අරමුණුවල ඇතුලත්

උසස් ගුණාත්මකභාවයක් සහිතව අවම පිරිවැයක් දැරීමේ ප්‍රතිඵලයක් ලෙස උපරිම ආර්ථිකවාසි, සලසා ගැනීම, නිසි කලට වේලාවට ගුණාත්මකභාවයෙන් යුත් ප්‍රසම්පාදන කටයුතු කිරීම;

නියමිත ප්‍රමිතීන්ට, පිරිවිතරවලට, නීතිරීතිවලට, රෙගුලාසිවලට සහ ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූලව කටයුතු කිරීම;

සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට ප්‍රසම්පාදනයට සහභාගීවීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථා ලබාදීම;

කඩිනමින් භාණ්ඩ හා සේවා සැපයීම;

ඇගැයීමේ සහ තේරීමේ කාර්යය පටිපාටියේ විනිවිධභාවය සහ නිත්‍යභාවය සහතිකවීම;

යන අවශ්‍යතාවයන් අනුව සමාලෝචිත ගල් අඟුරු ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී කටයුතුකර නොමැතිබව නිගමනය කරනු ලැබේ.

(ආ) මෙම වාර්තාව මගින් අනාවරණයකර ඇති රු.මිලියන 4,145.43 ක ( ඇමුණුම 198) ඇස්තමේන්තුගත අලාභය/අමතර වියදම/ආදායම අහිමිවීම සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගත යුතු අතර ඉදිරියේදී එවැනි අලාභ/අමතර පිරිවැය/ආදායම අහිමිවීම ඇති නොවන පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කළ යුතු බව නිගමනය කරනු ලැබේ.

(ඇ) මෙම වාර්තාවෙන් අනාවරණය වූ කරුණු අනුව මෙම ප්‍රසම්පාදන කටයුතුවලදී එවකට පැවති විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය, සීමා සහිත ලංකා ගල් අඟුරු සමාගම, ලංකා විදුලි බල මණ්ඩලය හා ලංකා නැව් සංස්ථාව යන ආයතනද මෙම මිලදී ගැනීම සඳහා පත්කරන ලද තාක්ෂණ ඇගයීම් කමිටුව සහ අමාත්‍ය මණ්ඩලය මගින් පත්කෙරෙන ස්ථාවර ප්‍රසම්පාදන කමිටු විසින් සිය කටයුතු ඉටු කිරීමේ දී නිසි වෘත්තියමය පරීක්ෂාවකින් (professional due care) කටයුතු කර ඇති බවට තහවුරු නොවූ බව නිගමනය කරනු ලැබේ.

(ඇ) ගල් අඟුරු මිලදී ගැනීමට අදාල සීමා සහිත ලංකා ගල් අඟුරු සමාගමේ ක්‍රියාකාරීත්වය රජයට අවම පිරිවැයක් සහ අවම අවදානමක් ඇතිවන පරිදි කටයුතු කිරීම සඳහා අත්‍යවශ්‍ය ආයතනයක් බව තහවුරු නොවූයෙන් මෙම සමාගම තවදුරටත් පවත්වාගෙනයා යුතුද යන්න පිළිබඳව පුලුල් අධ්‍යනයක් අදාල පාර්ෂවයන් විසින් සිදුකළ යුතු බව නිගමනය කරනු ලැබේ.

(ඉ) ශ්‍රී ලංකාව තුල ගල් අඟුරු භාවිතයෙන් විදුලිය උත්පාදනය කිරීමේ දී විදුලි ඒකකයක පිරිවැය සාපේක්ෂව ඉතා අඩු අගයක් ගන්නා බැවින් පරිසරයට සිදුවන හානියද අවම වන ලෙස සම්මත ක්‍රමවේද යොදා ගනිමින් ගල් අඟුරු භාවිතයෙන් විදුලිය උත්පාදනයෙහි ආර්ථික වාසිය තවදුරටත් වර්ධනය කරගැනීම පිළිබඳව සලකා බැලිය යුතු යැයි නිගමනය කරනු ලැබේ.

(ඊ) ප්‍රසම්පාදනයේ දී තීරණ ගැනීම සඳහා අදාල සමහර වැදගත් තොරතුරු අමාත්‍ය මණ්ඩල සංදේශ මගින් අමාත්‍ය මණ්ඩලයවෙත ලබා දී නොතිබුණු අවස්ථා පැවති බව නිගමනය කරනු ලැබේ.

(ඌ) මෙම වාර්තාව පිළියෙල කිරීමේදී විගණකාධිපතිවෙත හිමි බලතල හා විෂය සීමාවතුල කටයුතුකර ඇති හෙයින් ඉන් ඔබ්බට විගණකාධිපතිට නිගමනයකළ නොහැකි මට්ටමේ නීතිවිරෝධී හෝ සාපරාධීකටයුතු සිදුවී ඇත්දැයි යන්න මාගේ පරීක්ෂාවට ලක් නොකෙරුණි. එබැවින් එවැනි පරීක්ෂාවක් අවශ්‍යයයි හැඟීයන්නේනම් ඒ සඳහා විශේෂිත වූ ආයතනයන්හි සහාය ලබා ගැනීම සුදුසු බව නිගමනය කරනු ලැබේ.